**2022 මාර්තු මස 03 වන දින පෙරවරු 9.30 ට මොරටුව මහා නගර සභා රැස්වීම් ශාලාවේදී පවත්වන ලද මොරටුව මහා නගර සභාවේ මාසික සභා රැස්වීමේ වාර්තාව**

**සහභාගීත්වය:-**

| | | | |
|---|---|---|---|
| 1. | නගරාධිපති | - | ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා |
| 2. | නියෝජ්‍ය නගරාධිපති | - | ඩී.සමන්ත සිල්වා මහතා |
| 3. | මහා නගර සභා මන්ත්‍රී | - | ජී.එම්.සුරංග නිශාන්ත අපෝන්සු මහතා |
| 4. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා |
| 5. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.තිලකසිරි ප්‍රනාන්දු මහතා |
| 6. | මහා නගර සභා මන්ත්‍රී | - | එච්.ප්‍රදීප් ශ්‍රියන්ත ප්‍රනාන්දු මහතා |
| 7. | මහා නගර සභා මන්ත්‍රී | - | එල්.ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා |
| 8. | මහා නගර සභා මන්ත්‍රී | - | ඒ.එච්.සුරේෂ් ඉන්දික මහතා |
| 9. | මහා නගර සභා මන්ත්‍රී | - | යූ.සුදත් ක්‍රිෂාන්ත පෙරේරා මහතා |
| 10. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී.ඩබ්.ඩී.රන්දූ නිරෝෂණ මහතා |
| 11. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.නාලනී ප්‍රේමවතී ප්‍රනාන්දු මහත්මිය |
| 12. | මහා නගර සභා මන්ත්‍රී | - | පී.අශෝක ඉන්ද්‍රතිලක ප්‍රනාන්දු මහතා |
| 13. | මහා නගර සභා මන්ත්‍රී | - | පී.එම්.මහේෂ් රුක්මාල් ඩයස් මහතා |
| 14. | මහා නගර සභා මන්ත්‍රී | - | පී.යසන්ත රන්සිරි ප්‍රනාන්දු මහතා |
| 15. | මහා නගර සභා මන්ත්‍රී | - | එස්.ඩබ්.එම්.නිෂා ඉරානි විජේවික්‍රම මහත්මිය |
| 16. | මහා නගර සභා මන්ත්‍රී | - | කේ.ඩී.අනුර ප්‍රනාන්දු මහතා |
| 17. | මහා නගර සභා මන්ත්‍රී | - | යූ.ලලිත් ප්‍රනාන්දු මහතා |
| 18. | මහා නගර සභා මන්ත්‍රී | - | එස්.බේසර රවීන්ද්‍ර ප්‍රනාන්දු මහතා |
| 19. | මහා නගර සභා මන්ත්‍රී | - | එෆ්.බී.නිලංක සිල්වා මහතා |
| 20. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.කේ.පී සුසන්ත පෙරේරා මහතා |
| 21. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.ප්‍රිනිත් ක්‍රිෂාන්ත විජේරත්න මහතා |
| 22. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.කුමාර රාජරත්න මහතා |
| 23. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.පිලිප් ප්‍රැන්සිස් ප්‍රනාන්දු මහතා |
| 24. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.ජයමාල් ශ්‍රියාරත්න මහතා |
| 25. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.බී.මල්ලිකා ජයවතී ප්‍රනාන්දු මහත්මිය |
| 26. | මහා නගර සභා මන්ත්‍රී | - | එච්. උජිත් ක්‍රිෂාන්ත කල්දේරා මහතා |
| 27. | මහා නගර සභා මන්ත්‍රී | - | රවිනාත් ජයශ්‍රී ගුණසේකර මහතා |
| 28. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.මැක්සි ජේ ප්‍රනාන්දු මහතා |
| 29. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.සුනිල් නන්දසිරි මාසකෝරාල මහතා |
| 30. | මහා නගර සභා මන්ත්‍රී | - | බී.සජිත් දුමින්ද පීරිස් මහතා |
| 31. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.තිසර රසාංජන මෙන්ඩිස් මහතා |
| 32. | මහා නගර සභා මන්ත්‍රී | - | යූ.අනුරසිරි ජයලාල් ද සිල්වා මහතා |
| 33. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්. චන්ද්‍ර ගාමිණී පීරිස් මහතා |
| 34. | මහා නගර සභා මන්ත්‍රී | - | ආර්.එම්.ඒ.දෝන දිලාශිනී මහත්මිය |
| 35. | මහා නගර සභා මන්ත්‍රී | - | යූ.ප්‍රසන්න මනෝජ් ප්‍රනාන්දු මහතා |
| 36. | මහා නගර සභා මන්ත්‍රී | - | ජී.එම්.නිරෝෂන් රුවමාල් අපෝන්සු මහතා |
| 37. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.සුදර්ශනි ප්‍රියන්තිකා කුරේ මහත්මිය |

| | | | |
|---|---|---|---|
| 38. | මහා නගර සභා මන්ත්‍රී | - | සිත්ති මසීනා බක්කර් මහත්මිය |
| 39. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.ශිරෝමි ඉන්දිකා කුරේ මහත්මිය |
| 40. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.ශ්‍රියානි හේමලතා ප්‍රනාන්දු මහත්මිය |
| 41. | මහා නගර සභා මන්ත්‍රී | - | ආර්.ක්‍රිෂණි ප්‍රනාන්දු මිය |
| 42. | මහා නගර සභා මන්ත්‍රී | - | කේ.ඩී.නිශාන්ත ප්‍රදිනාන්දු මහතා |
| 43. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.පී.ප්‍රභාෂනි වික්‍රමසිංහ මහත්මිය |
| 44. | මහා නගර සභා මන්ත්‍රී | - | ඒ.එච්.සුදේෂ් ඉන්ද්‍රජිත් කුමාර මහතා |
| 45. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.රවින්ද්‍ර රංගන ප්‍රනාන්දු මහතා |

ගරු නගරාධිපතිතුමාගේ ආරාධනය මත වැඩ බලන නාගරික ලේකම් එම්.කේ.ඩී.තාරක මුණසිංහ මහතා විසින් 2022.03.03 වන දින මාසික සභා රැස්විමේ නිවේදනය සභාවට ඉදිරිපත් කරන ලදි.

## 01. <u>වාර්තාව පිළිගැනිම හා සළකා බැලීම.</u>

2022.02.02 දින පැවති මහා සභා වාර්තාව.

<u>මහා නගර සභා මන්ත්‍රී - එල්. ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, 2022.02.02දින පැවති මහ සභා රැස්වීම් වාර්තාව පිළිගත යුතුයැයි යොජනා කර සිටිනවා.

එම යෝජනාව මහා නගර සභා මන්ත්‍රී එම්. තිලකසිරි ප්‍රනාන්දු මහතා විසින් ස්ථිර කරන ලදී.

ඒ අනුව, 2022.02.02 දින පැවති මහා සභා වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

## 02 <u>ගරු නගරාධිපතිතුමාගේ නිවේදන</u>

**02(1)** <u>නගරාධිපති - ඩබ්. සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීවරුනි, අද දිනයෙ දි සභාවට සහභාගි නොවන බව ගරු මහා නගර සභා මන්ත්‍රි යූ. ඒල්. සේනක දමයන්ත සිල්වා මහතා, මහා නගර සභා මන්ත්‍රි මේරියන් ලිහිණි ප්‍රනාන්දු මහත්මිය, මහා නගර සභා මන්ත්‍රි දිපා ආරියවංශ මහත්මියත් අසනිප තත්වයන් හේතු කොටගෙන සභාවට සහභාගී නොවන බව දන්වා එවා තිබෙනවා.

**02(2)** <u>නගරාධිපති - ඩබ්. සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීවරුනි, මාර්තු මසට නියමිත සියළුම ස්ථාවර කමිටු නියමිත දිනයනිහි පැවැත්වෙන බව දන්වා සිටිනවා.

ගරු මන්ත්‍රීවරුනි, අප්‍රේල් මාසයට නියමිත මාසික සභා රැස්විම 2022.04.01 වෙනි දින පැවැත්වෙන බව දන්වා සිටිනවා.

**02(3)** <u>**නගරාධිපති - ඩබ්. සමන්ලාල් ප්‍රනාන්දු මහතා**</u>

ගරු මන්ත්‍රීවරුනි, පළාත් පාලන කොමසාරිස් විසින් දන්වා ඇති 2022 වර්ෂයට අදාල වත්කම් බැරකම් පිළිබඳ ප්‍රකාශ ඔබ විසින් පුරවා සම්පූර්ණ කර භාරදිය යුතු අයදුම්පත අද ඔබට ඉදිරිපත් කරනවා.

**2(4)** <u>**නගරාධිපති - ඩබ්. සමන්ලාල් ප්‍රනාන්දු මහතා**</u>

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි, ආයචනා හා පෙත්සම් පැමිණි යටතේ 2022.01.06 මහා සභාවේ හා 2022.02.02 මහා සභාවේදි ඉදිරිපත් කරන ලද කරුණු සම්බන්ධයෙන් පිළිතුරු සභාවට ඉදිරිපත් කරනවා.

- මහා නගර සභා මන්ත්‍රී ඒ. එච්. සුරේෂ් ඉන්දික මහතා විසින් ඉදිරිපත් කර ඇති ව්‍යාපෘති ආපසු යැවීම පිළිබඳව

  මේ වෙනකොට ව්‍යාපෘතිය භාරගත්ත කොන්ත්‍රාත්කරු වෙතින් සභාවට වූ පාඩුව අයකර ගැනිමට ආරම්භ කර ඇත. මේ වනවිට වාරික 3කින් 275,096.13 ක මුදලක් නැවත ලබාගෙන ඇත.ඒ අනුව නැවත ටෙන්ඩර් කර එම ව්‍යාපෘතිය නිමකිරිමට අවශ්‍ය කටයුතු සිදුකර ඇත.

- මහා නගර සභා මන්ත්‍රී එච්. ප්‍රදීප් ශ්‍රියන්ත ප්‍රනාන්දු මහතා විසින් ඉදිරිපත් කර ඇති මොරටුව දකුණ ප්‍රදේශයේ ඉදිකොට ඇති කාණු පද්ධතිය උඩු වැසුම් සොරුන් ගලවාගෙන යෑම පිළිබඳව.

  අදාල සොරුන් හදුනාගෙන ඇති අතර නිතිමය පියවර ගෙන ඇත. සිමෙන්ති යොදා ආවරණ සැකසිමට නාගරික ඉංජිනේරුට උපදෙස් ලබාදී ඇත.

- මහා නගර සභා මන්ත්‍රී එල්. ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා විසින් ඉදිරිපත් කර ඇති කොරලවැල්ල කොට්ඨාශයේ ගණිකාවන්ගේ ප්‍රශ්ණය සම්බන්ධව හා මොරටුව ප්‍රධාන බස්නැවතුම්පල නවිකරණය කිරිම පිළිබඳ.

  ගණිකා ප්‍රශ්ණය සම්බන්ධයෙන් පොලිසිය දැනුවත් කර අදාල කටයුතු සිදුකරමින් පවතිනවා. බස්නැවතුම සංවර්ධනය කිරිමේ කටයුතු කඩිනමින් නිම කිරිමට කටයුතු කරනවා.

- මහා නගර සභා මන්ත්‍රී ඒ. එච්. සුදේෂ් ඉන්ද්‍රජිත් කුමාර මහතා විසින් ඉදිරිපත් කර ඇති සොයිසාපුර ක්‍රිඩාපිටියේ සෝලාපවර් අක්‍රියවිම සම්බන්ධව.

  සූර්ය විදුලිබල පද්ධතිය වෙනුවට ජාතික විදුලි පද්ධතියෙන් විදුලි සම්බන්ධතාවය ලබාදිමට අවශ්‍ය කටයුතු ඉදිරියෙදි සිදු කිරිමට කටයුතු කරනවා.

- මහා නගර සභා මන්ත්‍රී යූ. අනුරසිරි ජයලාල් ද සිල්වා මහතා විසින් ඉදිරිපත් කර ඇති කල්දේමුල්ල සි. පි. සිල්වා මාවත, සුධර්මාරාම පාර ප්‍රතිසංස්කරණය කරන ලෙස කරන ලද ඉල්ලිම.

  යෝජිත මලප්‍රවාහන පද්ධතිය යටතේ කැනිම් කිරිමට නියමිත මාර්ගයක් බැවින් එම ව්‍යාපෘතියේ ක්‍රියාකාරිත්වය සලකා බලා සුදුසු පරිදි ප්‍රතිසංස්කරණය කිරිමට කටයුතු කරනවා

- මහා නගර සභා මන්ත්‍රී බී. සජිත් දුමින්ද පීරිස් මහතා විසින් ඉදිරිපත් කර ඇති මාර්ගවල නාමපුවරු සවිකිරිම පිළිබදව හා කටුබැද්ද දිනපොල සම්බන්ධව.

  මොරටුව නගරයේ අනන්‍යතාවය පිළිබිඹු වන පරිදි දැවමය පුවරුවල නාමපුවරු සකස් කිරිමට අවශ්‍ය කටයුතු කරමින් පවතිනවා.

  කටුබැද්ද දිනපොලෙහි ට්‍රාන්ස්පෝමරය සවිකිරිමෙන් පසු ගොඩනැගිල්ල භාරගැනිමට කටයුතු යොදා ඇත.

- මහා නගර සභා මන්ත්‍රී ආර්. එම්. ඒ. දෝන දිලාශිනී මහත්මිය විසින් ඉදිරිපත් කර ඇති සොයිසාපුර කොට්ඨාශයේ පාර දෙපස වෙළදුන්ගෙන් සිදුවන අපහසුතාවය සම්බන්ධව.

  අනවසර වෙළදාම් විධිමත් කිරිම සදහා කොට්ඨාශයට ලබාදී ඇති මිලියන 4 ක ප්‍රතිපාදන මුදල ඔබතුමිය විසින් වෙන්කර ඇති මුදල් ප්‍රතිපාදනයට එකතුකර, විධිමත් පරිදි කඩ ඉදිකිරිමට අවශ්‍ය කටයුතු සුදානම් කර තිබෙනවා.

- මහා නගර සභා මන්ත්‍රී රවිනාත් ජයශ්‍රී ගුණසේකර මහතා විසින් ඉදිරිපත් කර ඇති මෝල්පේ 551/A ග්‍රාමයේ 90/A ඉඩමේ ඉදිකරමින් පවතින මහල් 04 ක නිවාස සම්බන්ධව

  මේ සම්බන්ධව පරික්ෂාකර ඉදිරිකටයුතු සිදුකිරිමට නාගරික ඉංජිනේරු වෙත උපදේස් ලබාදී තිබෙනවා.

  චන්ද්‍රකාන්තිය නව ගාලු පාර එගොඩ උයන පී. එන්. පීරිස් මහතා මෝදර ජයගත්පුර සංකිර්ණය ඇති පාරක් සම්බන්ධව

  මෙම කරුණ 2022.01.11 දින ඉඩම් කමිටුවට යොමු කර ඇති අතර අංක 04 යටතේ කටයුතු කරමින් පවතිනවා.

- මහා නගර සභා මන්ත්‍රී ඩබ්. රවින්ද්‍ර රංගන ප්‍රනාන්දු මහතා විසින් ඉදිරිපත් කර ඇති කොරලවැල්ල සමාජවාදි නිවහන් පෙදෙස කාණුව කඩා වැටිම සම්බන්ධව

  ප්‍රදිප් ශ්‍රියන්ත ෆ්‍රැන්සිස් ප්‍රනාන්දු මන්ත්‍රිවරුන්ගේ ඉල්ලිම පරිදි පිළිසකර කටයුතු සිදුකිරිමට අවශ්‍ය කටයුතු සිදුකර තියෙනවා. එයට සමගාමිව රේල්වේ එකටත් යොමුකරලා එ කටයුතු කඩිනමින් සිදුකිරිමට අවශ්‍ය කටයුතු සිදුකරනවා.

- මහා නගර සභා මන්ත්‍රී එම්. චන්ද්‍ර ගාමිණී පීරිස් මහතා විසින් ඉදිරිපත් කර ඇති පුවක්අරඹ පාරේ අංක 31 අසල බස් නැවතුම්පල අසල කාණු පද්ධතිය දුරුගන්දය පිළිබදව

  මහජන සෞඛ්‍ය පරික්ෂක මගින් අදාල නිවේදන යවා ගැටලුව නිරාකරණය කිරිමට අවශ්‍ය පියවර ගෙන ඇත.

- මහා නගර සභා මන්ත්‍රී කේ. ඩී. අනුර ප්‍රනාන්දු මහතා විසින් ඉදිරිපත් කර ඇති ඇවිදින මන්ත්‍රිරුවේ පොකුනේ කිඹුලන් ගැවසිම සම්බන්ධව

  අගුල් යොදා කිඹුලා අල්ලා වනජීවි දෙපාර්තමේන්තුවට භාර දිමට අවශය කටයුතු කරමින් පවතිනවා.

- මහා නගර සභා මන්ත්‍රී ඩබ්. ශ්‍රියානි හේමලතා ප්‍රනාන්දු මහත්මිය විසින් ඉදිරිපත් කරන ලද ඉඳිබැද්ද සුභජන මාවතේ ඉතිරි කොටස සාදා දී පිළිබඳ

  ගොනුව මගින් ඉදිරි කටයුතු සිදුකිරිමට නාගරික ඉංජිනේරු වෙත උපදේස් ලබාදී ඇත.

- මහා නගර සභා මන්ත්‍රී මේරියන් ලිහිණි ප්‍රනාන්දු මහත්මිය විසින් ඉදිරිපත් කරන ලද මොරටුව මහා විදියේ වාහන තදබදය පිළිබඳ දිශාවකට වාහන ගමන් කිරිම සම්බන්ධව

  ඔත්තේ සහ ඉරට්ටේ දින අනුව මාර්ග ගත වාහන නවතා තැබිමේ වැඩ පිළිවෙලක් ආරම්භ කිරිමට කටයුතු යොදා ඇත.

  පරිපාලන කටයුතු සම්බන්ධව වියදම අවම කිරිමට සමාජ මාධ්‍යජාලා හරහා කටයුතු කිරිම

  මේ සම්බන්ධව ඉදිරි කටයුතු සිදුකිරිමට සභාවට යොජනා ඉදිරිපත් කර ඇත. ඒ අනුව පියවර ගනිමින් සිටි.

- මහා නගර සභා මන්ත්‍රී යූ. අනුරසිරි ජයලාල් ද සිල්වා මහතා විසින් ඉදිරිපත් කරන ලද වරිපනම් බදු ගෙවන ජනතාවට සිදුවන අපහසුතාවය පිළිබදව

  පවත්නා තත්වය යටතේ වරිපණම් බදු ගෙවන ජනතාවට අවශ්‍ය මූලික කටයුතු සපයා ඇති අතර කාර්යාලයට නොපැමිණි ගෙවිම් කිරිම සඳහා මාර්ගගත ගෙවිම් ක්‍රමයද ආරම්භ කර ඇත.

- මහා නගර සභා මන්ත්‍රී කේ. ඩී. නිශාන්ත ප්‍රදිනාන්දු මහතා විසින් ඉදිරිපත් කරන ලද දකුණු ප්‍රදේශයේ ජලය බැස යාමට ඇති කාණුවල පිහිටි යකඩ කැලි ඉවත්විමෙන් පදිකයන්ට සිදුවන අවධානම පිළිබදව

  මෙම ආවරණය ගනු ලැබූ සොරුන් මේවන විට හදුනාගෙන ඇති අතර මේ සම්බන්ධව නිතිමය පියවරගෙන ඇත. ඉදිරියේදි සිමෙන්ති යොදා ආවරණය සකස් කිරිමට සැලසුම්කර ඇත.

- මහා නගර සභා මන්ත්‍රී ඩී. එම්. සුජිත් පුෂ්පකුමාර මහතා විසින් ඉදිරිපත් කරන ලද කොවිඩ් රෝගය වේගයෙන් පැතිරිම නිසා සභා සේවකයා ආරක්ෂාව පිළිබදව

  කෝවිඩ් 3 මාත්‍රාව ලබාගෙන නොමැති සේවකයන් මාර්තු 01 වන සතියේ සිට නිත්‍යානුකූල කටයුතු කරිමට කටයුතු සිදු කරමින් පවතිනවා.

  ජලය ලබාගැනිමේදි සිදුවන මාර්ග හානි අයදුම්කරුවන් විසින්ම මාර්ග හානි යථාතත්වයට පත් වූ පසු ගෙවන මුදල් යම්කිසි ප්‍රතිශතයක් නිදහස් කිරිම සම්බන්ධව.

  රජයේ ආදායමට ලත් මුදලක් ආපසු ගෙවිමට ගැටලු පවතින බැවින් ප්‍රායෝගිකව ක්‍රියාත්මක කර නොහැකි බව දන්වනවා.

  වැඩිකාලයක් එකම තැන සිටින නිළධාරින් ස්ථාන මාරු කිරිම සම්බන්ධව

  ආයතනයේ පරිපාලන කටයුතු වලට බාධාවකින් තොරව කරගෙන යැම අරමුණු කර ගනිමින් නිළධාරින් ඒ ඒ ස්ථානවලට අනුයුක්ත කර ඇත.අවශ්‍යතාවය පරිදි අභ්‍යන්තර ස්ථාන මාරු සිදුකරනු ලැබේ.

- මහා නගර සභා මන්ත්‍රී ඒ. එච්. සුරේෂ් ඉන්දික මහතා විසින් ඉදිරිපත් කර ඇති බොරුපන කොට්ඨාශයේ සෙත්සිරි මාවතේ මදුරුවන් බෝ කරන ස්ථානය පිළිබඳව

  මේ සම්බන්ධව මහජන සෞඛ්‍ය පරික්ෂකතුමා මගින් පරීක්ෂාකර බලා අදාල ස්ථානය පිරිසිදු කිරිමට අවශ්‍ය කටයුතු සිදුකර ඇත.

  බොරුපන තෙලවල කල්දේමුල්ල කොට්ඨාශයේ කොවිඩ් එන්නත්කරණයේ තුන්වෙනි මාත්‍රාව ලබාගැනිමේ ක්‍රමවේදයක් සකස් කිරිම පිළිබඳව

  මෙම කොට්ඨාශය අයත් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය මගින් කොවිඩ් 19 එන්නත් කරන කටයුතු විධිමත් සැලැස්මක් අනුව ක්‍රියාත්මක නොකරන බැවින් ඊට පිළියමක් ලෙස යුද හමුදාවේ සහය ඇතිව එන්නත්කරණ කටයුතු සිදු කිරිමට සාකච්ඡා කරමින් පවති.

- මහා නගර සභා මන්ත්‍රී එම්. තිසර රසාංජන මෙන්ඩිස් මහතා විසින් ඉදිරිපත් කර ඇති ඔක්තෝම්බර් මස මහ සභාවට ඉදිරිපත් කල පෙත්සමට කිසිදු ප්‍රතිචාරයක් නොදැක්විම.

  ගොඩනැගිලි සැලසුම් අනුමැති සම්බන්ධව විරෝධතාවය ලහිරු ගිහාන් ප්‍රනාන්දු 196 කඩලාන පාර කඩලාන එම් ඉ ටි බි ඉ 70/19 යටතේ මිට අදාල ගොඩනැගිලි සැලසුම අනුමත කර ඇත.

- මහා නගර සභා මන්ත්‍රී එම්. තිලකසිරි ප්‍රනාන්දු මහතා විසින් ඉදිරිපත් කර ඇති ඉඳිබැද්ද ඩග්ලස් ප්‍රනාන්දු ක්‍රිඩාංගනය වටා පිහිටි කාණු පද්ධතිය ප්‍රතිසංස්කරණය

  මේ සඳහා අවශ්‍ය වෙන්නාවු ලක්ෂ 32 අමතරව ලක්ෂ 8 කුත් යොදවලා ලක්ෂ 40 ක ඇස්තමේන්තුවක් හෙට අනිද්දා ආරම්භ කිරිමට කටයුතු සුදානම්කර ඇත. ඉඳිබැද්ද සේවා පටුමගේ ජල සැපයුම ලබාගැනිමේදි සිදුවන මෙ සඳහා අවශ්‍ය කටයුතු සිදුකර අවසන් කර ඇත.

- මහා නගර සභා මන්ත්‍රී එම්. ශිරෝමි ඉන්දිකා කුරේ මහත්මිය විසින් ඉදිරිපත් කර ඇති මොරටුමුල්ල ආලෝකපිටිය පාර සකස්කර දෙන ලෙස කර ඇති ඉල්ලීම සම්බන්ධව

  මහ නගර සභා මන්ත්‍රි නිලංක සිල්වා මහතාගේ ඉල්ලිම පරිදි මාර්ගය පිලිසකර කිරිම සඳහා ඇස්තමේන්තු සකස් කර ඇත.

- මහා නගර සභා මන්ත්‍රී ජී. එම්. නිරෝෂන් රුවමාල් අපෝන්සු මහතා විසින් ඉදිරිපත් කර ඇති සි එස් සි පෙරේරා මාවතේ ස්ලැබ් කැඩි ඇති බැවින් ප්‍රතිසංස්කරණය කිරීම පිළිබඳ

  අදාල ප්‍රතිසංස්කරණ කටයුතු සිදු කර දෙන ලෙස නාගරික ඉංජිනේරු වෙත උපදෙස් ලබාදි ඇත.

  ලුනාව රෝහල ඉදිරිපිට ඩෙංගු රෝගින් වාර්තා විම පිළිබඳව විටින් විට විවිධ ස්ථාන වලින් ඩෙංගු රෝගින් වාර්තාවිම සිදුවන අතර සමස්ථයක් ලෙස

  බල ප්‍රදේශයේ ඩෙංගු මර්ධනය සඳහා ස්ථාන පරික්ෂාව හා දුම්මානය කටයුතු සිදුකිරිම නඩු පැවරිම සම්බන්ධයෙන්ද කටයුතු සිදුකෙරේ.

- මහා නගර සභා මන්ත්‍රී ජී. එම්. සුරංග නිශාන්ත අපෝන්සු මහතා විසින් ඉදිරිපත් කර ඇති ලක්ෂපතිය ක්‍රිඩාපිටිය ජාතික ජල සම්පාදන මණ්ඩලය මලනාලිකා පද්ධතිය සඳහා කටයුතු සූදානම් කිරිම පිළිබඳව

  මහ නගර සභා මන්ත්‍රීවරු දැනුවත් කරන ලෙස මේ සම්බන්ධයෙන් 2001/23 ව්‍යාපෘති නිළධාරි ප්‍රධානත්වයෙන් පැවති සාකච්ඡාවේ මන්ත්‍රීවරු දැනුවත් කරන ලදි.

  කොවිඩ් තෙවන මාත්‍රාව ලබාදිමේ ප්‍රචාරක කටයුතු සිදුකරන ලෙස තෙවන මාතාව ලබාදෙන දින සම්බන්ධව

  සෞඛ්‍ය වෛද්‍ය නිළධාරි කාර්‍යාලය මගින් කල් ඇතිව සභාව දැනුවත් නොකරන බැවින් ප්‍රචාර කටයුතු සිදු කිරිමට නොහැකි වි ඇත.

- මහා නගර සභා මන්ත්‍රී රවිනාත් ජයශ්‍රී ගුණසේකර මහතා විසින් ඉදිරිපත් කරන ලද මධ්‍යම වෙළඳපොල කඩ කාමර බදුකුලි සංශෝධනය කර දීම සම්බන්ධව

  මේ සම්බන්ධ සාකච්ඡාවේදි ඉදිරි අවශ්‍ය කටයුතු සිදුකරනු ඇත.

- මහා නගර සභා මන්ත්‍රී එච්. ප්‍රදීප් ශ්‍රියන්ත ප්‍රනාන්දු මහතා විසින් ඉදිරිපත් කරන ලද ඉඩම් නිරවුල් දෙපාර්තමේන්තුව මගින් පවත්වාගෙන යන මොරටුව බිම් සවිය කාර්යාලය සම්බන්ධව

  ඉඩම් අමාත්‍යාංශ ලේකම් සමග 2022/02/23 වන දින දුරකථනයෙන් කථා කරා. එම ඉල්ලිම සම්බන්ධයෙන් සලකා බලා පිළිතුරු ලබාදෙන බව එතුමා පැවසුවා.

- මහා නගර සභා මන්ත්‍රී බී. සජිත් දුමින්ද පීරිස් මහතා විසින් ඉදිරිපත් කර ඇති මොරටුව නගරය තුල පදිකවේදිකා වාහන නැවැත්විම සම්බන්ධයෙන් දඩ මුදල් අයකිරිම සම්බන්ධව.

  මාර්ගය දෙපස වාහන නැවැත්විම පාලනය කිරිම සඳහා ඔත්තේ සහ ඉරට්ටේ දින වශයෙන් මාර්ගය දෙපස වාහන නැවැත්විම විධිමත් වැඩපිළිවෙලක් සකසා ක්‍රියාවට නැංවිමට කටයුතු සිදුකරමින් පවති.

  මොරටුව පුද්ගලයකු විසින් නවඋත්පාදන යන්ත්‍රයක් සකස් කිරිම මාර්ග හානියක් නොකොට වතුර ලබාගැනිම සම්බන්ධයෙන්

  අදාල පුද්ගලයා ගෙන්වා එ සම්බන්ධව සොයා බලා වාර්තා කරන ලෙස නාගරික ඉංජිනේරුට උපදේස් ලබාදි ඇත.

- මහා නගර සභා මන්ත්‍රී මේරියන් ලිහිණී ප්‍රනාන්දු මහත්මිය විසින් ඉදිරිපත් කරන ලද ලුනාව ඇවිදින මන්තිරුවේ තැන තැන ඇති ප්ලාස්ටික් හා බෝතල් පිළිබඳව ව්‍යාපෘති කටයුතු අවසන් කර සභාවට භාර දිමෙන් පසු විධිමත් ක්‍රමවේදයක් යටතේ පිරිසිදු කිරිමේ කටයුතු සිදු කල හැක.

- නියෝජ්‍ය නගරාධිපති ඩී. සමන්ත සිල්වා මහතා විසින් ඉදිරිපත් කරන ලද කාණු කණ්ඩායම් විසින් මාර්ග පවිත්‍ර කිරිමේදි සිදුවන අක්‍රමිකතා ඒ ඒ දිනවල සේවයට වාර්තාකල සේවක සංඛ්‍යාව අනුව කාණු කණ්ඩායම් රාජකාරි සඳහා යොදවන ස්ථාන තිරණය කරන බැවින් අක්‍රමිකතා සිදු නොවේ.

- මහා නගර සභා මන්ත්‍රී එම්. චන්ද්‍ර ගාමිණී පීරිස් මහතා විසින් ඉදිරිපත් කරන ලද රාවතාවත්ත පළවෙනි පටුමගේ අංක 8/1 ස්ථානයේ පැති කාණු ප්‍රතිසංස්කරණය කරන ලෙස නාගරික ඉංජිනේරුවෙත උපදේස් ලබාදී ඇත.

- මහා නගර සභා මන්ත්‍රී ජී. එම්. නිරෝෂන් රුවමාල් අපෝන්සු මහතා විසින් ඉදිරිපත් කරන ලද මොරටුව මහා නගර සභාව නියෝජනය කරන සභාපතිවරුන්ගේ ඡායාරූප ප්‍රදර්ශනය කරන ලෙස සියලුම සභාපතිවරුන්ගේ ඡායාරූප සපයා ගත හැකිනම් පමණක් ක්‍රියාත්මක කිරිමට තිරණය කර ඇති අතර ඡායා රූප සපයා ගැනිම සඳහා කටයුතු කරමින් පවති.

## 03 සභාව අමතා එවන ලද ආයවනා හා පෙත්සම් පැමිණිලි හා සන්දේශ සභාව හමුවේ තැබිම.

### 03(1) මහ නගර සභා මන්ත්‍රී - ඩබ්. මැක්සි ජේ ප්‍රනාන්දු මහතා

ගරු නගරාධිපතිතුමනි, මගේ නිවසට යාබද ස්ථාන දෙකකට ජල සැපයුම ලබාගෙන තියෙනවා. දැන් මම හිතන්නේ අවුරුද්දක් විතර වෙනවා ජලය අරගෙන. ඒ ස්ථාන දෙකම කැඩිලා තියෙනවා. හරි අමාරුයි ගමනාගමනයට. ඒ ගැන අවධානය යොමු කරන්න කියලා ඉල්ලා සිටිනවා.

### 03(2) මහ නගර සභා මන්ත්‍රී - යූ. අනුරසිරි ජයලාල් ද සිල්වා මහතා

ගරු නගරාධිපතිතුමනි, මගේ පලවෙනි කරුණ තමයි රට අද වෙනකොට තියෙන අර්බුදය තෙල් ප්‍රශ්ණයෙන් මේ රට විදුලිය මේවන විටත් රටපුරා ඇණහිටලා තියෙනවා. එම නිසා මම මේ සභාවට කියන්නේ මුළු ක්ෂෙත්‍රයම කඩා වැටිලා තියෙනවා.

<u>මහ නගර සභා මන්ත්‍රී - ඒ. එච්. සුරේෂ් ඉන්දික මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, රීති ප්‍රශ්ණයක් ආයවන හා පෙත්සම් පැමිණිලි යටතේ විවාදයකට තුඩුදෙන කරුණු ඉදිරිපත් කරන්න එපා කියලයි මම ඉල්ලන්නේ. මොකද පුද්ගලික ස්භාවයේ වෙනත් කරුණු යටතේ තියෙනවා. යම්කිසි පාරක ප්‍රශ්ණයක් සභාවට අදාල ප්‍රශ්ණයක් නම් කමක් නැහැ. නමුත්, මෙතුමා කියන කාරණාව ඒකපාර්ශිකව තමයි වාර්තා වෙන්නේ. මෙය විවාදයකට තුඩුදෙන එකක්නේ අපිට ආණ්ඩු පක්ෂය විදියට උත්තර දෙන්න බැහැ මේ තියෙන අයිතමය යටතේ. මේතුමා කියන කාරණාව ගැන මේතුමාට කියන්න අයිතිය තියෙනවා. මම කියන්නේ මේ අයිතමය තෝරගන්නේ නැතිව පුද්ගල ස්භාවයේ අයිතමය තෝරාගන්න එතකොට අපිටත් මේකට සම්බන්ධ වෙන්න පුලුවන්.

<u>නගරාධිපති - ඩබ්. සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රිතුමා, ඔබතුමා කියන්න යන ඒක පුද්ගල ස්භාවයේ කරුණු යටතේ නම් කරන්න.

**<u>මහ නගර සභා මන්ත්‍රී - යූ. අනුරසිරි ජයලාල් ද සිල්වා මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, මම සභාවට අවශ්‍ය කරුණක් කියන්නේ. දැන් මේ තියෙන තත්වයත් එක්ක අපි වායුසමීකරණ දාලා තියෙනවා. දැන් මම කියන්නේ මේක අපි ආරම්භයක් දෙමු සභාවේ විදුලිය අපි දොරවල් ජනේල ඇරලා හරි කමක් නැහැ ඉතිරි කරන්න. මොරටුව නගර සභාවක් විදියට අපි මොරටුවේ සෑම ක්ෂේත්‍රයක්ම කඩා වැටිලා තියෙනකොට මේ සභාවේ ඒසි පාවිච්චි කරමින් මේ සභාව අපි පවත්වාගෙන යනවා. අද සියලුම ව්‍යාපාර නිවාස මොරටුවේ මිනිසුන් ජීවත්වෙන්නේ බොහෝම අමාරුවෙන් විදුලිය නැතිව. අපි මෙතන ආරම්භයක් දෙමු පළාත් පාලන ආයතනයක් විදියට වගකියන ජනතාවගේ වගකියන ආයතනයක් විදියට මම මේ කියන්නේ මේක අපි ආදර්ශයක් දෙමු. සභාවක් විදියට යම්කිසි පණිවිඩයක් දෙමු වායුසමීකරණ දාලා මන්ත්‍රීවරුනි විදියට මේක පාවිච්චි කරන්න ඕන නෑ. මේ වෙලාවේ රටේ තියෙන විදුලි අර්බුදයට අද දිනයේ හරි වායු සමීකරණය කරලා තියෙන එවා මොකද අද මොරටුවේ ජනතාව මේ වෙනකොට නිවාස වල විදුලිය කපලා ජනතාව පිඩාවට පත්වෙන තත්වයක් ඇතිවෙලා තියෙනවා. ඒ කරුණ අවධානය යොමු කරන්න කියලා මම ප්‍රකාශ කරනවා. අනෙක් කරුණ තමයි මම ගිය වසරේ සිට 2021 වසරේ සිට කල්දේමුල්ල කොට්ටාශයේ විශාල පාරවල් කිහිපයක් තියෙනවා යන්නම බැරි.

**<u>නගරාධිපති - ඩබ්. සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ කරුණට මම උත්තර දුන්නා.

**<u>මහ නගර සභා මන්ත්‍රී - යූ. අනුරසිරි ජයලාල් ද සිල්වා මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, ගමට එළිය කියන වැඩ සටහනක් යනවානේ මේ ගමට එළිය කියන වැඩ සටහනේ ප්‍රමුඛතාවය දෙන්න තිබ්බේ කල්දෙමුල්ලට. මේවන විට ඔබතුමා සභාවෙන් මට ලිපියක් එවලා තියෙනවා කල්දේමුල්ලේ ගමට එළිය වැඩසටහන දාලා තියෙන්නේ 2022/05/10 පාරවල් විශාල ලෙස කල්දේමුල්ලේ කැඩිලා. සි පි ද සිල්වා මාවත, සුදර්මාරාම මාවත, ආතර් ප්ලේස් මේ හැම පාරක්ම කැඩිලා තියෙන්නේ.

**<u>නගරාධිපති - ඩබ්. සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා මෙතන හිටියේ නැති නිසා අපි දැන් සභාවට දුන්නා ඔබතුමා කියපු පාරවල් එක්ක දැන් මල නාලිකා පද්ධතියක් එනවා. එ මල නාලිකා පද්ධතියේ මූලිකත්වය දිලා සම්පූර්ණම පාරවල් ටික කරලා පාරවල් කාපට් කරන්න අපි ගිවිසුම් ඇති කරගෙන තියෙනවා. දැන් ඒ නිසා අපි මුලිකත්වය දෙනවා ඔතනට.

**<u>මහ නගර සභා මන්ත්‍රී - යූ. අනුරසිරි ජයලාල් ද සිල්වා මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, අනෙක් කරුණ තමයි මගේ මේ දවස්වල මදුරු ප්‍රශ්ණය මේ මදුරු ප්‍රශ්ණය විශාල ලෙස මේ මදුරුවෝ දිනෙන් දින වර්ධනය විමක් තමයි වෙන්නේ. අඩුවීමක් වෙන්නේ නැහැ. අපේ පාලන කාලයේම මදුරු නාශක තෙල් ඉස්සා මදුරුවන්ට ගෙවල්වලට ගිහිල්ලා.

<u>නගරාධිපති - ඩබ්. සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීවරුනි, මෙතනට ඇවිල්ලා මාසෙකට පාරක් කෙරෙන එකයි නොකෙරෙන එකයි චෝදනා කරන එකයි විතරක් කරන්න එපා. ගරු මන්ත්‍රීවරු මෙහෙමම ගිහිල්ලා අනෙක් පැත්තට හැරිලා අද මේ වෙනකොට සෞඛ්‍ය වෛද්‍ය නිළධාරි මොරටුව එතුමිය මේ වෙනකොට සභා රැස්වීමේ දිගින් දිගටම අවුරුදු දැන් 13 කට වැඩි කාලයක් තිස්සේ පවත්වාගෙන යන ඩෙංගු රැස්වීමට එන්නේ නැහැ. ඩෙංගු වැඩසටහන් කරන්නේ නැහැ. ඩෙංගු වැඩසටහන් වලට අදහස් දෙන්නේ නැහැ. එතුමියගේ අදහසක් අනුව තමයි අපි තෙල් ඉසීම නතර කලේ. එතුමිය දිගින් දිගටම කිව්වා උපදේස් ඇවිල්ලා තියෙන්නේ තෙල් ඉසින්න එපා මේ එතුමියගේ වාර්තාවල තියෙනවා. මෙතුමා නගරාධිපතිවෙලා ඉන්න කාලේ මෙතුමාට මෙහෙම ප්‍රශ්ණ ආවාම අපි මේතනට ඇවිල්ලා ඇඟිල්ල දික්කරලා බැන බැන හිටියේ නැහැ. අපි ගිහිල්ලා එතුමාට උදව් කරන්න තැන් හොයලා දිලා එහෙම කරන්න එපා කියලා අපි ඡන්ද දායකයන්ට කියපු එකයි කලේ. කවුරුවත් නිළධාරින් නගරාධිපතිවරයාට සභාවට අවතක්සේරු වැඩ කරලා එතනට ගිහිල්ලා ප්‍රශ්ණය බේරුවා ඇරෙන්න අපි මොන වෙලාවකවත් එකත් එක්ක කිය කිය ඇඟිල්ල දික් කලේ නැහැ. ඇඟිල්ල දික්කරගෙන මම 14ක් තැප්පා. ආයේ මට තපින්න වුවමනාවකුත් නැහැ. තපින එක සාධාරණය කරන්න කවුරුත් නැහැ. මම කරපු එකකුත් නෙමෙයි. මම තපින කොට එතුමිය ගිහිල්ලා නම්බර්ස්වලට ටොකන්වලට එන්නත් ගැහුවා. එක නිසා කරුණාකරලා ඔහොමම හැරිලා ගිහිල්ලා සාකච්ඡාවක් ඉල්ලලා කරුණාකරලා ඔබතුමියට ඔක කරන්න බැහැ බැරිනම් යන්න. ඇවිල්ලා මම මේ නිතිමය කටයුතු කරන්න ලැස්තිකරලා තියෙන්නේ. කරුණාකරලා ගිහිල්ලා සභාවට උදව් කරන්න. එක කියන්න කවුරුත් නැහැ. අපි ඒක කියන්න ගිහිල්ලා තමයි වුනේ ඒක නිසා හැමතිස්සේම මෙතනට ඇවිල්ලා කරන්නැ කරන්නැ කියනවාට වඩා කෙරෙන්නේ නැත්තේ මොකද කියලා හොයලා බලන්න.

<u>මහ නගර සභා මන්ත්‍රී - යූ. අනුරසිරි ජයලාල් ද සිල්වා මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, ඔබතුමා ඔබතුමාගේ කරුණ මම ඒක අධිකරණයේ යන නිසා මම ඒ ප්‍රශ්ණය ගන්නේ නැහැ. මේ වෙලාවේ මම කියන්නේ මදුරුවන්ට විසඳුමක් තියෙන්න ඕන සභාවක් විදියට. මම කියන්නේ මදුරු නාශක තෙල් අපි ඇයි නැවැත්තුවේ.

<u>නගරාධිපති - ඩබ්. සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමා, එතුමිය අපිත් එක්ක ඩෙංගු මීටින් එකේ ඉඳගෙන ධූම්මානයත් අවශ්‍ය තැනට විතරයි කරන්නේ. හැමතැනටම කරන්න බැහැ. මේකට පුරුදු වුනොත් තව අවුරුදු 20ක් යනවා මැලේරියාවට වගේ ඩෙංගුවලට බෙහෙත හොයාගන්න. ඒක නිසා දුම්ගහන එකත් කරන්නේ රෝගියෙක් හිටියොත් විතරයි. තෙල් ගහන එක කරන්න එපා ඇලදොල ගංගාවලින් මුහුදට ගිහිල්ලා මත්සයෝ මැරෙනවා කියලා කිව්වේ අපි නෙමෙයි ඩොක්ටර්. මම කරපු එකක් නෙමෙයි බයිසිකල් 20ක් අරගෙන නගරාධිපති අරමුදලෙන් බයිසිකල් දිලා පොම්ප අරගෙන පොම්ප දිලා ඔක්කොම ක්‍රියාත්මක කරන එක තමයි සෞඛ්‍ය වෛදය කාර්යාලයෙන් උපදෙස් මත සම්පූර්ණයෙන් නැවැත්තුවේ. මේක පිළිගන්න.මෙය අපි කරපු එකක් නෙමෙයි. ඒ උපදෙස් අනුව නවත්තපු එකක්.

**03(3)** <u>මහ නගර සභා මන්ත්‍රී - එල්.ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, මම ඔබතුමාට හා මොරටුව නගර සභාවට ස්තුතිවන්ත වෙනවා මොරටුව උස්වත්ත ජෝන් වත්ත ග්‍රාමයේ අවුරුදු 40 කට අධික කාලයක් ඒ ජොන් වත්තේ ජනතාව දැඩි ලෙස වර්ෂා කාලයේදි අපහසුතාවයට පත්වුනා. ගරු ඔබතුමාගේ මැදිහත් විමෙන් ඒ මාර්ගයට බොක්කුවක් දාලා මුහුදට යන්න සැලැස්සුවා. ඒ සම්බන්ධව උස්වත්ත ජනතාව වෙනුවෙන් මාගේ ගෞරවනිය ප්‍රණාමය ඔබතුමාට පුදකරනවා.

**03(4)** <u>මහ නගර සභා මන්ත්‍රී - එම්.තිසර රසාංජන මෙන්ඩිස් මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, ඔබතුමා මිට පෙර තිබුණු පුරුද්දක් ලෙස කරපු සභාව අමතා එවන ලද ආයවන හා පෙත්සම්වලට පිළිතුරු සපයන්න ඔබතුමා උස්සාහයක යෙදිලා තියෙන එක ගැන අපේ ස්තුතිය පුද කරනවා. ඒවගේම නගරාධිපතිතුමා, මම ඉදිරිපත් කරපු පෙත්සමේ කියවෙන කාරණාව ටිකක් වෙනස් කාරණාවක්. මේකට අනුමැතිය ලැබි ඇති බව ජනතාව තේරුම් අරගෙන තියෙනවා. ගොඩනැගිල්ල තැනිමේදි යම්කිසි විදියකට අවශ්‍ය කරන නිර්ණායක එකට තියෙන කොන්දේසි උල්ලංඝණය කිරිමක් කරලා තියෙනවා කියලා තමයි ජනතාව කියන්නේ. මේ සම්බන්ධව පරීක්ෂණයක් ඉල්ලන්නේ. මේ ගැන නැවත ඔබතුමා බලලා එ ගැන සාධනිය පියවරක් ගනු ඇතැයි අපි බලාපොරෝත්තු වෙනවා.

ගරු නගරාධිපතිතුමනි, ඔබතුමාට ලිපියක් ඉදිරිපත් කරනවා දෙවෙනි මාසේ 10 වෙනිදා කොන්ක්‍රීට් බැම් දෙකක් සම්බන්ධව අර මහජන පාරට මැටිකන්ද පාරෙන් ගිහිල්ලා මැටිකන්ද පාරෙන් මහජන පාරට හැරෙන තැන තියෙන එක පැත්තකින් ස්ලැබ් එකක් කැඩිලා තියෙනවා යටතියෙන අර කොන්ක්‍රීට් බැම් දෙකේ ප්‍රශ්ණයක් නිසා. ඒ බැම්දෙක සකස්කිරිමේ අවශ්‍යතාවයක් පැනනැගිලා තියෙනවා. මේ සම්බන්ධව යම්කිසි පියවරක් ඔබතුමා අරගෙන තියෙනවාද ඒ කාරණාව ඔබතුමාට පුලුවන් බලලා ප්‍රකාශයක් කරන්න.

ගරු නගරාධිපතිතුමනි, මාස කිහිපයකට උඩදි රාවතාවත්ත පොදු සුසාන භූමියේදි අපේ මන්ත්‍රිවරයෙකුගේ සහෝදරයෙකුගේ පසුම්බියක් නැතිවෙනවා. ඒ සම්බන්ධව පරික්ෂණයක් පවත්වාගෙන යනකොට අපේ සේවකයෙකුට ලැබුණා කියන ආරංචිය තමයි තියෙන්නේ. එතනදි ගත්ත පියවර මොකක්ද කියන එකත් රු100,000.00ක් විතර පසුම්බියේ තිබිලා තියෙනවා. ඒ සම්බන්ධව යම් පියවරක් ඔබතුමා අරගෙන තියෙනවාද නැත්නම් එයට පියවරක් ගන්න බලාපොරොත්තු වෙනවාද රාවතාවත්ත සුසාන භූමිය තුල.

<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රිතුමා, ඔය රංග මන්ත්‍රිතුමාගේ සහෝදරයා ගැනනේ කියන්නේ. ඇත්තට කියනවානම් මම ඒක නිශාන්ත ප්‍රදිනාන්දු ගරු මන්ත්‍රිතුමාත් මාත් එක්ක ඔය සම්බන්ධයෙන් කථා කරා. කථාකරලා මම එකට ක්‍රියාත්මක විම සඳහා ගන්න ඔන වෙන්නැති තිරණයකට පවා ගියා. ඒ යන අතරතුරේදි මම කියන්න යන්නේ නැහැ කෙනා කවුද කියලා අපිට කථා කරනවා මේ ප්‍රශ්ණයේදි දැක්ක කෙනෙක් නැහැ. ගත්තා කියලා ඔප්පු කරන්න තැනක් නැහැ. එහෙම තියෙන කොට යම් කෙනෙක් කථාකරලා එකට මැදිහත්විම නිකම් අනවශ්‍ය විදියට මැදැහත්විමක් කරන්න කටයුතු කරපු නිසා මම ප්‍රශ්ණයෙන් අයින් වුනා. නැත්නම් වැටුපෙන් කපන්න දාලා කටයුතු කරන්න සුදානම් කරලා තිබුනේ නමුත් යම් කෙනෙක් මැදිහත්වෙලා මේක කරන්නම

ඕන. අරකයි මේකයි කිව්වාම මම ඇත්තටම කියනවා නම් අර රුවන් කියලා නගර සභාවට හරි ආදරේයි තණකොල ටික කපාගෙන ඉන්න මනුස්සයා වැද වැද කියනවා සර් මගේ වැටුපෙන් කපන්න ඉස්සෙල්ලාම පටන් ගන්න මම නම් ගත්තේ නැහැ කියලා කිය කිය ඉන්දැද්දි තමයි මම වැටුපෙන් කපන්න ලැස්තිකරේ. හැබැයි ඒකට අනිසි බලපෑම හරියට නිකම් දැක්කා සාක්කුවෙන් දාගත්තා ගණන් කරලා ගත්තා ඔක්කෝම දැක්ක විදියට යම්කිසි නිළධාරියෙක් මට කථාකරන්න පටන් ගත්තා. මම ඉතින් කල්පනාකරා අනවශ්‍ය දෙයක් කරන්න ගිහිල්ලා තව මුකුත් පටලවා ගත්තොත් මේ හදිසියේ මේ සේවකයෝ තුන්දෙනා මානව හිමිකම් ගියොත් නගරාධිපතිතුමා අපේ වැටුපෙන් කපලා මේක ගන්න යනවා කියලා මට ප්‍රශ්ණයක් වෙනවා ඊට පස්සේ මම එක අතහැරලා දැම්මා. ඒක තමයි ඇත්ත කථාව.

## 03(5) <u>මහ නගර සභා මන්ත්‍රී - එම්.තිසර රසාංජන මෙන්ඩිස් මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, ශාන්ත අන්තෝනි පාරේ බදාදා පොලවත්තේ පාරක් සංවර්ධනය කරලා ඒ පාර සංවරධනය කිරිමෙන් පසු ඒ එකතු වුන සියලුම කුණු කසල ටික පාරේ මුලට දාලා තියෙනවා. ඒක අස්කරලා නැහැ. මාස කිහිපයක් තිස්සේ මේ පිළිබදවත් ඔබතුමාගේ අවධානය යොමු කරන්න කියලා ඉල්ලා සිටිනවා.

<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමා, මම ගිය සභාව පටන් ගනිද්දි අචිනි මහත්මියට උපදෙස් දුන්නා ඕක කරගෙන යන්න කියලා. නමුත්, මේවා මෙතනට එන අය ලියා ගත්තා විතරක් මදි දැන් මම මේ සභාවේ ආයවන පෙත්සම් වලට පිළිතුරු දෙනවා වගේ ඒවට පිළිතුරු දෙන්න මට එකට අදාල වෙන්නාවූ කාරණයට දෙන්න ඕන. අද ඔබතුමා ලියාගෙන අද කරුණාකරලා බලන්න. බලලා ඒක අපි ක්‍රියාත්මක කරන්න අවශ්‍ය උපදෙසුත් දුන්නා. ඕක දැන් යම් යම් තැන්වල මේක හරි අවිධිමත් විදියට කොන්ත්‍රාත්කරුවෝ කොන්ත්‍රාත් එක කරන එකේ අවසාන ඉලක්කය වෙන්න ඕන. කොන්ත්‍රාත් එකෙ කියන එකේ පාර සැකසීම හා ඉවත් කිරීම යන ඔක්කෝම කොන්ත්‍රාත් එකට අදාල වෙනවා. කොන්ත්‍රාත් එකේ මේක දාලා යන්න කියලා නැහැ. ඒක කරන්න ඕන ඒක නිසා කරුණාකරලා කොන්ත්‍රාත්කරුවන්ට උපදෙස් දෙන්න.

## 03(6) <u>මහ නගර සභා මන්ත්‍රී - ඩබ්.රවින්ද්‍ර රංගන ප්‍රනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, ආයවන හා පෙත්සම් පැමිණිලි යටතේ කොරලවැල්ල නව ගාලු පාරේ සමාජවාදි නිවහන් පෙදෙසත් කොන්ස්ටන්ටයින් මාවත අතර කාණු පද්ධතියට වැසිකිලි නල සමහරුන් හරවලා කියලා මට වාර්තා වෙලා තියෙනවා. ඒ ගැන සොයලා බලා කටයුතු කරන්න කියලා ඉල්ලා සිටිනවා. ඒවගේම ඔබතුමා දැන් කලින් කථා කරා ගණිකා වෘත්තියේ යෙදෙන කාරණාව සම්බන්ධව. සැහෙන බැරෑරුම් ප්‍රශ්ණයක් නගරාධිපතිතුමා ගණිකා වෘත්තිය විතරක් නෙමෙයි මෙතන වෙන්නේ. ඊට එහා අපේ ගමට හානියක් වෙන ආකාරයේ ප්‍රශ්ණ සිදුවෙනවා. කාන්තාවෝ දෙදෙනෙක් ඉන්නවා ඔවුන් කරන්නේ සාමානය දුරගමන් යන ලොරි රථ රියදුරන් ඔවුන්ගේ ගිමන් මහන්සිය නිවාගැනිම වෙනුවෙන් කොන්ස්ටන්ටයින් මාවතේ වාහන නවත්වා ගන්න පුලුවන් ස්ථානයට එනවා. සමහරුන් ගණිකා වෘත්තියේ කාරණාවටත් එනවා. නමුත්, මේතනදි වෙන්නේ කාන්තාවන් දෙදෙනා කරන කාරණාව තමයි අපේ ගමට සැහෙන කැලලක් ඇති කරන ප්‍රශ්ණයක්. මොකද මේ එන රියදුරන්ව රැගෙන ගෙන ගිහින් එහා පැත්තේ වෙරලේ කැලෑවක් වගේ ස්ථාන දෙකක් තියෙනවා. ඔතනට ගිහිල්ලා මොවුන්ට ගහලා මුදල් පසුම්බි

රත්තරන් බඩු ගන්න කාරණාවක් වෙනවා. මේක අනිවාර්යෙන් නැවැත්විය යුතු කාරණාවක්. මොකද ගමටත් කොරලවැල්ලට විතරක් නෙමෙයි මොරටුවටත් සැහෙන අපකීර්තියක් අත්පත්වෙන කාරණා. හැකි ඉක්මණින් මේ ගැන මැදිහත්වෙලා මේ කාර්යය මින් ඉදිරියට ඉටුවෙන්න නොදෙන්න කියලා නගරාධිපතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

**03(7)** **<u>මහ නගර සභා මන්ත්‍රී - එච්.ප්‍රදීප් ශ්‍රියන්ත ප්‍රනාන්දු මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, මම හිතන්නේ තිසර මෙන්ඩිස් මහතා ඉදිරිපත් කර කථාවෙදිත් ඔබතුමා ඒක මතක් කරා. අපිටත් කියන්න තියෙන්නේ ඒ කාරණයමයි. ගිය මහා සභාවෙදිත් අපි දකුණු පළාතේ මාර්ග සම්බන්ධයෙන් එහි ආවරණ සොරකම් කිරිම සම්බන්ධයෙන් කථා කරා. නිශාන්ත ප්‍රදිනාන්දු මන්ත්‍රීතුමාත් අපේ මන්ත්‍රීවරු කිහිපදෙනෙකුත් කථා කරා. හැබැයි ඒ සභාව ඉවරවුන ගමන්ම ඊට පස්සෙන්දාම සමහර නිළධාරින් අපිට කථා කරා එක කරන්න සුදානම් වගේ හැබැයි දැන් මාසයක් ගියා මීලග සභාවට අපි ඇවිල්ලා ඉන්නේ අදවෙනකම් ඒ කිසිම ගලවපු එකක් නැවත පිළිසකර කරන්න පටන්ගෙන නැහැ. කිහිපයක් ෆ්‍රැන්සිස් මන්ත්‍රීතුමන්ලා මැදිහත්වෙලා පොලිසියත් දැනුම් දිලා සොයාගත්තා. මම නියෝජනය කරන ප්‍රදේශයේ මාර්ග ගණනාවක ඊට පස්සේත් කලින් සිදුවෙච්ච ඒවත් එහෙමයි. දැන් මේ දවස්වල රාත්‍රී කාලයේ අදුරු වේලාවේ හැමදාම මොකක් හරි අනතුරක් සිද්ධ වෙනවා. ඒක නිසා කරුණාකරලා මේ සම්බන්ධව මැදිහත් වන ලෙස ඉල්ලා සිටිනවා.

**<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රීතුමා, පලවෙනි මාසේ ඔබතුමා කථා කරපු එක සම්බන්ධයෙන් මේ වෙනකොට ඔබතුමාගේ ඉල්ලිම පරිදිම අදාල සොරුන් හදුනාගෙනත් තියෙනවා කියලා. මේ සම්බන්ධයෙන් සිමෙන්ති වලින් ඒ කටයුතු කරන්න අදාල වෙන සිමෙන්ති 25 ක් විතර ගෙන්ව ගත්තා ආයතනයකින් ඒ කටයුතු කරන්න සුදානම් කර තියෙනවා කියලා මම ඔබතුමා එන්න ඉස්සෙල්ලා ප්‍රකාශයක් කරා.

**<u>මහ නගර සභා මන්ත්‍රී - එච්.ප්‍රදීප් ශ්‍රියන්ත ප්‍රනාන්දු මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, මම කියන්නේ පොඩි පැහැදිලි කිරිමක් මේක තමයි ගිය සභාවෙත් වුනේ. ගිය සභාවෙත් ඔබතුමා කිව්වා සිමෙන්ති ගෙනල්ලා ඒක කරන්න කියලා ඊට පස්සේ නිළධාරින් කිව්වේ ඔබතුමා අද තමයි කිව්වේ සිමෙන්ති පිටින් හරි වැඩිගානට හරි අරගෙන කරන්න කියලා. ඒක තමයි උත්තරය දැන් මාසයක් ගිහිල්ලා තාමත් අපි එතන ඉන්නේ. නැවතත් ඔබතුමාගේ අවධානය එයට යොමු කරනවා.

**03(8)** **<u>මහ නගර සභා මන්ත්‍රී - ඒ.එච්.සුදේෂ් ඉන්ද්‍රජිත් කුමාර මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, පහුගිය දිනෙක විශේෂයෙන් අපේ සොයිසාපුර කසල රථයේ රියදුරු මහතාට කිසියම් පහරදිමක් සිද්ධවෙනවා. ඒ පිළිබදව ඒ ප්‍රදේශයේ නියෝජනය කරන මන්ත්‍රීවරයා ලෙස මට සැල වු වහාම මම ඒ අදාල අයගෙන් ප්‍රශ්ණ කිරිම් කරාම ඒ පහරදිම සිද්ධවෙලා තියෙන්නේ අපේ බෙල් අංශයේ ඒ අංශය භාරව ඉන්න සුපවයිසර් මහත්තයාගෙන් කියලා තමයි අපිට දැනගන්න ලැබුනේ. ඔහු එම පහරදිම සිදුකොට තියෙන්න ආසන්නම හේතුව මේ රියදුරු මහතා තමන්ගේ රාජකාරි කටයුත්තේදි යම් ප්‍රමාද වෙලා එම ස්ථානයට කසල රැගෙන ආවා කියන කාරණය මත තමයි මෙම පහරදිම සිදුවෙලා තියෙනවා කියලා

කියන්නේ. ගරු නගරාධිපතිතුමනි, අපේ ආයතන සංග්‍රහයේ කිසිම තැනක කාටවත් බලයක් දීලා නැහැ පහරදීම් කරන්න. කිසියම් සේවකයෙක් හෝ නිළධාරියෙක් කිසියම් ආකාරයක වරදක් කරනවානම් ඔවුන් අතින් විනය විරෝධි ක්‍රියාවක් සිද්ධ වෙනවා නම් එකට අදාලව ක්‍රියාමාර්ග ගැනීමේ පූර්ණ බලතල පූර්ණ අයිතිය මේ සභාවේ ඒ අදාල පාර්ශවයන්ට තියෙනවා. එහෙම නැතිව කිසිකෙනෙකුට තමන්ගේ දේශපාලන බලය පාවිච්චි කරලා හෝ වෙනයම් බලයක් පාවිච්චි කරලා පහරදීම් සිදුකරන්න කාටවත් අයිතියක් නැහැ. ඔබත් දන්නවා මේ රියදුරු මහතා ඉතා අහිංසක රියදුරු මහතෙක්. දිර්ඝ කාලයක් සේවය කරන කෙනෙක් ඉතා හොඳින් සේවය කරන කෙනෙක් මා පුද්ගලිකව දන්න රෝෂන් මහත්තයා ඉතින් මට මේ කියාගන්න ඕන වුනේ ඔබතුමාලා මේ සම්බන්ධයෙන් ගත්ත ක්‍රියාමාර්ගය කුමක්ද අපි විශ්වාස කරනවා මෙය පලවෙනි අවස්ථාව හෝ අවසාන අවස්ථාව නෙමෙයි. මෙවැනි අවස්ථා ගණනාවක් මේ ආයතනය තුල සිද්ධවෙලා තියෙනවා. කිසිම කෙනෙකුට තවත් කෙනෙකුට පහරදීමක් කරන්න බලයක් දීලා නැහැ නගරාධිපතිතුමා. ඒක ඔබතුමා හොඳින් දන්නවා. මේ පිළිබඳව විධිමත් පරික්ෂණයක් කරන්න. නැවත මෙවැනි ආකාරයේ සිදුවීම් සිදුනොවෙන්න ඔබතුමාලා මේකේ පාලකයෝ ලෙස ඒ අදාල මැදිහත්වීම කරන්න කියන ඉල්ලීම කරනවා.

<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමා, අදාල කාරණය එවෙලේම විසඳලා ඉවරයි. විධිමත් පරික්ෂණයක් අවශ්‍යනම් ඔබතුමාට විධිමත් පරික්ෂණයක් සභාවෙන් ඉල්ලන්න. කිව්වාට විධිමත් පරික්ෂණයක් දෙන්න බැහැ. අදාල වෙන්නාවූ රියදුරු විසින් විධිමත් පරික්ෂණයක් ඉල්ලුවොත් අපි විධිමත් පරික්ෂණයක් කරන්නම්.

<u>මහ නගර සභා මන්ත්‍රී - ඒ.එච්.සුදේෂ් ඉන්ද්‍රජිත් කුමාර මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, ඒක හරි එතුමා එ කටයුත්ත ලිඛිතව දෙන්න ගියාම එතුමාට යම් බලපෑම් සහ යම් බියවැද්දීම් නිසා පැත්තකට වුනා කියන කාරණය තමයි අපිට දැනගන්න තියෙන්නේ.

<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට කියලා සභාවටත් කියන්න භය කමක් නැත්නම් එතුමාට තියෙන්නේ ලිඛිතව

<u>මහ නගර සභා මන්ත්‍රී - ඒ.එච්.සුදේෂ් ඉන්ද්‍රජිත් කුමාර මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, එතුමා නෙවෙයි කිව්වේ මමයි කිව්වේ. ඔහු මට කියන්න ආවේ නැහැ. මහජන නියෝජිතයෙක් ලෙස මට ලැබිච්ච තොරතුරකට අනුව තමයි මම ගිහිල්ලා ප්‍රශ්ණ කරේ.

<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමා, විධිමත් පරික්ෂණයක් කරන්න පුලුවන් කිසිම ගැටලුවක් නැහැ. හැබැයි එතුමාගෙන් එන්න ඕන විධිමත් පරික්ෂණයක් ඉල්ලලා.

**03(9) <u>මහ නගර සභා මන්ත්‍රී - ඒ.එච්.සුදේෂ් ඉන්ද්‍රජිත් කුමාර මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, අපි නැවත නැවතත් ඉල්ලීමක් කරනවා මෙවැනි සිදුවීම් සිදුවෙන්න ඉඩදෙන්න එපා. කිසිම කෙනෙකුට පහරදීම් කරන්න අයිතියක් නැහැ. එක ඉතාම අවධාරණයෙන් අපි කියනවා. ඊළග කාරණය සොයිසාපුර ප්‍රදේශයේ දීර්ඝ කාලයක් විශේෂයෙන් නවෝදයා පාරේ ජනතාවගේ ඉල්ලීමක්. එය අද ඉටුවෙනවා. ඒ පිළිබඳව අපිට සතුටුයි. මාර්ගය සංවර්ධන කටයුත්තක් හැබැයි ගරු නගරාධිපතිතුමණි, කිසියම් මාර්ගයක් සංවර්ධනය කිරීමේදි ඒ ප්‍රමුඛතම කාර්යය වෙනවා. ඒ මාර්ගයේ ජල බැස්ම පිළිබඳව අවධානයට ලක්කිරීම. අපේ මොරටුවේ මාර්ග ගණනාවක් මේ ජල බැස්ම පිළිබඳ අවධානයට ලක් නොකර තමන්ගේ දේශපාලන අරමුණු වෙනුවෙන් හෝ කොමිස් කුට්ටිය වෙනුවෙන් මේ මාර්ග සංවර්ධන කටයුතු සිද්ධවෙනවා එක තමයි ඇත්ත. මේ කටයුත්තේදි ඔබතුමා දැනුවත් කියලා මම විශ්වාස කරනවා. මමත් එ ස්ථානයට ගියා. මම සොයිසාපුර නෙමෙයි මොරටුවේ ඕනැම කටයුත්තකට මට කිසියම් කෙනෙක් දැනුම් දුන්නානම් මම එ ස්ථානයට යනවා. එක මගේ අයිතිය. ඒ අයිතිය නවත්වන්න කාටවත් බැහැ. එතකොට අපි ඒ ස්ථානයට ගියාට පස්සේ. ඒ ස්ථානයේ කවුරුත් අපි දන්න විධියට පාර සංවර්ධනය කරනවාට විරුද්ධ නැහැ. ඉතාම සතුටෙන් එ ජනතාව ස්තුතිත් කරා ඔබතුමාත් එක්ක කථාකරන්න ඇති. නිතිඥ මහත්තයෙක් තමයි විශේෂයෙන්ම මේ පිළිබඳව අපිවත් දැනුවත් කරේ. එතකොට ඒ අයගේ දිගින් දිගටම ඉල්ලීම තියෙනවා පාර සංවර්ධනය කරද්දි ජල බැස්ම පිළිබඳව විශේෂයෙන් අවධානයට ලක්කරන්න. මේ පාර අපිට දැනෙන විධියට අගල් 7 ක විතර ලේයර් එකක් ඉස්සෙනවා ඉස්සුනාට පස්සේ දෙපැත්තේ වැහි වතුර සියල්ල නිවෙස් වලට තමයි යන්නේ. මේක බරපතල ප්‍රශ්ණයක්. කාණු පද්ධතියක් මුකුත් නැහැ. එනිසා එගොල්ලන්ගේ ඉල්ලීම තිබුනේ ජල බැස්මට අදාල විසඳුම් දිලා මේ සංවර්ධන කටයුත්ත කරන්න. ඔබතුමා පොරෝන්දුවෙලා තියෙනවා ලබන මැයි ජූනි වෙනකොට කාණු පද්ධතියක් එයට ලබාදෙන්න ඔබතුමා පොරෝන්දුවෙලා තියෙනවා. අප විශ්වාස කරනවා එයත් ඉක්මණට ලැබෙයි කියලා. ඒ කටයුත්තත් ඉක්මණින් ඉටු කරන්න කියන ඉල්ලීමත් ඒ ජනතාව වෙනුවෙන් අපි ප්‍රකාශ කරන්න කැමතියි. නැවතත් අපි ඔබතුමාලගෙන් ඉල්ලීම් කරන්නේ මාර්ග සංවර්ධනයේදි කරුණාකරලා මේ ජලබැස්ම පිළිබඳව වඩාත් අවධානයට ලක්කරන්න. ඕනාවටත් වඩා උදාහරණ අපිට තියෙනවා කොරලවැල්ල එගොඩඋයන ප්‍රදේශයේ පාරවල් සංවර්ධනය වුනාට වැඩක් නැහැ වතුර බහින්න ක්‍රමවේදයක් නැත්නම්. ඒමගින් නැවතත් ජනතාවට පීඩාවක් වෙනවානම් ඒම සංවර්ධනයෙන් කිසි තේරුමක් නැහැ කියලායි අපේ අදහස. ඒනිසා ඉක්මණින් එ කාණු පද්ධතියත් ලබාදෙන්න කියන ඉල්ලීම කරනවා.

**<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රීතුමා, බොහෝම හොඳයි මට නිතිඥ මහත්තයෙක් කථාකරා. කථාකරපු කාරණා සම්බන්ධයෙන් මම කථාකරන්න යන්නේ නැහැ. මොකද එතුමන්ලාට ඕනවේලා තිබුනේ සංවර්ධන කටයුත්තට කියන එක ලොකු ප්‍රශ්ණයක් වෙලා තිබුණා. ඔබතුමා මගේ ගෙවල් පැත්තට ඇවිල්ලා තියෙනවානම් මගේ ගෙවල් පැත්තේ මගේ පාරේ මගේ සීයා තාත්තාගේ ප්ලෑන් එකේ තියෙන්නේ 1938 වර්ෂයේ තාමත් කාණුවක් නැහැ. කාණුව කියන එකේ සංවර්ධනය පලවෙනි ඉලක්කම නෙමෙයි. කාණු නැතිව ඕන තරම් වතුර බහින තැන් තියෙනවා. වතුර බස්සගන්න ක්‍රමවේදයකුත් තියෙනවා. එතන මගේ සහොදර ඥාතියෙක් වගේ හිටපු සහෝදර මල්ලි කෙනෙක් කථාකරලා කිව්වා. ඒ නිතිඥ මහත්තයාට කිව්වා කියලා දැන්

අවුරුදු තිස්ගාණකට හතලිස් ගානකට ඉස්සේල්ලා තියෙන ඔබේ පාරට තාම තාර දාලා නැති නිසා පාරට වඩා පොඩ්ඩක් උස්සගත්තා නම් ඔක හරියනවා ඔව් මල්ලි මේක කරනවා කියලා ඒ ප්‍රශ්නෙත් විසඳුනා. එකත් විසඳලා දැම්මා දුරකථනයෙන්ම විසඳුනා. නමුත් කරන්න ගියේ එක නෙමෙයි කුපිත කරලා ඔය කියන නිතිඥ මහත්තයා කව්ද කියලත් ඔබතුමා හොදට දන්නවා. යම්කිසි සංවර්ධන වැඩ කරනවා වගේම සංවර්ධන වැඩ නතර කිරිමෙන් රජය අපකිර්තියක් පත්කිරිමේ කටයුත්තක් සිදු කිරිමටත් කුට ලෙස කටයුතු කරමින් ඉන්න අවස්ථාවක් නිසා මම එ නිතිඥ මහත්තයා කව්ද කියන එකත් ඔහුගේ අරමුණුවල් මොනවාද කියන එකත් මම හොයා ගත්තා. එක නිසා විශේෂයෙන්ම පාරක් කරන්න ආවට පස්සේ පාර කරන එක අපේ වැඩක් ටෙන්ඩර් කරලා තියෙන්නේ ආර් ඩී එක අපි නෙමෙයි කොන්ත්‍රාත්කාරයා කලු ද සුදු ද උස ද මිටි ද මහත ද කෙට්ටු ද කියන එක මම දැක්කේ නැහැ. දුරකථනයෙන් විතරයි කථාකලේ මට ඔන වුනේ නවෝදයා උද්‍යානයේ පාර හැදිම පමණයි.එක නිසා එ පාර කෙරෙනවා. ඊට පස්සේ එකට අදාල වෙන්නාවු වතුර බැස්මක් මේ වෙනකොට ඔවුන්ම විසින් සකස් කර ගන්නවා කිව්වා. මට කිව්වේ පාර හදන්න ඔන නැහැ. ඉස්සේල්ලාම කාණු හදන්න කියන එක තමයි කිව්වේ. එහෙම සංවර්ධනය කරානම් මගේ පාරත් මට හදාගන්න හම්බවෙන්නේ නැහැ තව කිහිප කාලයකට. මොකද හේතුව වතුවලින් වතුවලින් බැහැලා තමයි යන්නේ එහෙමනම් කාණුවක් එනකම් මට පාර හදාගන්න වෙන්නේ නැහැ. එනිසා හැමතිස්සේම හැමදේම මෙහෙම වෙන්න ඔන කියලා නිර්නායකයක් නැහැ. එහෙම නිර්නායකයන් හදාගන්න ගියොත් වැඩකරන්න පුලුවන්කමක් හම්බවෙන්නේ නැහැ. ඔබතුමයි මමයි ඇවිදිමු පාරවල් 20ක 30ක කාපට් දාලා තියෙන ගල් අල්ලලා තියෙන තාර දාලා තියෙන අඩු වශයෙන් 13 ක 14 කවත් කාණු නැත. මොරටු වැල්ලේ සිට මෝදර පාලම දක්වා පාරවල් 36 ක් ඇත. කාණු ඇත්තේ පාරවල් 2ක 3කය. අනෙක් ඔක්කොම නැත හැබැයි පාරවල් වල සංවර්ධන කටයුතු නොකොරොත් එකේ ප්‍රශනේ තියෙනවා. ගිය අවුරුද්දටම වැහැලා තියෙන්නේ දවස් 20යි. තුන්සිය හතලිහක්ම කැඩිච්ච පාරක යන්න වෙනවා කාණුව බලබල හිටියොත්. එක නිසා සංවර්ධනය කියන එක විවිධ විදියට යන්න පුලුවන් ඒ අදාල වෙන්නාවු කාරණාත් එක්ක තමයි ඉස්සරහාට යන්නේ. එක වෙන්න වෙනවා. ප්‍රශ්ණයට උත්තර හොයමින් යන්න වෙනවා. එනිසා ඔබතුමාගේ මතක් කිරිම හොදයි. එක නිසා සංවර්ධන වැඩ කරගන්නකොට ක්‍රමවේදයන් තියෙනවා. ඒ ක්‍රමවේදයන් එක්ක අපිත් එක්ක හිටියාම අපි ගහට පොත්ත වගේ එගොල්ලොත් එක්ක ඉන්නවා. නමුත් එහෙම නෙමෙයි නිතිඥ මහත්තයා කථාකරේ නිතිඥ මහත්තයා කථාකරා මට කණගාටුවකුත් ඇතිවුනා. මොකද එවෙලාවේ උත්සවයක් තියෙන වෙලාවේ එතුමා කථාකරේ මම එතුමාට කිව්වා. කිව්වා එතුමා එක පිළිගත්තේත් නැහැ. අවසානේ ප්‍රශ්ණය විසඳුනා. ඔබතුමාගේ දැනුවත්භාවය සම්බන්ධයෙන් ඔබතුමාට බොහෝමත් ස්තුතියි.

**03(10)** **<u>මහ නගර සභා මන්ත්‍රී - ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, ඉස්සරවේලාම ඔබතුමා ගිය මහා සභාවේ අපි ආයවනා හා පෙත්සම් යටතේ ඉදිරිපත් කල එවාට පිළිතුරු ලබාදිම සම්බන්ධයෙන් ස්තුතිවන්ත වෙනවා. හැබැයි මම හිතන්නේ අපි කියපු හැම එකකටම පිළිතුරු ලැබුනේ නැහැ. කොහොම වුනත් පිළිතුරු ලබාදිම සම්බන්ධයෙන් ස්තුතිවන්ත වෙනවා හැබැයි සමහර පිළිතුරු සම්බන්ධයෙන් අපිට සැහිමකට පත්වෙන්න බැහැ. මොකද හේතුව නිළධාරින් විසින් කියන පිළිතුරම ඔබතුමා කියනවානම් එක ප්‍රායෝගික නැහැ. ඊට වඩා පොඩ්ඩක් වෙනස් වන්න ඔනැ. මොකද හේතුව දැන් පාර කැඩුවාම සල්ලි ගෙවන්න බැහැ. මම එක පිළිගන්නවා. මම කිව්වානේ සභාවේ කථාවේදි සල්ලි ගෙවන්න බැහැ. එකට මොකක් හරි ක්‍රමවේදයක් තියෙන්න ඕන. නැත්නම් අපේ ක්‍රමවේදයක් තියෙන්න

ඔන පාර කඩනවානම් අහවල් දවසේ සතියක් ඇතුලත නගර සභාව හදන ක්‍රමවේදයක් තියෙන්න ඕන. එහෙම එකක් හදන්න ඔන. එහෙම නැත්නම් මිනිස්සුන්ට අවස්ථාවක් තියෙන්න ඕන. එක හදලා පෙන්නන්න කියලා දෙකෙන් එකක් කෙරෙන්න ඕන. ඒනිසා අපි අවධානය යොමුකරනවා. ඔබතුමාගේ නාගරික ඉංජිනේරු දෙපාර්තමේන්තුව සමග එකතුවෙලා එහෙම වැඩ පිළිවෙලකට යන්න කියලා මොකද ඒක හොදයි සභාවෙන් ක්‍රියාත්මක වෙන වැඩසටහන හොදයි. අනෙක්ව සම්බන්ධයෙන් අපි ස්තුතිවන්ත වෙනවා. තව තියෙනවා මේකේ හොරකම්. සැපයුම් අංශය සම්බන්ධයෙන් කථාකරපු එකට ඔබතුමා පිළිතුරක් දුන්නේ නැහැ. මොකද ඔබතුමා එදා කියලා තිබ්බා විමධ්‍යගත කරනවා කියලා. ඒ ආයතනවලට සැපයුම් සම්බන්ධයෙන් ඔබතුමා පිළිතුරු දුන්නේ නැහැ. ගරු නගරාධිපතිතුමණි, තව ප්‍රශ්ණයක් තියෙනවා. සේවකයො සම්බන්ධයෙන් සේවකයෝ උදේට වැඩට එන කොට විශාල අපහසුතාවයට පත්වෙනවා. ත්‍රිවිල්වල එන සේවකයෝ ඉන්නවා මෝටර් සයිකල්වල එන සේවකයෝ ඉන්නවා. කාර්වල එන සේවකයෝ ඉන්නවා. විවිධාකාර වාහන වල එනවා. හැබැයි වාහන නවත්වන්න තැනක් නැහැ. නගරාධිපතිතුමා, මම දන්නෙ නැහැ හේතුව මොකක්ද කියලා ට්‍රැෆික් හෝන් දාගෙන ඉන්නවා ඉස්සරහා ඉතාමත්ම අවලස්සනයි. මම දන්නේ නැහැ එක කාටද ලස්සනට පෙන්නේ කියලා. එකක් නගර සභාවේ තියෙන ලස්සන සම්පූර්ණයෙන්ම ගිහිල්ලා තියෙන්නේ මේ දාලා තියෙන එකෙන්. ඔබතුමා ලී වලින් මේවා ගහලා අරවා මේවා කරලා ලස්සනට සිකියුරිටිනම් හදලා නගර සභාව ලස්සන කරන්න උත්සහා කරාට වැඩක් නැහැ. එතනින් යනකොටම මහා අවලස්සන දර්ශනයක් තමයි ඒ හෝන්ස් වලින් තියෙන්නේ. එකක් අනෙක් එක තමයි ඉතාමත් පටු පාරක් තියෙන්නේ ඉස්සරහා විශාල වාහන ප්‍රමාණයක් යනවා සේවකයො තුන්හාරසියයක් එනවා කාඩ් එක ගහන්න. සේවකයන්ට වාහන නවත්වන්න තැනක් නැහැ. හැමතැනම වාහන නවත්වනවා නවත්වලා දුවගෙන එනවා ලොකු අනතුරක් වෙන්න ඔන්න මෙන්න වගේ තියෙනවා එතන. ඒනිසා අපි බොහෝම ගෞරවයෙන් ඉල්ලනවා එකට වැඩ පිළිවෙලක් හදන්න කියලා. සේවකයන්ට උදේ වාහන නවත්වලා ඇවිල්ලා කාඩ්එක ගහන්න පුලුවන් වැඩ පිළිවෙලක් හදන්න කියන ගෞරවනිය ඉල්ලීම කරනවා. එත් එක්කම ගරු නගරාධිපතිතුමණි, සේවකයෝ අපි දකිනවා මේ හැමතැනම වාහන නවත්වලා තියෙනවා. බයිසිකල් නවත්වලා යනවා ත්‍රිවිල් නවත්වලා යනවා තමන්ගේ වාහන ටික හැමතැනම නවත්වලා යනවා. හැබැයි මේ වාහන වල ආරක්ෂාවක් නැහැ. කාටවත් කියන්න බැහැ අපි මේවට ආරක්ෂාව දෙනවා කියලා අපි එයට බැදිලත් නැහැ බැදෙන්නත් බැහැ. හැබැයි අපිට වගකිමක් තියෙනවා සේවකයන්ගේ මොටර් සයිකලයක් කියන්නේ එ සේවකයන්ගේ සම්පත එක නැතිවුනොත් එහෙම සේවකයන්ට ජීවිත කාලයටම ගන්න හම්බවෙන්නේ නැහැ. ත්‍රිවිල් එක කියලා කියන්නේ සේවකයාගේ තියෙන වත්කම එක නැතිවුනොත් නැවත ජීවිත කාලයටම ගන්න හම්බවෙන්නේ නැහැ. මෝටර් රථ උස්සගෙන යන කාලේ මේ බයිසිකලයක් නැතිවුනොත් ත්‍රිවිල් එක නැතිවුනොත් ත්‍රිවිල් එකේ බැටරිය නැතිවුනොත් එහෙම ලොකු ප්‍රශ්ණ තියෙනවා. එ නිසා අපි ගෞරවයෙන් ඉල්ලනවා මේකට වැඩ පිළිවෙලක් හදන්න නිළධාරින් එක්ක කථාකරලා අපෙ සේවකයන්ගේ වාහන ගාල් කරන්න පුලුවන් ස්ථාන. ඒ ස්ථාන වලට වාහන ගාල් කරලා සිකියුරිටි එකේ එක්කෙනෙක් හරි එතනට දාලා මේක පිළිවෙලක් හදන්න ගරු නගරාධිපතිතුමණි. මේ නගර සභාව බිල්ඩින් හදලා ලස්සන වුනාට එකට පිළිවෙලක් නැතිවුනාම හරි ප්‍රශ්ණයක්. සේවකයා උදේ බයිසිකලය දාලා ගිහිල්ලා හවසට එන්නේ කුණු ට්‍රැක්ටරයේ යන සේවකයා උදේ ගියාම රෑවෙලා එන්නේ. ඒ මනුස්සයාගේ බයිසිකලයට. ඒ මනුස්සයාගේ ත්‍රිවිල් එකට ආරක්ෂාවක් තියෙන්න ඔන. ඒනිසා අපි ගෞරවයෙන් ඉල්ලනවා ඒ සේවකයන්ගේ වාහන ගාල් කරන්න ස්ථානයක් සකස් කරලා දෙන්න පිළිවෙලක් හදලා

දෙන්න. අතන හොන්ස් ටික අයින් කරන්න කියලා ගෞරවනීය ඉල්ලීම කරනවා. අනෙක් එක තමයි සමහර විශේෂ වරප්‍රසාද ලාභින්ගේ වාහන කෙලින්ම ඇතුලට ඇවිල්ලා කාඩ් ගහලා යනවා ඊට අමතරව ඇතුලේ උදේ ඇවිල්ලා ඒ ඒ තැන්වල පාර්ක් කරනවා එවා කොහොම එනවාද කියලා අපි දන්නේ නැහැ. හැබැයි සමහරුන්ට එහෙමයි සමහරුන්ට මෙහෙමයි. එහෙම ප්‍රශ්ණ තියෙනවා. ඒනිසා ගරු නගරාධිපතිතුමණි, අපි ඉල්ලනවා ඔබතුමාගෙන් මෙයට මැදැහත් වෙන්න. මැදිහත්වෙලා ඔබතුමා පෞද්ගලික අවධානය යොමුකරලා මේ සම්බන්ධයෙන් විසඳුමක් දෙන්න කියන ගෞරවනීය ඉල්ලීම කරනවා.

ගරු නගරාධිපතිතුමනි, තව ප්‍රශ්ණයක් තියෙනවා. සාමාන්‍යයෙන් මෙතන ඉන්නවා උසස් පෙලට කොමස්කරපු ගොඩක් දෙනෙක් ඉන්නවා. ආර්ට් කරපු ගොඩක් දෙනෙකුත් ඉන්නවා. රක්ෂණ මූලධර්ම කියන එක අපි ඉගෙන ගෙන තියෙනවා. රක්ෂණ මූලධර්මවලත් අපි දකිනවා අපි ඉගෙනගෙන තියෙනවා සාමානයයෙන් වාහනයක් සම්බන්ධයෙන් රක්ෂණයකදි එ රක්ෂණයට වන්දිගන්න පුලුවන් වෙන්නේ එක රක්ෂණ ආයතනයකින් විතරයි. එක ඔබතුමා වාහන හිමිකරුවෙක් හැටියට ඔබතුමා දන්නවා ඇති. ඔබතුමාට බැහැ ඔබතුමාගේ කාර් එක තැන්දෙකක රක්ෂණය කරන්න බැහැ. තැන් දෙකක රක්ෂණය කරලා ඔබතුමාගේ වාහනය අනතුරකට මුහුණ දුන්නොත් තැන් දෙකෙන්ම කරන්න පුලුවන් වෙයි. තැන්දෙකෙන්ම ගන්න බැහැ.එකතැනකින් විතරයි ගන්න පුලුවන්. ඒවගේ හා සමාන සිද්ධියක් සිද්ධවුනා අපේ නියෝජ්‍ය නගරාධිපතිතුමාගේ වාහනය ගිහිල්ලා හැප්පුනා හැප්පිලා එ රියදුරා වාහනය හැප්පුනාට පස්සේ එ වාහනයට වෙච්ච අලාභය රක්ෂණ සමාගම විසින් ප්‍රතිපූර්ණය කරා රක්ෂණ සමාගමෙන්. හැබැයි නාගරික කොමසාරිස්තුමා ලියුමක් ගහනවා ඒ සේවකයාට දඩුවම් ලබාදෙන කොට මෙයා මේ වාහනයට වෙච්ච අලාභය ගෙවන්න ඕන කියලා. පඩියෙන් කපන්න ඕනලු මම දන්නේ නැහැ එක මොන ආයතන සංග්‍රහයේද විනය නිතිවලද මුදල් රේගුලාසිවලද අපි දන්න තරමට එහෙම එකක් කරන්න බැහැ නගරාධිපත්තුමණි. මම තර්ක කරනවා ඕනම නිලධාරියෙක්ගෙන් ඔබතුමාගේ අවසරය පිට ප්‍රකාශයක් කරන්න කියලා. එහෙම පුලුවන්නම් කියන්න කොහෙද තියෙන්නෙ කියලා එහෙම විනය නිති පනවන්න බැහැ. එහෙම සේවකයන්ගෙන් පලිගන්න බැහැ. එක නිතයානුකුල නැහැ. එක නිසා ගරු නගරාධිපතිතුමනි, මෙය රක්ෂණයෙන් හම්බවෙලා තියෙන්නේ මම කියන්නේ මෙහෙමයි රක්ෂණය හම්බවුනේ නැත්නම් අන්න නගර සභාවට පාඩුවක් වෙලා තියෙනවා නම් පාඩුව අයකර ගැනිමේ හැකියාව තියෙනවා සේවකයාගෙන්. අපිට එකට තර්ක නැහැ.

<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රිතුමා, ඔබතුමා කියන කථාව වැරදියි සම්පූර්ණයෙන්ම. හේතුව ඔන කමින්මත් රියදුරේකුට හැප්පුවහැකිනේ අපි රක්ෂණවරණයක් ගන්නේ මම පොඩි මගේ වාහනයේ පොඩි රක්ෂණාවරනයක් අරගෙන කරන්නේ නැහැ නෝක්ලේම්වලට අපිට යන්න පුලුවන්. එතකොට රක්ෂණාවරණය අවසානේදි එක අඩුකිරිමක් කරගන්න පුලුවන් ලැබෙන මුදලින් අපි හිතමු රියදුරු මහතාවිසින් නොසැලකිලිමත් කමින් ෆෝන් එකක් කනේ ගහගෙන ගිහිල්ලා කාවහරි හැප්පුවාට පස්සේ මොකක් හරි වුනාට පස්සේ එතකොට අපිට නෝක්ලෙම් නැතිවෙනවා. සම්පූර්ණ ක්ලේම් එක කරනවා. හැබැයි එක වෙලා තියෙන්නේ රියදුරාගේ නොසැලකිලිමත් කමින්නම් රියදුරාගෙන් අයකිරිමක් කරන්න ඕන. නැත්නම් ඕනකමින් හප්පන්න පුලුවන්නේ. මේක කරන්න ඕන.

<u>මහ නගර සභා මන්ත්‍රී - ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, ඔබතුමත් රියදුරෙක් මමත් රියදුරෙක් මේ නගර සභාවට ආවාට පස්සේ තමයි අපි දෙන්නාම රියදුරෝ බවට පත්වෙලා. එ නිසා ගරු නගරාධිපතිතුමණි මම දන්න නිතියත් අනුව ඔබතුමා දන්න නිතියත් අනුව අපි ගිහිල්ලා සාමාන්‍යයෙන් ඕනකමින් හප්පන්නේ නැහැ වාහනයක්. එක රියදුරෙක් කරන වැඩක් නෙමෙයිනේ. අපි හිතමු ඕනකමින් හැප්පුවා කියලා ඕනකමින් හැප්පුවා කියලා ඔප්පු කරන්න බැහැ. ඕන කමින් හැප්පුවා කියලා අයකරගන්නත් බැහැ. රක්ෂණ සමාගම ගෙවනවානම්.

<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමා මම හිතන්නේ සභාවේ කථාකරන්න ඕන දෙයක් නෙමෙයි කෙනෙක්ව හැප්පුවා හැප්පුනා කියන එවා පරික්ෂාකරන්න ඕන තරම් යන්ත්‍ර සුත්‍ර දැන් තියෙනවා. හප්පන එකයි හැප්පෙන එකයි පරික්ෂා කරන්න ඕන තරම් යන්ත්‍ර සුත්‍ර දැන් තියෙනවා. එක නිසා මෙකට කාටවත් කියන්න බැහැ හැප්පුවාද හැප්පුනාද කියලා කියන්න ඕන නැහැ .නමුත් එකම දේ තියෙන්නේ ඔහු විසින් කරලා තියෙන එක ඔහුගේ අත්වැරද්දකින් වෙනවානම් තිරිංගත් තියෙනවානම් බ්‍රේක් හොදට පැගෙනවානම් බ්‍රේක් තියෙනවානම් එවා සම්පුර්ණයෙන්ම තියෙනවානම් අපේ අතිනුත් නොදැනුවත්කමින් හැප්පෙන්න එවා තියෙනවා වෙනකෙනෙක්ගේ වරදින් හැප්පෙන එවා තියෙනවා. එ දෙක දෙපැත්තට බෙදෙනවා. එක නිසා මම හිතන්නේ ඔහුගේ අතේ වරදක් වෙලා නැත්නම් නියම දේ තමයි මෙකෙන් අරගෙන දෙන්න ඕන නැහැ එනිසා ඔහුනම් වැරදි එයාගෙන් ගන්න ඕන.අපෙන් කැපෙන්න බැහැනේ.

<u>මහ නගර සභා මන්ත්‍රී - ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, මෙක රක්ෂණයෙන් අරගෙන තියෙන්නේ ප්‍රතිපුර්ණය වෙලා ඉවරයි.රක්ෂණයෙන් ප්‍රතිපුර්ණය වෙලා ඉවර එකක් කෙහොමද සේවකයාගෙන් අයකරන්නේ කියන එක එහෙම අයකරගන්න බැහැ. අනෙක් එක තමයි නගරාධිපතිතුමා අපි කොච්චර වාහනයෙන් හොදට ගියත් අනතුරක් වෙන්න පුලුවන්. වාහන එළියට දැම්මට පස්සේ අනතුරු වෙනවා කියන එක තර්කයක් නෙමෙයි. ඕන වේලාවක අනතුරක් වෙන්න පුලුවන්. අනතුරු විමේ සම්භාවිතාව තත්පරයෙන් දාහෙන් පංගුවයි. ඒනිසා ගරු නගරාධිපතිතුමණි, මෙක ප්‍රායෝගිකව මේ සේවකයාගෙන් අයකරගන්න බැහැ. අපි දන්න නිතිය අනුව එහෙම නැත්නම් නිති හදන්න වෙනවා. නිති හදලා අයකරගන්න වෙනවා. ඒනිසා ගෞරවයෙන් ඉල්ලනවා ඔබතුමාගෙන් සේවකයන්ගෙන් මේවිදියට පළිගන්න දෙන්න එපා. මෙක පළිගැනිමක්. මෙහෙම පළිගැනිම් කරන්න දෙන්න එපා. අහිංසක සේවකයෝ මේ. තව තියෙනවා සෙවකයෝ එනවා වැඩට සේවකයා කාඩ් එක ගහනවා වැඩකරනවා චාර්ජ් එක එන්නේ තව මාස එකාමාරකට පස්සේ සේවකයා වැඩ කරලා වැඩ අරගෙන මාස එකාමාරකට පස්සේ සේවය අත්හිටුවන්නේ. වැඩකරපු මාස එකාමාරෙත් පඩි කපනවා. ඒ මිනිහා මෙකට වැඩකරාට පස්සේ වැඩ කරපු මාස එකාමාරේ පඩි කපනවා. මම අහන්නේ එහෙම කොහෙද නිති තියෙන්නේ. එහෙම කොහොමද කරන්නේ. එහෙම කරන්න බැහැ නගරාධිපතිතුමා. එහෙම කරන්න බැහැ. ඒනිසා ගරු නගරාධිපතිතුමනි, මම කියන්නේ ඒකයි ඔබතුමාට හැර අපිට වෙන කියන්න කෙනෙක් නැහැ මේකේ. ඒනිසා අපි කියන්නේ ඔබතුමා මෙක පාට කණ්ණාඩි එක එක කෝණ කණ්ණාඩි වලින් බලන්නේ නැතිව ප්‍රධානියා හැටියට සියලුදෙනාට සාමාන ආකාරයෙන් සේවකයෝ දිහා බලලා තින්දුවක් ගන්න මේ තින්දුව ගන්න මෙක මේ මිනිහාට මේ දඩුවම

දේන්න පුලුවන්ද බැරිද ඒ දඩුවම දෙන්න බැහැ. එහෙම නැත්නම් ගරු නගරාධිපතිතුමණි, මේ නිති වැඩක් නැහැනේ. අපි ඉදලා වැඩක් නැහැනේ මේ සභාවේ අපි කථා කරන්නේ මේ නිතිය ක්‍රියාත්මක කරන්න එපා කියන ගෞරවනිය ඉල්ලීම ඔබතුමාගෙන් කරනවා. ඒවගේම තමයි ගරු නගරාධිපතිතුමණි, මේක පඩි කපලා තියෙනවා. මාස තුනක මාස එක හමාරක් ඒ මනුස්සයා වැඩ කරලා තියෙනවා. ඒ සම්බන්ධයෙනුත් සලකා බලන්න කියන ගෞරවනිය ඉල්ලීම කරනවා. ඔබතුමාගෙන් ඔබතුමා ෆයිල් එක ගෙන්නලා බලන්න. බලලා ඔබතුමා තින්දුවක් ගන්න සාධාරණ තින්දුවක් නම් අපි අත් දෙකම උස්සනවා.

ගරු නගරාධිපතිතුමනි, ඔබතුමා ඇවිල්ලා අවුරුදු 16ක් අපිත් ඔබතුමාගේ සහචරයෝ බවට පත්වෙලා අවුරුදු 16ක්. මමත් නියෝජ්‍ය නගරාධිපතිවෙලා සිටියා අවුරුදු 8ක් ද කොහේද. මම අහන්නේ ඔබතුමා අවුරුදු 16ක් නගරාධිපති. අපි දැක්කා මේකේ නාගරික කොමසාරිස්ගේ ඉදලා මේ ඉන්න නිළධාරින්ගේ ඉදලා යම් යම් දැනුම් මට්ටම් යම් යම් අධ්‍යාපනික මට්ටම් තියෙන සේවක මහත්ම මහත්මීන් ඉන්නවා. නිළධාරි මහත්ම මහත්මීන් ඉන්නවා. හැබැයි මේ එක නිළධාරි මහත්මෙක්වත් මීට ප්‍රථම තමන්ගේ උපාධිය ඔලුවට අරගෙන තමන්ගේ අධ්‍යාපනය ඔලුවට අරගෙන ඔලුව ඉදිත්මගෙන වැඩ කටයුතු කරලා නැහැ කිසිම නිළධාරියෙක්. සුහදව හැමොමත් එක්කම වැඩ කරලා තියෙනවා. කවදාවත් මම තමයි උගතා මම තමයි ජගතා කියලා වැඩ කරලා නැහැ. පැහැදිලිව කියන්න ඔන එක. අවුරුදු 15ක් අපිත් එක්ක වැඩකරපු නිළධාරින් ඉන්නවා මෙතන එකාල සිමාව තුල. ඒනිසා ගරු නගරාධිපතිතුමණි දැන් මේ නගර සභාවට අලුතින් ආව උපාධිධාරින් පිරිස සංවර්ධන නිළධාරින් පිරිස තමන්ගේ හිතුමතේට වැඩකරන්න පටන් අරගෙන තියෙනවා. නිළධාරියෙක්ව ගණන් ගන්නෙ නැහැ.කිසිම ගරු සරුවක් නැහැ ඉහල නිළධාරියෙකුට. තමන්ට ඔන විදියට මේකේ නාගරික කොමසාරිස්වරයා එක සැරයක් ගහනවා ට්‍රාන්සර් එක එක කැන්සල් කරනවා. දෙවෙනි සැරේත් ගහනවා ට්‍රාන්සර් එකක් එකත් කැන්සල් කරනවා. මම අහන්නේ අඩුම තරමේ නාගරික කොමසාරිස්වරයාගේ ගෞරවය හරි ආරක්ෂාවෙන විදියට වැඩ කරන්න ඔන එත් නැහැ. ඒනිසා ගරු නගරාධිපතිතුමණි, අපි බොහෝම ගෞරවයෙන් ඉල්ලනවා අපිට අනවශ්‍ය ප්‍රශ්ණ නිළධාරින් එක්ක ඇතිකරගන්න තියන්න එපා. මේ ඔබතුමාට අපි කරන පැමිණිල්ලක්. ආයාචනයක් අපි ඔබතුමාට කරන්නේ. ඒ නිළධාරින්ට උපදේස් දෙන්න. නගර සභාවේ වැඩ කරන්නේ සමහර වේලාවට බලන්න නගර සභාවට ඔබින විදියටද ඇදගෙන ඒන්නේ කියලා සමහර ඇදුම් මේ අපේ කිසිම නිළධාරියෙක් කරපු නැති වැඩක් දැන් වෙන්නේ. ඒනිසා අපි ගෞරවයෙන් ඉල්ලනවා ඔබතුමාගෙන් මේ නිළධාරින් ගෙන්නලා උපදේස් දෙන්න. ඔබතුමා මේ නගර සභාවේ වැඩකරන්නේ කියලා මේක ආයතනයක් මේ ආයතනය තුල වැඩ කරන්නේ. ගොඩක් ඔක වෙලා තියෙන්නේ මෙහෙමයි ඔතන ඉන්නේ බහුතරයක් කැම්පස් එකට අඩිය තියපු නැති මිනිස්සු. බාහිර උපාධිය කරපු අය තමයි බහුතරයක් ඉන්නේ. එනිසා උපාධිය ඔලුවට අරගෙන තියෙන්නේ. එහෙම ප්‍රශ්ණයක් තියෙනවා. හැබැයි එගොල්ලන්ට අමතක වෙනවා මේකේ මන්ත්‍රිවරුත් වෙලා ඉන්නවා ඉගෙන ගත්ත කට්ටිය ඊට වඩා පල්ලේහා සේවකයෝත් ඉන්නවා. උපාධි මාස්ටර් එක තියෙන කට්ටිය ඒනිසා ගරු නගරාධිපතිතුමණි එගොල්ලෝ විතරක් නෙමෙයි මේකේ උපාධිය තියෙන අය ඉන්නේ කියලා ඔබතුමා නගර සභාවේ විනය හා පැවැත්ම ක්‍රමවේදය පොඩ්ඩක් කියලා දෙන්න කියන ගෞරවනිය ඉල්ලීම කරනවා.

**03(11)** <u>මහ නගර සභා මන්ත්‍රී - ජී.එම්.සුරංග නිශාන්ත අපෝන්සු මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, ලක්ෂපතිය ශ්‍රේෂ්ඨාරාම විහාරස්ථානය ඉදිරිපිට මාර්ගයේ කෙලවරේ ඉඩමක් තියෙනවා ඉඩමේ අනවසරයෙන් මහා පරිමාණ ගරාජයක් පැවැත්වීම සඳහා සියලු කටයුතු සූදානම් කර තියෙනවා ගරු නගරාධිපතිතුමණි. නේවාසික කලාපයක් තුල නිවාස බහුතරයක් මැද්දේ මේ අනවසර ගරාජයක් තැනීම සම්බන්ධයෙන් ජනතාවට විශාල පීඩාකාරී තත්වයක් උද්ගත වෙනවා ගරු නගරාධිපතිතුමණි. මේ ගරාජයේ පින්තාරු කටයුතු ආරම්භ කිරීමටත් එම ගරාජයේ ඇතැම් ශබ්ද දූෂණ ඇතිවීමටත් ඉඩ තියෙනවා. කරුණාකර හැකි ඉක්මණින් නගර සභාවේ කිසිදු බලපත්‍රයක් අවසරයක් මධ්‍යම පරිසර අධිකාරියේ කිසිදු අවසරයකින් තොරව මෙම ස්ථානයේ මහජන පීඩාකාරී ලෙස ගරාජයක් පැවැත්වීමට කටයුතු සූදානම්කර තියෙනවා. ඒ සම්බන්ධයෙන් කඩිනමින් මේ සභාව මැදිහත්වෙලා අවශ්‍ය නීතිමය ක්‍රියාමාර්ග ගන්නා ලෙස ගරු සභාවෙන් ඉල්ලා සිටිනවා.

<u>මහා නගර සභා මන්ත්‍රී - ආර්.එම් ඒ. දෝන දිලාශිනි රාජකරුණා මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමනි, මම මීට වසර එකහාමාරකට පමණ පෙර මේ සභාවේදී කතා කරා සොයිසාපුර කොට්ඨාශයේ මේ තරුණ දරුවන් පිරිසක් සහා තවත් පිරිස් මේ කල්ලි ගැහිලා පාරවල් වල අඩදබර කරගෙන ඔලු පාලාගෙන ප්‍රශ්නයක් ඇතිකරගෙන පොලිස්සියට ඒ පිළිබඳ පැමිණිල්ලක් කලා කියලා. ඒ පිළිබඳව ඔබතුමාගේ අවදානයත් යොමු උනා. නමුත් නගරාධිපතිතුමනි, සොයිසාපුර කොට්ඨාශයේ විශාල ජනතාවක් ජීවත්වෙන ප්‍රදේශයක්. නිතර පාරේ ගමන් කරනවා. ඒවගේම දරුවන් මත්ද්‍රව්‍යා වලට අබ්බැහිවෙලා පහුගිය කාලය තුල සිටියා. ගරු නගරාධිපතිතුමනි, හිටපු ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරිවරුන්ට අපි ලිඛිතව ඒ පිළිබඳව දැනුවත් කලා. සොයිසාපුරට අරක්ෂාවක් සපයන්න කියලා නමුත් ඒ කාරණය මේ වන තුරු ඉෂ්ට වෙලා නෑ. එකේ ආසන්නතම සිදුවීමක් උනා පසුගිය සති දෙක තුන ඇතුලතදී. මේ මම ජනවාරි මාසේත් කතා කරපු අනවසර ලොතරැයි කුඩුවක් සම්බන්ධයෙන් එතන ඇතිවෙච්ච පෞද්ගලික ආරාවුලක් පොලිසිය විමර්ශනය කරේ. ඒ විමර්ශනය කරපු ඒ කාන්තාවටත් තවත් කට්ටියක් ගිහිල්ලා පහරදීමක් කරලා ඒ දරුවට අවුරුදු පහළවක දරුවෙකුට තමයි පහර දීම කරලා තියෙන්නේ. මෙතනදී කියන්න ඕන ගරු නගරාධිපතිතුමනි මේ සොයිසාපුර මීට වසර කිහිපයකට උඩදී හරි භයානක තත්වයක් තිබුණා. ඒ යම් යම් පාතාල චන්ඩි වෙනත් අයගේ බලපෑම් මත. නමුත් දැන් මේ මේ කාලසීමාව වන විට ක්‍රීඩා පිටිය අසළ විශේෂයෙන් ඔය සියඹලා ගහ යට කල්ලියක් කියලා ඔහොම ඉන්නවා එතන ඉන්නේ දරුවන් ගොඩක්. ඒ දෙමාපියන්ටවත් මෙල්ල කර ගන්න බැරි. මේ සභාවේ අපි දෙමාපියෝ. කවුරුත් අපි කැමති නෑ අපේ දරුවෝ උනත් පොලිස්කූඩු වල උසාවි වල ලගිනවා දකින්න අපි ඇත්තටම කැමති නෑ. මෙකෙ සිදුවිම තියෙන්නේ ගරු නගරාධිපතිතුමනි පොලිසියේ අවදානය මේ කොට්ඨාශයට මෙතරම් ගැටුම් තියෙද්දී ක්‍රීඩා පිටිය රාත්‍රිය කාලයට පිටස්තර හමුදාවෙන් කියනවා පිරිස් ඇවිල්ලා ක්‍රීඩා පිටියේ කිසිම අවසරයක් නැතුව ක්‍රීඩා පිටිය පරිහරනය කරනවා වාහන ඇතුල් කරනවා බිමත්ව සිටිනවා පුද්ගලයින් අවිල්ලා කොහෙන් එන පුද්ගලයන්ද කියලා කිසිකෙනෙක් දන්නේ නෑ පැමිණිලි කරත් පොලිසියෙන් ජීප් එකෙන් බැහැලවත් පරික්ෂා කරන්නේ නෑ. මේ කොහෙන් ආව කොරොනා කාලසීමාවෙදිත් එහෙමයි. මේ කවුද කින්ද මන්ද කියලාවත් බලන්නේ නෑ. ඒ අවදානය අඩු උනා ඉතින් මේ මෑතකදී සිදුවූ සිදුවීම් අපි මේ සභාවල් වල කතා කරනවා දැනටත් මේ ඔය කල්ලි තුල ක්‍රියාත්මක වෙනවා මත් දන්නේ නෑ ඊට පිටිපස කුමක් හෝ හස්ථයක් ක්‍රියාත්මක වෙනවා අඩු වයසේ දරුවන් සිටින්නේ ඔය

කල්ලිවල වාසනාවකට ගරු නගරාධිපතිතුමනි එ ළමයිගේ අතට තාම ආයුධයක් තාම ලැබිලා නෑ. එ ආයුධයක් ලැබිච්ච දවසට මේ තත්වය බැරෑරුම් වෙන්න පුළුවන්. සමහර විට ඉලක්කය මන් වෙන්න පුළුවන් නැත්තම් අපේ සුරේෂ් මන්ත්‍රීතුමා වෙන්නත් පුළුවන් එවැනි තත්වයකට මේ සොයිසාපුර හිමින් හිමින් ගමන් කරලා දැන් එ තත්වය භායානක තත්වයකට පත්වෙලා තියෙනවා. ආරක්ෂාවක් නැති තත්වයකට පත්වෙලා තියෙනවා. විශේෂයෙන් මේ සම්බන්ධයෙන් මේ කල්ලි ගැසෙන දරුවන් මේ පුද්ගලයින් රාත්‍රී කාලයේදී මේ ක්‍රීඩා පිටියේ ගැවසෙන කල්ලි හැදිලා බිමත්ව හැසිරෙන රාත්‍රී කාලයේදී පිටස්තර වාහන නවත්තගෙන යම් යම් අකටයුතුකම් කරන එ කිසිදෙයක් පිළිබඳව අපට පොලිසියෙන් සාධාරණයක් වෙලා නෑ. අපි කිප අවස්ථාවක්ම මේ ගැන පැමිණිලි කරලා තියෙනවා. එක රාළහාමි කෙනෙක් හෝ මේ නිවාස සංකීර්ණයට යොදවන්න කියලා අර ආචාරයට අඹ වැටෙනවා වාගේ හිටපු ගමන් පොතක් උස්සගේන රාළහාමි කෙනෙක් යනවා ඊට පස්සේ ඉතින් සතියක් දෙකක් යනකන් පෙන්නවත් නෑ. ඉතින් මේ තත්වය ගරු නගරාධිපතිතුමනි, ඔබතුමාගේ අවධානයවත් මේ කෙරෙහි යොමු කරලා මහල් නිවාස සංකීර්ණයක් මේ තත්වයට එකම පිළිතුර විශේෂ අවදානයක් යොමු විය යුතුයි. එ අවදානය යොමු නොවිම සම්බන්ධව තමයි ඒ ජනතාවට ඇතිවෙලා තියෙන ගැටළුව ඒ දරුවන් මත්ද්‍රව්‍ය වලට අබ්බැහි වෙලා තියෙනවා පහරදීම් සිද්ධ කරනවා එතකොට කල්ලි ගැහිලා ඉන්නවා මහල් නිවාස පාසල් යන්නේ නැතිව ගෙවල් වල දෙමාපියන්ටවත් කීකරු නැති තත්වයකට පත්වෙලා ඉන්නවා මේ සියල්ල මර්දනය කරගත හැකි රාත්‍රීකාලයේදී සිටින පිරිස් කවුරුන්ද කියා සොයා බලා විශේෂ අවධානයක් පොලිසිය එ ගැන යොමු කරලා අඩු තරමේ රාත්‍රී මුර සංචාරයක්වත් දමලා එ පිළිබඳව සහනයක් සළසලා දෙන්න කියලා ඉල්ලා සිටිනවා.

**03(12)** **<u>මහ නගර සභා මන්ත්‍රී - එම්.ශිරෝමී ඉන්දිකා කුරේ මහත්මිය</u>**

ගරු නගරාධිපතිතුමනි, අපේ දිලාශිණී මන්ත්‍රීතුමිය කිව්වා වගේ මමත් එකටම කොටසක් එකතු කරන්න කැමතියි. මොකද මොරටුව ආසනයේ දැනට සිදුවන අක්‍රමිකතා අතර මම හිතන්නේ රන් ආභරණ මංකොල්ලකෑම් ඒවගේම මුදල් පසුම්බි ඇදගෙන යෑම් වගේ ගොඩක් ක්‍රියාවන් මම හිතන්නේ හිංසන ක්‍රියාවන් වැඩිවෙලා තියෙනවා. විශේෂයෙන්ම මේ සමාජෙ තව ඉස්සරහාට මේක වැඩිවෙන්න නොදී ඔබතුමා ඒ සම්බන්ධ අවධානය යොමුකරන්න පුලුවන්නම් ආරක්ෂක අංශ සමග සාකච්ඡාවක් කරලා කටයුතු කරනවානම් හොඳයි කියන යෝජනාව මමත් ඉදිරිපත් කරන්න කැමතියි. ඒත් එක්කම අපි ඉදිරිපත් කරන යෝජනා සම්බන්ධයෙන් අද දවසේ අපි දැක්කා ඔබතුමා ඒවා ඉදිරිපත් කරනවා අවුරුදු ගානකට පස්සේ මේවැනි ක්‍රියාවක් ඔබතුමා කිරිම ගැන සතුටට පත්වෙනවා. මොකද අපි ඉදිරිපත් කරපු යෝජනා පහුගිය කාලේ සභාගතවෙච්ච වාර්තාවලටවත් සමහර අවස්ථාවල ආවේ නැහැ. ඉතින් ආලෝක පිටිය පාර සම්බන්ධයෙන් මේ යෝජනාව මම ඉදිරිපත්කරේ ජනතාවගේ ඉල්ලිමක් විධියට ඒ ගැන මම සතුටු වෙනවා. ඇත්තටම අද දවසේ ඒ යෝජනාව සම්බන්ධව ඔබතුමාගේ ප්‍රතිචාරය සම්බන්ධව ඒත් එක්කම තවත් කාරණයක් කියන්න කැමතියි ඩෙංගු ගැන ඔබතුමා කථා කරා කොරෝනාවලට පස්සේ ඩෙංගු රෝගය උස්සන්න වන කාලය අපි දැකලා තියෙනවා විටින් විට. ඩෙංගු රෝගය අපේ මොරටුව ආසනය තුල ව්‍යාප්ත වෙනවා. විශේෂයෙන්ම කාණු පද්ධති සම්බන්ධවත් එත් එක්කම කථා කරන්න ඕන ගරු නගරාධිපතිතුමනි මොරටුමුල්ල බෝධිරුක්කාරාම පාරේ කාණු පද්ධතියක් තියෙනවා මම කියන දෙයක් නෙමෙයි ජනතාව කියනවා වසර තුනකින් වත් මේ කාණු පද්ධතිය පවිත්‍රකරලා නැහැ කියලා. ඉතින් මේවා අපි

කියන්නේ ඔබතුමාට වැරැද්දක් නෙමෙයි මේවා වෙන්ඩ ඕන නිසා තමයි ඉදිරිපත් කරන්නේ. ඒවගේම තවත් කිහිපයක් තියෙනවා කාණු පද්ධති ගැනත් විශේෂ අවධානය යොමු කල යුතුයි.

<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමිය, ඔබතුමිය කිව්වානේ අවුරුදු තුනකින් කරලා නැහැ කියලා ඔබතුමියට අවුරුදු තුනකින් කරේ නැ කියලා කියන කෙනා මම හිතන්නේ ඔබතුමියගේ පාක්ෂිකයෙක් වෙන්න ඇති. ගරු මන්ත්‍රීතුමා ජේ. සි. බි එකම ගෙනියනවා මාස 6 න් 6ට කාණුව සුද්ධකරන්න.

<u>මහ නගර සභා මන්ත්‍රී - එම්.ශිරෝමි ඉන්දිකා කුරේ මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමණි, මම කියන්නේ මෙහෙමයි සමහරක් තැන්වලදි මග ඇරෙන අවස්ථා ඇති සමහර දේවල් තියෙනවා ඒ මිනිස්සුනට ජිවත්වෙන්න අපහසුයි කාණු උතුරලා යනවා එතකොට ඒ මිනිස්සු පුදුම අපහසුවට පත්වෙන අවස්ථා තියෙනවා. ඉතින් අපි මේවා කියන්නේ ඔබ සහ මේ ආයතනයේ වැරදි පෙන්වනවා නෙමෙයි කියලම හිතන්න එපා. මිනිස්සු අපහසුතාවයට පත්වෙන අවස්ථා අවම කිරිම තමයි අපේ අරමුණ. මොකද අපි විපක්ෂයේ මන්ත්‍රිවරු විධියට මෙතනට ඇවිල්ලා කථාකරන්නේ ඔබ අපහසුතාවයට පත්කරන්නමයි කියලා ඔබ හිතන්න එපා. ඒ කටයුතු විය යුතු දෙවල් ඔබ යම්කිසි වැඩපිළිවෙලක් තුල අපි කරන යෝජනා අද ඔබ ඉදිරිපත් කරා. අපි එ ගැන සතුටු වෙනවා. මොකද ඔබ මෙච්චර කාලයක් නොකරපු දෙයක් අද කරා.

<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමිය, ප්‍රමාද වෙච්ච එකක් නැවත කලා මේක කරගෙන ආවා ආයි නැවතුනා දැන් කරා කියලා එතුමිය කියන්නේ කලේම නැහැ. ඉතින් ඔක හැරිලා අනෙක් පැත්තට කියන්න කෙනෙක් නැති එක තමයි ප්‍රශ්ණය.

<u>මහ නගර සභා මන්ත්‍රී - එම්.ශිරෝමි ඉන්දිකා කුරේ මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමණි, කරේ නැහැ කියන එකත් නෙමෙයි අද කරා කියන එකයි මම කිව්වේ. මම කිව්වේ අද කරපු එක ගැන සතුටුවෙනවා කියන එක සහ ඩෙංගු රෝගය සම්බන්ධව ඔබතුමාට සෞඛ්‍ය අංශ සහයෝගය ලැබෙන්නේ නැහැලු. ඉතින් එහෙම කියලා බැහැ නගරාධිපතිතුමණි ඒ සහයෝගය කොහොම හරි ලබාගෙන අවශ්‍ය කටයුතුවලට ඔබතුමා දායකත්වය දිලා අදාල කාරණා ඉටුවිය යුතුයි. මම හිතනවා එක දෙපිරිසක් අතර යම්කිසි ඔබතුමා කියන හැල හැප්පිම් අතරතුර අදාල ජාතික ප්‍රශ්ණයක් ඩෙංගු කියන්නේ මේ රටේ ව්‍යාප්ත වෙන රෝගයක්. ඉතින් ඒ නිසා එහා සම්බන්ධවත් ඔබතුමා අවධානය යොමු කරන්න කියලා මම ඉල්ලන්න කැමතියි.

**03 (13)** <u>මහ නගර සභා මන්ත්‍රී - ජී.එම්.නිරෝෂන් රුවමාල් අපෝන්සු මහතා</u>

ගරු නගරාධිපතිතුමණි, ස්තුතිවන්ත වෙනවා ඔබතුමන්ට මුලින්ම අපි කරපු යෝජනා මේ විදියට දැනටමත් යම් කිසි ක්‍රියාමාර්ගයක් ගත්ත එක ගැන. එකට අපි ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා බෙහෙවින්ම. එවගේම නගරාධිපතිතුමනි මම කියන්න කැමතියි අපේ නගර සභාවේ ලිෆ්ට් එකක් හදලා තියෙනවා එකත් පුලුවන් ඉක්මණින් විවෘත කරලා සේවකයන්ට හරි ජනතාවට හරි

සේවාවක් ලබාගන්න පුලුවන් ආකාරයට එකත් කරා නම් හොදයි කියලා මම හිතනවා. ගරු නගරාධිපතිතුමණි, අර සී එස් සී පෙරේරා මාවතේ දරුණු විධියට එකේ වල දැන් දරුණු විධියට හානියට පත්වෙලා තියෙනවා.ඒකට පුලුවන් තරම් ඉක්මණින් කරලා දෙන්න පුලුවන්නම් හොදයි. හරියට පාරේ මැද්දේම තමයි මේක ගැලවිලා ගිහිල්ලා තියෙන්නේ. වාහන දෙපැත්තෙන් තමයි අයින් කරගෙන යන්නේ. පුලුවන්නම් ප්‍රමුඛතාවය දිලා ඒක ඉක්මණින් කරලා දෙන්න කියලා ඔබතුමාගෙන් ඉල්ලනවා.

**03 (14)** **<u>මහ නගර සභා මන්ත්‍රී - බී.සජිත් දුමින්ද පීරිස් මහතා</u>**

ගරු නගරාධිපතිතුමණි, විශේෂයෙන් මම ඔබතුමාගේ අවධානය යොමුකරනවා මොරටුවේ ජනතාව අපහසුතාවයට පත්විම තවත් අකාරයකින් වලක්වන්න. මොකද පහුගිය කාලේ ගෑස් පෝලිම් කිරිපිටි පෝලිම්වලට අනාගතයේ තවත් පෝලිමක් එකතුවෙන්න පුලුවන් ඒ තමයි ජල පෝලිම. අද උදේ ජලය කප්පාදුවිමක් සිද්ධවුනා. විශේෂ හේතුව තමයි මම මීට මාස 6 කට ඉස්සෙල්ලත් කිව්වා ඒවගේම සංවර්ධන කමිටු සභාපතිතුමාටත් අවධාරණය කරා ප්‍රදීප් ශ්‍රියන්ත මන්ත්‍රිතුමාටත් අවධාරණය කරන කරුණක් තමයි මේ ජල ප්‍රශ්ණයට මුලික හේතුව බවට පත්වෙලා තියෙන්නේ අපිට විදුලිය නැතැවුනොත් එහෙම අපිට ලබුගම හා කලටුවාවත් අනෙක් පැත්තේන් මොරටුව ජනතාවට ජලය ලැබෙන්නේ කලු ගග ව්‍යාපෘතියෙන් එතකොට ඒකෙදි මේ ජලය පොම්පකරන්න විදුලිය ඉතාමතක් වැදගත් එක යම් විදියකින් අඩාල වුනොත් ජලය ලැබෙන එක ප්‍රමාදවෙන්න පුලුවන්.ඒක නිසා ගරු නගරාධිපතිතුමණි, ඔබතුමා ගමට එළිය දෙන්න යනකොට වැඩ සටහනින් විදුලියක නැහැ වගේම අනාගතයේ ගමට එළිය දෙන්න යනකොට ජලයත් නැහැ කියන්න පුලුවන්.ඒනිසා මම ප්‍රධාන වශයෙන් ඔබතුමාගේ අවධානයට යොමු කරනවා. මේ වෙනනකොට ගරු නගරාධිපතිතුමණි, මොරටුව නගර සභාව සතු ලිං විශාල ප්‍රමාණයක් තියෙනවා.ඒවගේම පුද්ගලික ජනතාව සතු ලිං ප්‍රමාණයකුත් තියෙනවා. ඒ නිසා මම මාස ගාණක ඉදන් අවධානය යොමු කරනවා ඒ ලිං ටික වැඩ සටහන් ලක්ෂයේ ව්‍යාපෘතිය යටතේ හරි නගර සභාවේ ව්‍යාපෘතිය යටතේ හරි ඉටු කරන්න කියලා. අද උදේ ජලය නැති නිසා මට අල්ලපුගෙදරින් ජලය ලබාගෙන තමයි පිහිට වුනේ. ෂර්ට් එක අයන් කරගෙන එන්න බැරි බොහෝ දෙනෙක් අද එළියට බැහැලා ඉන්නවා.මම ගියා එම් ඕ එච් ඔෆිස් එකට හෙට දවසේ පුණුරුත්තාපනය වන ළමයෙක්ට ඇන්ටිජන් ටෙස්ට් එකක් කරගන්න. ඒ ගියාම පි එච් අයි මහත්තයා තාම වැඩට ඇවිල්ලා නැහැ. වතුර ආවාට පස්සේ එන්නම් කිව්වා.ඒතුමාටත් වතුර නැහැ. ඒනිසා මම කියන්නේ ගරු නගරාධිපතිතුමණි, අපිට ලිං තියෙනවා විශාල ප්‍රමාණයක් මොරටුව මහා නගර සභාව සතු. ගිය පාරත් ලක්ෂ 90ක් විතර එකට වියදම් කරා. නමුත් කරුමෙකින් හෝ ඒක ඉටු කරගන්න බැරිවුනා ආණ්ඩුව මාරුවිම නිසා ඊට පස්සේ මම ඔබතුමාට කිව්වා එක ඉටුකරන්න කියලා ගරු නගරාධිපතිතුමණි මට ඊයේ පෙරේදා හම්බවුනා කුලරත්න මන්ත්‍රිතුමා එතුමාගේ කාලේ එතුමා මම හිතන්නේ ලිං 19ක් විතර එතුමාගේ දායකත්වයෙන් පරණ කාලේදි කරලා තියෙනවා. එවගේම ධම්මික මන්ත්‍රිතුමාත් එහෙමයි ඔබතුමාගේ කාලේත් ලිං කරා. මම හිතන්නේ පහුගිය කාලේදි ලිං හදපුවා තියෙනවා විශාල ප්‍රමාණයක් මෙහෙන් ගත්තොත් එහෙම එගොඩ උයන දකුණ ඊට පස්සේ ගත්තාම පිරිස් පාර ඉස්සරහා තියෙන ලිද එත් එක්කම අයිවන් වත්තේ මිණිස්සු ප්‍රයෝජනයට ගන්නවා. ඒවගේම රාවතාවත්තේ එත් එක්කම සමහරු මේ ලිං තමන්ගේ පුද්ගලික බුදලයක් විධියට අරගෙන තියෙනවා. මේ මොරටුව නගර සභාව සතු ඒ ලිං තිබ්ච්ච භුමි තමන්ගේ පුද්ගලික දේපල විධියට අල්ලගෙන ඉන්නවා. ඒ නිසා ගරු නගරාධිපතිතුමනි මම ඔබතුමාගේ ගමට එළියට එළිය දෙන්න යනකොට විදුලිය නැති එක වෙනම ප්‍රශ්ණයක් ජලය නැති තත්වයක් ඇතිනොකර

ගන්න මම ඔබතුමාගේ අවධානය යොමුකරනවා ලිං ටික අනිවාර්යෙන්ම මේ ගමට එළිය වැඩසටහන යටතේ ප්‍රතිසංස්කරණය කරන්න. ඒවා පුණුරුත්තාපනය කරන්න නැවත වතාවක් ජනතාවට දෙන්න. මගේ ඉල්ලීම තිබුනේ ඒ ළිදක් ලග කුඹුක් ගහක් හිටවලා ඒවගේම ඉගිනි ගහක් හිටවන්න පුලුවන්නම් අර අපේ පැරණි කුඹුකේ ළිද සම්ප්‍රදාය නැවත වතාවක් ජීවමානවනවා. ඒනිසා ගරු නගරාධිපතිතුමණි, එච්චරක් නෙමෙයි අපිට ලිං තියෙන මිනිස්සු ගොඩ දෙනෙක් ඉන්නවා.අද උදේ වතුර නැති නිසා මට පිහිට වුනේ අල්ලපු ගෙදර ළිද ඒනිසා ගරු නගරාධිපතිතුමණි ඒ ලිං ටිකත් අපිට සුද්ධකරලා දෙන්න පුලුවන්නම් ගමට එළිය වැඩසටහනින් මම හිතනවා එක අර්ථවත් වෙනවා කියලා. ඒනිසා ගෑස් පෝලිම් කිරි පිටි පෝලිම් තෙල් පෝලිම්වලට අලුතින් ජල පොලිම් එකතුකර ගන්නේ නැතිව මේක මොරටුවේ ජනතාවට අවශ්‍ය කරන සහනය ලබාදෙන්න ඔබතුමා මැදිහත්වෙන්න කියලා. මම ප්‍රථමයෙන් ඉල්ලා සිටිනවා ඉතාමත් ගෞරවයෙන් ඊලග එක තමයි ගරු නගරාධිපතිතුමනි අදවෙනකොට මුඛ ආවරණ දාගෙන ඉතාමත් සුපරික්ෂාකාරිව යනවා.ඒ මුඛ ආවරණ දාගෙන යන මිණිස්සු ටික සමහරක් විට අපිට අමතක වෙලා තියෙනවා ගරු නගරාධිපතිතුමණි අර අත්සෝදන එක ඒවගේම අර මූලික සෞඛ්‍ය ආරක්ෂක ක්‍රම බොහෝ දෙනාට අමතක වෙලා තියෙනවා මේ මොරටුව නගරය තුලත්. ඒනිසා මේ ඔමික්‍රෝන් තත්වයත් තුල අනාගතයෙදි ඇතිවෙච්ච තත්වය බාල වෙලා බාල වෙලා සාමාන්‍ය සෙම්ප්‍රතිශ්‍යාව තත්වයට යයි. යන අතරවාරයෙදි අපිට මූලික අර අවශ්‍ය කරන මූලික සෞඛ්‍ය කොන්දේසි ටික අත්සෝදන එක සැනිටයිසර් කරන එක සමහර ආයතනවල කෙරෙන්නේ නැහැ. මුඛ ආවරණ දාගෙන යනවා. ඒක හොදයි ඔබතුමාගේ අවධානය යොමුකරනවා අපේ පි එච් අයි මහත්වරු හරහා එකට අවශ්‍ය කරන නියාමනය සහ අධික්ෂණය සිදුකරන්න කටයුතු කරන්න කියලා තුන්වෙනි කාරනාව තමයි ගරු නගරාධිපතිතුමනි මම ඔබතුමාගෙන් අවස්ථා දෙකකදි ඉල්ලීමක් කරා මම ප්‍රසිද්ධියෙන් ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා මොරටුව ලුනාව ආයුර්වේදය ඉස්සරහා අපි මගි ආවරණයක් හැදුවා. හැබැයි එකෙත් යම් අඩුපාඩුවක් අපෙත් තියෙනවා. ඒ ආයතන ටික මොකද අධිකාරි බලය තියෙන්නේ නගර සභාවට ඒ ආයතනවලින් එක ගන්න ප්‍රමාදවෙලා හයිකරනවෙලාවේ තමයි ඔබතුමාගේ අනුමැතිය ඉල්ලුවේ. ඒ නිසා ගරු නගරාධිපතිතුමනි ඒ බස්ටැන්ඩ් එක හයිකරපු එකත් ගලවලා දාලා තියෙනවා. ලුනාව ආයුර්වේදයේ එකනිසා අපි ආයුර්වේදය තේමාවට ගැලපෙන විදියට තමයි සකස්කරලා තිබුනේ. ඒනිසා මම ඔබතුමාගේ අවධානය යොමුකරනවා ඒ බස්හෝල්ට් එක බල බල මිනිස්සු බස් එකේ නගින්න අව්වට වේලිලා වැස්සට තෙමිලා ඉන්නවා. ඒනිසා චම්පික රණවක ඇමතිතුමගෙන් මම ඉල්ලීමක් කරලා හදපු එක ඔබතුමාගේ අවධානය යොමුකරලා එයට අනුමැතිය දෙන්න. අපි වැස්සට තෙමෙන්නැතිව ඒවගේම අවුවට වේලෙන්නේ නැතිව මිනිස්සුනට මොරටුව බලා එන්න ලුනාවේ ආයුර්වේදයට එන ඒවගේම ලුනාව රෝහලට එන මිනිසුන්ට ඒ බස්ටැන්ඩ් එක විවෘත කරලා දෙමු කියලා කාරුණිකව ආයාචනා කරනව

**03 (15)** <u>**මහ නගර සභා මන්ත්‍රී - ඒ.එච්.සුරේෂ් ඉන්දික මහතා**</u>

ගරු නගරාධිපතිතුමණි, මම මුලින්ම මේ අවස්ථාවේ අද දින උපන්දිනය සමරන නීශා ගරු මන්ත්‍රීතුමියට සුභ උපන්දිනයක් වේවා කියලා ප්‍රාර්ථනාකරනවා. ගරු නගරාධිපතිතුමණි, මගේ පැමිණිල්ල අපි විශේෂයෙන්ම අවුරුදු දෙකකට පස්සේ නැවතවතාවක් ඔබතුමාගේ සංකල්පයෙන් ක්‍රියාත්මකවෙන ගමට එළිය වැඩසටහන ක්‍රියාත්මක වුනා. එකේ පළවෙනි ගමට එළිය වැඩසටහන බොරුපනට ලබාදුන්නා. ඒ ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා මේ අවස්ථාවේ. මගේ පැමිණිල්ල තමයි ගරු නගරාධිපතිතුමණි ගමට එළිය වැඩසටහන තුල අපේ

සභාවේ කටයුතු ජනතාව තකහනියක් මෙතනට එන්න ඕන ඒ ඇවිල්ලා රස්තියාදු වෙන්න ඕන අවස්ථාව නැතිකරලා සභාවේ කටයුතු වැඩි ප්‍රමාණයක් ගමට ගෙනිහිල්ලා ඒ ගමතුල ක්‍රියාත්මක කරනවා. ගමේ ජනතාවට ගමේම ඉඳගෙන මේ සභාවේ වැඩකටයුතු වරිපනම් ගෙවන්න හෝ බල්ලන්ට එන්නත් විදිම හෝ ඒ කටයුතුවලට සම්බන්ධවීමේ පහසුකම හදනවා ඒ එක්කම ගරු නගරාධිපතිතුමනි, මීට අවුරුදු දෙකකට කලින් නොතිබිච්ච අපි දන්නවා බරපතල කොවිඩ් වසංගතයට මුහුණ දෙන්න සිද්ධවුනා. මේ වසංගතය හමුවේ මේ කථාකරන අපිත් මේ රටේ ජනතාවගේ වැඩි හරියකුත් අද මේ විදියට සාධාරණීයකරණය වෙලා තියෙන්නේ අපේ රජය විසින් ඉතාමත් විධිමත් ලෙස ඉතාමත් කාර්යක්ෂම ලෙස එන්නත්කරණය කරපු නිසා ඒ එන්නත්කරණයේ පළවෙනි මාත්‍රාව දෙවෙනි මාත්‍රාව රටෙන් අතිශය බහුතරයකට ලබාදිලා තුන්වෙනි මාත්‍රාවත් ලබාදිම මේ  වෙනකොට ආරම්භකරලා තියෙනවා. ගරු නගරාධිපතිතුමනි ඒ තුන්වෙනි මාත්‍රාව ලබාගැනිමේදි අපිට පෙනුනා පළවෙනි හා දෙවෙනි මාත්‍රාව ගන්න වේගයෙන් තුන්වෙනි මාත්‍රාව ලබාගැනිමට පෙළඹීමක් ඇතිනොවිච්ච විවිධ මිත්‍යා මත විවිධ අරමුණු මත තුන්වෙනි මාත්‍රාව ලබාගැනිම සඳහා ජනතාව පෙළඹෙන ස්භාවය අඩුවීමක් තිබුණා. ඒ නිසාම විශේෂයෙන්ම සෞඛ්‍ය අංශ සෞඛ්‍ය අධ්‍යක්ෂක ජනරාල්තුමාගේ ඉඳලා විශේෂඥ වෛද්‍යවරු හැම නාලිකාවකම කිව්වා තුන්වෙනි මාත්‍රාව ලබාගන්න මේ විශාල වසංගතයක් ඔමික්‍රෝන් හරහා අපේ රටට ඇතුල්වෙන්න පුලුවන්. ලෝකයේ ප්‍රධාන රටවල් ඇමරිකා එක්සත් ජනපදය ඉඳලා අසල්වැසි ඉන්දියාව දක්වා ඔමික්‍රෝන් වෛරසය ක්‍රියාත්මක වෙනවා. ඒ නිසා අපේ රටට මේක එන්නේ වලක්වන්න හොඳම ක්‍රමය සහ ප්‍රධානම ක්‍රමය තුන්වෙනි මාත්‍රාව ලබාගැනිම කියලා, එහෙම තියෙද්දි, එහෙම කියද්දි, සෞඛ්‍ය අංශම කියද්දි ගමට එළිය වැඩසටහන තුල මේ එන්නත ගමේම ලබාගැනිම සඳහා වෙච්ච ඒ ක්‍රියාවලියට ඔබතුමා මේ සභාව දායකත්වය ලබාදෙන්න සූදානම් වුනා. ඒ සූදානම ඇතුලේ හරියට ගත්තොත් සභාව සංවිධානය කරන්න සභාව තමයි මිනිස්සුන්ව එතනට ගෙන්නේ අදාල ස්ථානයට. එතකොට ඒ සියලුම අවස්ථාවන් හදලා දිලා තිබෙද්දි හරිම කණගාටුයි ගරු නගරාධිපතිතුමනි මොරටුව සෞඛ්‍ය වෛද්‍ය නිළධාරි කාර්යාලයෙන් ඒ අවස්ථාව ලබාගෙන ජනතාවට එන්නත් කිරිමේ වැඩ පිළිවෙල මග ඇරිලා තියෙනවා ගරු නගරාධිපතිතුමනි මේක අතිශය කණගාටුදායක තත්වයක් සෞඛ්‍ය අංශ කියනවා මේක ගහන්න කියලා අපේ සභාව ගමට ගිහිල්ලා ඒක සංවිධානය කරලා ඒ මිනිස්සුන්ව අනික් සභාවේ සේවාවන් එක්ක එන්නත්එකරන වැඩසටහනත් ගමේම ක්‍රියාත්මක කරන්න අවශ්‍යකරන පහසුකම හදලා දෙනවා. සෞඛ්‍ය වෛද්‍ය නිළධාරි කාර්යාලය මොරටුව ඒක මග අරිනවා එගොඩඋයන සෞඛය වෛද්‍ය නිළධාරි කාර්යාලය ඒකට සහය දෙනවා ගරු නගරාධිපතිතුමනි. ඉතාම කණගාටුදායක තත්වය මේකයි. ඒ නිසා දැන් බොරුපන ගත්තොත් විශාල පිරිසක් ග්‍රාම නිළධාරි කාර්යාලයට ආවා එන්නත් ලබාගන්න නමුත් අපිට සිද්ධ වුනා හරවලා යවන්න. එතකොට මේ තත්වයට වගකියන්න ඕන කවුද කාටවත් තමන්ගේ පුද්ගලික වෛරයන් පුද්ගලික දෙවල් ඉස්මතු කරගෙන වෛද්‍ය ක්ෂේත්‍රය තුල රෝගීන්ට කටයුතු කරන්න බැහැ. ඒක සදාචාර නැහැ. හැබැයි එහෙම සදාචාර නොවන දෙවල් මෙතන වෙනවා. ඒක නිසා මගේ මේ කථාව ගරු නගරාධිපතිතුමනි සෞඛය අංශයේ ඉහළටම පැමිණිලි කරන්න කියලා මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා. මේක කාටවත් පුද්ගලික ප්‍රශ්ණයක් නෙවෙයි පුද්ගලික ප්‍රශ්ණ බේරගන්න පුලුවන්. හැබැයි වසංගතයක් පරාද කරන්න රජයක් විසින් ගන්න මේ ක්‍රියාමාර්ග වලට කවුරු හරි බාධා කරනවානම් අන්න ඒ බාධාවන් ගැන පැමිණිලි කරන්න කියලා ඉල්ලා සිටිනවා.

<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමා, මේ සම්බන්ධයෙන් අපි යුද හමුදාව සමග කටයුතු කරන්න සාකච්ඡා කරලා තියෙනවා. ඔබතුමාගේම ඉල්ලීමකට අපි ඒ අනුව කටයුතු කරනවා.

<u>මහ නගර සභා මන්ත්‍රී - ඒ.එච්.සුරේෂ් ඉන්දික මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, මම කිව්වේ ඔබතුමාගේ ඉල්ලීමට සාධාරණය කරපු එක නිවැරදියි නමුත් ගරු නගරාධිපතිතුමණි ඒ සෞඛ්‍ය වෛද්‍ය නිළධාරි කාර්යාලය පැත්තෙන් සිදුනොවන එක ගැන අපි වෙනම කථා කරන්න ඕන. මේකට විකල්පයක් විධියට දෙයියනේ කියලා යුද හමුදාව හැම එකකටම ඉන්න නිසා යුද හමුදාව අපිට මේ උදව්ව කරන එක වෙනම එකක්.මේකේ නිසි අයිතිය තියෙන තැන මගහැරිම ගැන අපේ විරෝධය තියෙනවා ගරු නගරාධිපතිතුමනි.

**03 (16)** <u>මහ නගර සභා මන්ත්‍රී - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, මෙම අයිතමය යටතේ මන්ත්‍රීවරු බොහෝ කරුණු ඉදිරිපත් කරා. ඉදිරිපත් කරන ලද කරුණු පිළිබඳව ටිකක් හිතුවට පස්සේ දැනෙනවා ප්‍රශ්ණ ගණනාවක මොරටුවේ ජනතාව ඉන්නවා කියන එක. ඒ කියන්නේ ගණිකා ප්‍රශ්ණ, පාතාල ප්‍රශ්ණ, කාණු මාර්ග සහ සෞඛ්‍ය අංශයේ ගැටලු ඒ හැම එකකින්ම කියවෙනවා විශාල ප්‍රශ්ණ ගණනාවක මොරටුවේ ජනතාව ඉන්නවා කියලා මන්ත්‍රීවරු මහජන නියෝජිතයෝ විදියට ඒ ප්‍රශ්ණ ඉදිරිපත් කරනවා. ඒ අතර ගරු නගරාධිපතිතුමනි, එකක් මම හිතුවා ඔක්කොම ප්‍රශ්ණ අතර නාපු ප්‍රශ්ණයක් එකත් ආවානම් හොඳයි කියලා ඒ තමයි කක්කා ප්‍රශ්ණය ඒ කියන්නේ දැන් අපි කවුරුත් පිළිගන්නවා ඉදිරියට මේ ස්වරේජ් අපජලය ඒ අදාල මධ්‍යස්ථාන ගොඩනැගිම ඉදිරි අත්‍යාවශ්‍ය මධ්‍යස්ථාන ලෙස තිබෙන එකක්. එතකොට එම සාකච්ඡාවන් සිදුවෙද්දි මම දන්නැහැ එක සාකච්ඡාවක් සිදුවෙලා තියෙනවා අප දැනුවත් කලා කිව්වට අපිව දැණුවත් කරේ නැහැ. 02/23 මම හිතන්නේ ගරු නගරාධිපතිතුමනි එක පැත්තක අනෙකුත් ගොඩගැහෙන ප්‍රශ්ණ වගේම ඒ කියන්නේ අපි සැලකිය යුතුයි දැන් ඉදිරියේ මතුවෙන්න නියමිතව තිබෙන සමහර ගැටලුවලට කොහොමද අපි විසඳුම් දැන් සිට සූදානම් කර ගන්නේ. එතකොට අපි කවුරුත් දන්නවා ඉදිරියෙදි අත්‍යාවශ්‍ය වෙයි අපිට මේ අපජලය මුදාහරින මධ්‍යස්ථාන. දැන් ඒ පිළිබඳව සිදු වෙන අදාල ආයතනවල මැදිහත්විම නගර සභාව විසින් ඒ ආයතනත් එක්ක කරන සාකච්ඡාවලදි ගන්න තින්දු තිරණ අපිට වැදගත්වෙයි. ඒ නිසා අර සාකච්ඡාවක් කැඳවද්දි වාචිකව නිකම් අපි දැනුවත් කරා කියනවාට වඩා මට හිතෙනවා අඩුම තරමේ මේ සාකච්ඡාව මම හිතන්නේ සුදේශ් මන්ත්‍රීතුමා සැහෙන වුවමනාවකින් ඉන්නවා ඔහුටත් මේ මැදිහත්විම කරගන්න. ඒ නිසා එවැනි සාකච්ඡා හැදෙන කොට ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා අපිවත් ඒ සාකච්ඡාවලට අදාල දැනුවත්විම් කරලා මැදිහත් කරගන්න. මොකද, ඒකට පක්ෂ විපක්ෂ භේදයක් නැහැ. අපි කවුරුත් ඒ අදාල විසඳුම් වලට ඒ සාකච්ඡාවලට මැදිහත්වෙන්න කැමතියි.

ගරු නගරාධිපතිතුමනි, විශේෂයෙන් දහසක් ප්‍රශ්ණ අතරේ මාර්ග පිළිබඳ ඉතාම නරක අත්දැකීමකට දැන් මොරටුවේ ජනයා මුහුණ දෙනවා. මන්ත්‍රීවරු ගොඩක් කරුණු ඉදිරිපත් කරයි නමුත් මම මේ එක කාරණාවක් මගේ පැත්තේ එක කාරණාවක් ඉදිරිපත් කිරිමක් කොයිතරම් දුරට ගැලපෙනවාද කියලා ගැටලුවක් ඒ කියන්නේ මම දන්න මගේ මන්ත්‍රී ර මුලු කාලයම එගොඩඋයන ජයන්ති ලේන් එක ප්‍රේමචන්ද්‍ර ශෙඩ් එකත් එක්කම ඒ පිවිසුමෙන් ඇතුල්වන

ස්ථානය විශාල වලක් දීර්ඝ කාලයක් තිස්සේ මේ පාර සකස්වෙන්නේ නැහැ. මීටර් 60-70වක ප්‍රමාණයක් ඒ නිසා වහාම සැලකිල්ලට ලක්කරන්න මොන විදියටවත් යන්න බැරි මට්ටමට දැන් වල තියෙනවා. මම දන්නේ නැහැ ඒක පවත්වාගෙන යනවාද කියලා කාපට් කරනවාද මට පුලුවන්ද දිනේ කියන්න. එතුමිය කියන එක ගරු නගරාධිපතිතුමනි භාරගන්න ඕන මම කැමතියි එතුමියගෙන් ඒ පිළිබඳව දැනට අරගෙන තියෙන ක්‍රියාමාර්ග කාපට් කරනකොට ක්‍රියාමාර්ග ගන්න ඕනනේ දැන් මොනවද අරගෙන තියෙන ක්‍රියාමාර්ග කවදා වෙනකොට ආරම්භ කරනවාද? කවදා අවසන් කරනවාද? එහෙම කියාගන්න පුළුවන්ද?

<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමා, ආරම්භකරන එකයි, අවසන්කරන එකයි, දිනයයි කියන්න බැහැ. ඇස්තමේන්තු කරලා ඉවරයි. නගර සභාවෙන් කරන්නැහැ ආර්.ඩී.එස්. එකෙන් සියලුම මාර්ග ඇස්තමේන්තු කරලා ඉවරයි.

<u>මහ නගර සභා මන්ත්‍රී - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, සිදුවෙමින් පවතියි. ඊළඟට ඔය මන්ත්‍රීවරු කථාකරපු මේ වෙනකොට දකුණේ අර මාර්ගවල තිබෙන යකඩ කැලි ඉස්සීම නිසා සැලකිය යුතු පිරිසක් ඉන්නවා දැන් මේ වෙනකොට වැටිලා තුවාල වෙච්ච. අඩුම තරමේ මේ සභාවෙවත් ගරු නගරාධිපතිතුමනි අපිට කියන්නකො ප්‍රදී ශ්‍රියන්ත මන්ත්‍රීතුමත් කිව්වා දැන් මාස කිහිපයක් අඩුමතරමේ බැරිද අපේ ඉංජිනේරු අංශයට නැත්නම් කර්මාන්ත අංශයට බැරිද අද මේ සභාවට කියන්න අහවල් දිනය වෙනකොට අපි මේක ඉවර කරනවා නැත්නම් අපි ලබන මාසේත් මේක අහනවා. ඒ වෙනකොටත් තව හත්අටදෙනෙක් වැටෙනවා අපිට කියන්නකෝ දැන් මේ වෙනකොට ඔබ සැලසුම්. ඒ ගිහිල්ලා බලා කියාගෙන දැන් ඔබ හොඳටම දන්නවා සිදුවෙන දේ මේ දේ අහවල් දිනේ පටන් ගන්නව අහවල් දිනේ ඉවරකරනවා. ආසයි ඔබ කියන්නකෝ අහවල් දිනේ වෙනකොට දැන් හරි බඩු හම්බවුනා සිමේන්ති හම්බවුනා යකඩ හම්බවුනා අපේ සේවකයෝ ඉන්නවා අපි අහවල් දිනේ පටන් ගන්නවා අහවල් දිනේ ඉවර කරනවා කියන්නකෝ. දැන් මේ සභාවේ අපිට ඕන ගරු නගරාධිපතිතුමනි මේ උත්තරයනේ නැත්නම් ආයි අපි සුපුරුදු විදියට කියන එක විතරයි. මම කැමතියි අහගන්න කවදා වෙනකොට මේක ඉවර කරනවාද? නිහඬතාවයෙන් පෙනි යන්නේ ඉවර නොකරන බවයි.

<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමා, කට ඇර ඇර හිටපු නැති නිසානේ මෙච්චර කල් ඔබතුමන්ලාව පරාජය කරලා පාලනය ගත්තේ. එනිසා අපිටත් ප්‍රශ්ණ ගොඩක් තිබුණ නිසා නැත්නම් මේ ප්‍රශ්ණ වලට ඔබතුමන්ලාගේ හෝ ඔක්කොම වෙලා එකතු කරලා වෙන්න එන දෙයක් අපිට කරන්න බැරි දෙයක් වුනත් අපි මාර්ගයට බට දාලා කලේ. ඒක හොරු හොරකම් කරේ. ඒක වෙන දෙයක් නමුත් ඒවා අපි කරානේ. ඒ වගේම මේකත් අපිම තමයි කරන්නේ මේක කරන්න භාර අරගෙන තියෙන්නේ පාරවල් හතක අටක මේ ප්‍රශ්ණය නව ගාලුපාරත් එක්ක හැදිච්ච ප්‍රශ්ණයක් ඒ ප්‍රශ්නෙට බට දාලා ගලි දාලා කටයුතු කිරීම අපි කරා. ඉතින් ඔබතුමා මගෙන් දින වකවානු ඉල්ලන්න එපා. මේ කටයුත්තේදී මගේ ගරු මන්ත්‍රීවරු ඔබතුමාට තියෙන වුවමනාවත් වගේම ඔබතුමාට තියෙන චෝදනා වගේම චෝදනාවල් මගේ ගරු මන්ත්‍රීවරු කරනවා. දින වකවානුවක් මට දෙන්න බැහැ. කරලා තියෙන දෙවල්නේ මේ කරන්නේ නොකරපුවා

නෙමෙයිනේ. මෙවා අපි කරලා තියෙන දෙවල් අඩුපාඩු හැදෙනවා ඇරෙන්න නැතිදෙයක් හදන්න කියන එකක් නෙමෙයි මේ.

__මහ නගර සභා මන්ත්‍රී - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා__

ගරු නගරාධිපතිතුමනි, ඔබේ ප්‍රකාශය එහෙම පිළිගන්නේ නැහැ. අපි එකඟ නැහැ. අපි එකට අපි ආවේ එකටම නෙමෙයි ඔබ විවිධ වර්ණ හැඩතල ගන්වමින් ගමට එළිය කිව්වට මම කියන්නේ ඒක අයින් කරන්න ඕන කියන්න අයින් කරන්න ඒන මට එළිය අඩුම තරමේ මේ මහා ලොකු සංවාදයක් වාද විවාදයක් නෙමෙයි මේ මේක කියාගන්න බැරිනම් මොකක්ද නගරාධිපතිතුමා එය නගරාධිපතිධූරයේ ඇති වැඩේ ඒ නිසා හැම එකක්ම ඔබ යට කරමින් මග හරිමින් ඔබ හරි කියන තැන ඉදලා මෙහෙම යන්න එපා අපි ඉතාම ලෙන්ගතු විදියට අපි යමක් කරගැනිම සඳහා ඔබ පිළිබඳවත් මම පිළිබඳවත් අපි දෙන්නා හොඳට දන්නවා. අපි අඩුම තරමේ එක වැඩක් අපිත් කැමතියි මන්ත්‍රීධූරය දරණ අපි ආසයි දැන් මේ මාස ගානක් තිස්සේ වැටෙන මිනිස්සු ඒ වැටෙන එක නවත්වන්න. මෙන්න මේ අහවල් දවසේ වැඩේ පටන් ගන්නවා. අද සභාව මන්ත්‍රීවරු ඔක්කොම කථාකරා මෙන්න එකඟවුනා අහවල් දවසේ වැඩේ ඉවර කරනවා. අදත් අපි මේක මෙහෙම යනවා නැවත අපිට විශ්වාසයක් නැහැ ලබන මාසේත්, ලබන මාසේ මේක කථාකරන්න දෙන්නේ නැද්ද ඔබ තියන්නැද්ද ගරු නගරාධිපතිතුමනි. ඔබ අසමත් කියන එක තමයි කියන්න තියෙන්නේ උත්තරය දීගන්න ඒ නිසා ලබන මාසේත් මිට වැඩිය මෙයට විසඳුමක් නොලැබුනොත් මෙයට ලබන මාසේ මිට වැඩිය මේ පිළිබඳව අපි අපේ පැත්තෙන් ටිකක් බරපතල විදියට මේ අරගලය කරන්න වෙයි.

ගරු නගරාධිපතිතුමනි, මේ වෙනකොට සමහර මන්ත්‍රීවරු කථාකලා මත්ද්‍රව්‍ය පිළිබඳව තත්වය අතිශය බරපතල තැනක තිබෙන්නේ. අද වෙනකොට ජංගම කඩ වගේ මොරටුවේ මත්ද්‍රව්‍ය අලෙවිය සහ මත්ද්‍රව්‍ය වලින් තාරුණ්‍යය ගිලගන්න වේගය ඉතාම වේගවත්. සමහර ක්‍රියාමාර්ග තියෙනවා මත්ද්‍රව්‍ය වලට සම්බන්ධ මත්ද්‍රව්‍ය ජාවාරම්කාරයෝ විදියට නම් කරන මම පහුගිය දිනෙක දැක්කා මෝදරට ඇවිල්ලා එස්. ටි. එෆ්. එකෙන් වෙඩි තියලා කෙනෙක් මැරුවා එ අයට පහරදෙන්න උත්සාහ කරා කියලා. ප්‍රකාශයකුත් හැදුවා දැන් ඒ පුද්ගලයා පිළිබඳව අපි දන්නවා ප්‍රදේශවාසිනුත් දන්නවා. ඒ අයගේ අඩුපාඩු ඇති වැරදි ඇති හැබැයි ඒ වැරදි අඩුපාඩු වලට දඩුවම් දිය යුතු නීත්‍යානුකූල ක්‍රමවේදයක් තියෙනවා. දැන් ඒ ක්‍රමවේදය කියන්නේ පහර දෙන්න ආවා කියලා වෙඩි තියලා මරණ එකනම් එකටත් අපි එකඟ නැහැ. එ නිසා දැන් මොරටුවේ මත්ද්‍රව්‍ය විකුණන අති බහුතරයක් දෙනා කවුද කියන එක මේ ආරක්ෂක අංශ දන්නවා. ආරක්ෂක අංශ නොදන්න මත්ද්‍රව්‍ය විකුණන කිසිවෙක් නැහැ මොරටුවේ. ඒ නිසා අපි නගරාධිපතිවරයා ලෙස ඔබෙනුත් ඒවගේම මේ රටේ ආරක්ෂාව භාර ඉන්න ආරක්ෂක ප්‍රධානින්ගෙනුත් ඉතාමත් ඕනැකමින් ඉල්ලනවා වහාම මේ තත්වය මැඩපවත්වන්න මැදිහත්වෙන්න. අරවැනි ක්‍රියාමාර්ග නොගෙන මත්ද්‍රව්‍ය විකුණන අද අපේ අහිංසක ධිවරයෝ සැහෙන ප්‍රමාණයක් මේකට ගොදුරු වෙලා තිබෙන්නේ අද දැලක් ඇදගන්න අද බෝට්ටුවක යන්න යොදාගන්න වෙලා තිබෙන්නේ මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහි වෙච්ච මිනිසුන් ඒ නිසා ඉතාමත් නරක විදියට මොරටුව මත්ද්‍රව්‍ය වලින් ගිලගනිමින් තිබෙන වෙලාවක එය වලක්වා ගැනීම සඳහා සභාවක් ලෙස අපේ පැත්තෙන් ගරු නගරාධිපතිතුමනි කල හැක්කේ මොකක්ද අපි මෙහෙයුමක් දියත් කරන්න ඕන අද රට වැටිලා තියෙන අතිශය භායානක ඉරණමට අපට ජේන තෙක් මානයේ සාගතයක් අපි කරා එමින් තිබෙන වේලාවක කිව්වා චේන් කඩනවා, මාල කඩනවා, පර්ස් උස්සන් දුවනවා ඊයේ පෙරේදා ඇහුවා උයලා තියපු බත් එකයි ව්‍යංජනයයි

උස්සන් ගිහිල්ලා. මිනිස්සු ඒ තරමට පිඩාකාරි තැනකට වැටිලා තිබ්ද්දි තව දුරටත් මත්ද්‍රව්‍ය වලට ගොදුරු වුනොතින් එය වේගවත් වුනොත් ඉතාම නරක අභාග්‍ය සම්පන්න ඉරණමකට මොරටු ජනයා මුහුණ දෙනවා. දවස ගානේ අහනවා අරහෙ කඩනවා මෙහෙ කඩනවා පර්ස් උදුරන් දුවනවා ඒනිසා අද මොනතරම් අමාරුකම් තිබුනත් තමන්ගේ දරුවන්ට මොනවාහරි කන්න දෙන්න මත්ද්‍රව්‍ය වලට ගොදුරු නොවිච්ච මිනිහා මේවා කරන්නේ නැහැ. තාම ඒවා කරන්නේ නැහැ. අපි දන්න විදියට මේවාට පෙලඹුම හැදෙන්නේ මත්ද්‍රව්‍ය නිසා. අපි කවුරුත් එකතුවෙලා අංක එක මේ මතින්, මේ ව්‍යසනයෙන් මේ සමාජය ගලවා ගනිමින් තමයි ඊලග විසදුම් වලට අපිට යන්න වෙන්නේ. ඒ නිසා මොරටුව විදියට ඔබ පළවෙනි පුරවැසියා ඒ නිසා ඔබට බොහෝ ප්‍රශ්ණ තිබේ. හැබැයි ඒ ඔක්කොම ප්‍රශ්ණවලට වඩා උඩින් මම ඔබට කියනවා ඔබ නායතක්වය දෙන නගරය මතින් ගිලෙනවානම් ගරු නගරාධිපතිතුමනි එයට විශේෂ මැදිහත්වීමක් වඩාත් හොඳින් හදුනගන්න පුලුවන් ඔබේ තියෙන මානව සම්පත මේ ආයතනයේ මේගොල්ලෝ දන්නවා මේ මුලු ඒරියා එකේම මත්ද්‍රව්‍ය විකුණන තැන්. ඒනිසා අපි මේ සභාවට මේ පෙත්සම් පැමිණිලි අයිතමය යටතේ ඉල්ලා සිටිනවා විශේෂ වැඩපිළිවෙලක් හදන්න මත්ද්‍රව්‍ය තුරන්කිරිම සඳහා බොහෝ දෙවල් තිබෙයි කරන්න. හැබැයි අපි කවුරුත් බලමු කොහොමද අපේ තරුණයින්ව මේ උගුලෙන් බේරගන්නේ. ඒ වෙනුවෙන් අපිට කල හැක්කේ මොකක්ද අපි කලයුත්තේ මොකක්ද කියන එක හිතලා මුළු සභාවක් පක්ෂ පාට භේදයකින් තොරව නිශ්චිත කාල රාමුවක් ඇතුලේ අපි කවුරුත් එකතුවෙලා අපේ භූමියෙන් මත්ද්‍රව්‍ය තුරන් කරගන්න අමාරුයි ලේසි නැතිවෙයි. අද ඔබ දන්නවා අපේ ධිවර බෝට්ටු සෑහෙන ප්‍රමාණයක් මත්ද්‍රව්‍ය අදිනවා ඒගොල්ලෝ අද මාලු අල්ලනවා නෙමෙයි ඒගොල්ලෝමයි මත්ද්‍රව්‍ය ප්‍රවාහනය කරන්නේ. හැබැයි අපේ අහිංසක ධීවරයා එයත් ජීවත්වීම කියන කාරණය ප්‍රධාන වුනාම මේතනට ගොදුරුවෙනවා.

ගරු නගරාධිපතිතුමනි විශේෂ සැලකිල්ලක් දක්වලා මොරටුව මතින් තොර කරගැනිමේ අරගලයක් සටනක් දැන් ක්‍රියාත්මක කල යුතුයි. මහජන නියෝජිතයෝ ලෙස අපි කාටත් ප්‍රශ්ණ තොගයක් තිබෙයි. ඔක්කොටම වඩා උඩින් විනාශය වේගවත්වෙනවා මේ මත්ද්‍රවය නිසා අද මොරටුවේ දිනපොළට ගියාම හොඳට පේනවා දිනපොළට භාණ්ඩ අරගෙන එනවා මේ යනවා එනවා මේ මත්ද්‍රවය නිසා එගොල්ලන්ට සික් එක අනුන්ගේ ගෙඩි කඩාගෙන එනවා මේ දෙනවා මේ යනවා ඇස් පනා පිට පේන එකක් පොඩ්ඩ එහා මෙහා වෙච්ච ගමන් ගහ මරා ගන්නවා. ඒ නිසා එගොල්ලෝ කෙන්තියෙන් ආවේගෙන් මතින් දුවන අය ඒ නිසා වහාම මේකට වැඩ පිළිවෙලක් යොදන ලෙස ඉල්ලා සිටිනවා.

<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රිතුමා, ගරු සභාවටම දැනුවත්වීම සඳහා මේ සම්බන්ධයෙන් කියන්නේ මා විසින් අතිගරු ජනාධිපතිතුමාට මේ  ව්‍යසනය විශේෂයෙන්ම මත්කුඩු, මත්පෙති, අයිස්වැනි දෙවල් සම්බන්ධයෙන් නීතිපති විසින් මුලු ලංකාවේම අපි හිතනවා මෙය මොරටුවට වැඩි කියලා මීගමුව කියනවා මොරටුවට වඩා මීගමුවේ වැඩි කියලා තව තැනක කියනවා මේක ධිවර වරායන් ආශ්‍රිතව ඊට වඩා වැඩිය කියලා. එක එක විධියට විවිධ පැතිවලින් අරයට වඩා මෙයා වැඩියි කියලා මෙයාට වැඩිය එයා වැඩියි කියලා එහෙම කියනවා නමුත් එකට පිළියමක් විදියට මම හිතන්නේ අපිට තේරුණ දෙයක් තමයි ඩංකන් ලිවේරා හිටපු නීතිපතිතුමා විසින් අධිකරණවලට එවලා තිබුණු නියොගයක් ඇප ලබාදිමේ නියෝගය මත මත්ද්‍රව්‍ය ග්‍රෑම් 2 තිබුණ එක ග්‍රෑම් 5 දක්වා වැඩිකිරිම මත සිදුවෙච්චා වූ හානිය බරපතල විදියට වැඩි නිසා මම අතිගරු

ජනාධිපතිතුමාට ලිපියක් ලිව්වා මෙය 2 නෙමෙයි පුලුවන්නම් ග්‍රෑම් 01 කරන්න කියලා එහෙම කලොත් මේක සමස්ථයක් විදියට යම් ප්‍රමාණයක නතර කිරිමක් කරගන්න පුලුවන් කියලා.

ඒ අනුව ජනාධිපති ලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂක ජනරාල් (නීති) විසින් ලේකම්, අධිකරණ සේවා කමිෂන් සභාව, කොළඹ 12, හා 2022/02/19 දිනැතිව ලියපු ලියුමේ පිටපතක් මා වෙත එවා තියෙනවා. මත්ද්‍රව්‍ය වැරදි සඳහා දඩුවම් ලබාදිම සම්බන්ධවයි ඉහත කරුණු සම්බන්ධයෙන් නගරාධිපති සමන්ලාල් ප්‍රනාන්දු මයා විසින් අතිගරු ජනාධිපතිතුමා වෙත යොමු කරන ලද ඊ-මේල් ලිපිය ඔබ වෙත යොමු කරමි කියලා. මම ඊ-මේල් එකක් යැවුවේ. ඒ අනුව මේ සම්බන්ධයෙන් පරික්ෂාකර බලා සුදුසු කටයුතු කරන්න කියලා මේ වෙනකොට අපි ගතයුතු මැඩ පැවැත්විමට අපි විසින් ගතයුතු තීරණයට යම් කිසි විදියට හොඳ සාක්ෂියක් එක්කම ඒ කටයුතුවලට මැදිහත්විම සඳහා නැවත 5 කියන එක දක්වා අඩුකරලා මේ කටයුත්ත කරන්න කියන ලිපිය මා වෙත යොමු කරලා තියෙනවා. මා මෙය යොමු කරේ දෙසැම්බර් මාසේ පමණ ජනවාරි මාසේ යොමු කරපු ලිපියක් මා වෙත එනවා. මා සභාගත කරනවා නිශාන්ත ප්‍රදිනාන්දු මන්ත්‍රිතුමා අපි සියලුදෙනා එකතුවෙලා මේ කටයුත්තට දායක වෙමු. ඊලග දවසකදි කමිටුවක් හදලා ඒ කමිටුව මගින් කටයුතු කරමු විශේෂයෙන් මම හිතනවා චන්ද්‍ර ගාමිණී වගේ ගරු මන්ත්‍රිවරුන්වත් රවිනාත් මහත්තයාගේ කාලේ ලැබිච්ච සම්මානයකුත් තියෙනවා. මත් කුඩුවලින් මුදවාගැනිම සඳහා කදවුරු කිරිමේදි මම හිතන්නේ රවිනාත් ජේ ගුණසේකර මැතිතුමාට මහත් සේ පිටුවහලක් වෙලා වැඩ කරා. චන්ද්‍ර ගාමිණී පිරිස් මැතිතුමා ඒ වගේම මම හිතන්නේ අපේ බල මණ්ඩලයේ ලේකම්තුමා විධියට ප්‍රදිප් ශ්‍රියන්ත මන්ත්‍රිතුමාගාවත් ලොකු වැඩසටහන් තියෙනවා. මේ සම්බන්ධයෙන් සියලුම ගරු මන්ත්‍රිවරු හැමතිස්සේම කියන්නේ මේ තරුණයන්ව බේරාගන්න ඕන කියලා සුජිත් පුෂ්පකුමාර ගරු මන්ත්‍රිතුමා නියෝජ්‍ය නගරාධිපතිතුමා මේ සම්බන්ධයෙන් විශේෂ අවබෝධයකින් කටයුතු කරන්න පුලුවන් ඒ වගේ අපි සියලුදෙනාගේ තියෙන හැමතැනින්ම තියෙන්නාවු පුංචි හෝ දෙය හරියට අරගෙන ලොකු කරලා මේක ඉවර කරගන්න මම හිතන්නේ ලොකු දෙයක් වෙනවා. එක තව පැතිකඩක් විදියට මම දකින්නේ මත් කුඩුවලට මිලක් තියෙයි මිලෙන් පස්සේ නවතියි නමුත් මගේ එක තාම ඉවරවෙලා නැහැ. රේස් බයි රේස්වලට මිලක් නැහැ. දවසට පරදින ප්‍රමාණයත් නැහැ. එකත් මේ එක්කම ක්‍රියාත්මක කරන්න ඕන කියලා අපි හිතනවා. මේකෙන් සමාජයක් විනාශ වෙනවා වගේම අරහෙන් පවුල් පිටින් ආරවුල් වෙලා විනාශවෙනවා. මේ ඔක්කොම එකට ගෙනියන්න ඕන අරකට වැඩිය මේක ලොකුත් නැහැ මේකට වැඩිය ඒක පොඩිත් නැහැ හැබැයි මේ ඔක්කෝම එකට එකතු කරගෙන සමාජයක් විදියට ඉස්සරහාට යන්න ඕන කියලා මම විශ්වාස කරනවා. ඔබතුමන්ලාගේ සහයෝගය ලබාදෙන්න.

## 04. ප්‍රශ්ණ - නැත

## 05. යෝජනා

05(1) එම්. තිසර රසාංජන මෙන්ඩිස් මහතා විසින් කල් දී ඇති යෝජනාව සභාවට ඉදිරිපත් කරන ලදි.

"මොරටුමුල්ල පන්සල පාරේ වරිපනම් අංක 41 දරණ ස්ථානයෙන් පටන් ගන්නා හා වරිපනම් අංක 71/14/D ස්ථානයෙන් අවසන් වන මාර්ගය "සෞම්‍ය පෙදෙස" ලෙස නම් කරන මෙන් මෙම මහා නගර සභාව විසින් අනුමත කළ යුතු බවට යෝජනා කර සිටින්නීය".

අංක 05(1) යොජනාව මහා නගර සභා මන්ත්‍රී එම්.ශිරෝමි ඉන්දිකා කුරේ මහත්මිය විසින් ස්ථිර කළාය.

<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීවරුනි, ඉහත අංක 05 (1) යෝජනාව ඉදිරි කටයුතු සඳහා කර්මාන්ත කමිටුව වෙත යොමු කරනවා.

## 06 <u>2022 පෙබරවාරි මස ස්ථාවර කමිටු වාර්තාවේ තීරණයන් සලකා බැලිම.</u>

06(01) 2022.02.09 දින පැවති පරිසර, සෞඛ්‍ය සනිපාරක්ෂාව පිළිබද ස්ථාවර කමිටු වාර්තාවේ තිරණයන් සලකා බැලිම.

<u>මහ නගර සභා මන්ත්‍රී - ඒ.එච්.සුදේෂ් ඉන්ද්‍රජිත් කුමාර මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, 2(7) කරුණ යටතේ මම මේ පොඩි කාරණයක් දැනගන්න ඔබතුමාගෙන් අපේ සුරංග අපොන්සු මන්ත්‍රීතුමා සඳහන් කරපු විහාර පාරේ ලක්ෂපතිය මහජන ක්‍රිඩාංගනයේ යෝජිත අපද්‍රව්‍ය බැහැරකිරිමේ ව්‍යාපෘතිය ඒ පිළිබදව යම් අවබෝධයක් ලබාගන්න කැමතියි. ඔක කාලයක් තිස්සේ යම් ක්‍රියාවලියක් තිබුණා. පවුල් කිහිපයක් පදිංචිවෙලා හිටපු ඉඩම වෙනුවට දැන් මහජන ක්‍රිඩාංගනය ඇතුලේ යම් භූමියක් නිශ්චිතව වෙන්කරලා එතන මේ ව්‍යාපෘතිය ආරම්භ කරන්න අපි දැනගන්න කැමතියි මේ පිළිබදව යම් ශක්‍යතාවාර්තාවක් හෝ කිසියම් වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක වෙනවාද මොකක්ද එතන සිද්ධවුනේ කියන කාරණාව පිළිබද යම් අවබෝධයක් අපි දැනගන්න කැමතියි ඔබතුමාට ඒක පැහැදිලි කරන්න පුලුවන්නම්.

<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමා ශක්‍යතා වාර්තාවල් ගන්න වෙන්නේ වෝටර්බෝඩ් එකෙන් තමයි. ඉඩම ලබාදිමේ කටයුතු සඳහා අදාල වෙන්නාවූ සභා සම්මුති තියෙනවා ඒ සඳහා මේ වෙනකොට පළවෙනි පන්තියේ ඔප්පු ලැබිලා ඒ අනුව විධිමත් පරිදි තක්සේරුවක් ලබාගෙන තක්සේරු වටිනාකම සභාවට අය කරගෙන ලබාදිමේ කටයුත්ත සිදු කිරිම අප විසින් සිදු කිරිමට පෙලඹුණේ ඒ මතුපිට තිබෙන්නාවූ වතුර මට්ටමත් එක්ක ලක්ෂපතිය ප්‍රදේශවාසින්ට විශාල හානියක් වෙලා තියෙනවා මිට පෙර පුද්ගලික ඉඩම්වල කොතෙක් කරන්න ගියත් ඒ ඉඩම්වල කිරිමට නොහැකියාව ලැබුණා විතරක් නෙමෙයි ඔවුන් එයට විරුද්ධව කටයුතු කිරිම නිසා අපි කල්පනා කරා අනිවාර්යෙන්ම හෙට දිනයේදි බලෙන් හෝ කරන්නට ඕන දෙයක් ඉඩම ලබාදිමේ කටයුත්ත විතරයි අපි කරන්නේ ශක්‍යතා වාර්තාව අරවා මේවා සම්පුර්ණයෙන්ම

ව්‍යාපෘති බලධාරින් ඉදිරියට ජාතික ජල සම්පාදන හා ජලපවාහන මණ්ඩලය ඒ සම්බන්ධ කටයුතු කරමින් පවතිනවා.

**<u>මහ නගර සභා මන්ත්‍රී - ඒ.එච්.සුදේෂ් ඉන්ද්‍රජිත් කුමාර මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, ඒ ඉඩම අපි බදු විදියටද දෙන්නේ

**<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රීතුමා නැහැ නැහැ ඉඩම දෙනවා සම්පූර්ණයෙන්ම බදු කුලියකට දෙන්න බැහැ.ඒ මැෂින් එක හයි කරාට පස්සේ සදාකාලිකව ඒ ව්‍යාපෘතිය තියෙන එකක්.

**<u>මහ නගර සභා මන්ත්‍රී - කේ.ඩී.නිශාන්ත ප්‍රදිනාන්දු මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, මම ප්‍රශ්ණ කරනවා 2(11) ප්‍රශ්ණ කරන්න හේතුවෙන්නේ බොරුපන ඔබ පෙන්නුවා ගමට එළිය වැඩසටහන එකේ 2(11) තියෙනවා බොරුපන මාතෘ සායනය ගර්භනි මව්වරු සඳහා භාවිතා කිරිමට වැසිකිළියක් නොමැති විම ඊළගට කියනවා එකේ ටයිල් කැඩිලා අබලන් තත්වයෙ එකේ සායනයේ දොරවල් නැහැ පිළිසකර කරන්න ඕන. සායනයේ විදුලි පංකා කැඩිලා සායනයේ පිටුපස පිටස්තර පුද්ගලයින් සායනයේ පිටුපස අඩක් පමණක් ගසා ඇති දැලෙන් ඇතුලු වේ. දැන් මේ අම්මලාගේ මාතෘ සායනයේ තියෙන අඩුපාඩුටික බොරුපනට එලිය දිපු ඒවා යටතේ මොනාද කලේ

**<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රීතුමා, මම හිතනවා ඔබතුමා මම පෙර අහපු ප්‍රශ්ණවලට උත්තර දිමේදි ඔබතුමා හිටියේ නැද්ද කියලා මට මතකයක් නැහැ. දැන දැන අහනවානම් ඔබතුමාගේ වරදක් හේතුව ඉතිහාසයේ එතෙක් මෙතෙක් සල්ලි හරවලා යැව්මේදි නැවත ඔහුගෙන් මුදල් කපලා වැඩක් කරන්න ගත්තනම් ඒ ගත්තේ මේ පළවෙනි වතාවට. මොරටුව මහා නගර සභා ඉතිහාසේම මගේ අවුරුදු 16 ත් ඊට පෙර මගේ මතකයට ගියානම් තෝමසම් ජේ. මැතිතුමගේ කාලයටත් ඒ මතකය මගේ නම් රජයෙන් එවපු මුදලක් කරන්න බැරිව ගියානම් ගියාම තමයි ඒක කොන්ත්‍රාත්එකරුගෙන් ලක්ෂ 9ක් අරගෙන මේ සියලු අඩුපාඩුකම් ඒකේ ඇතුලේ තියෙනවා ඒවා අපි නිම කරනවා

**<u>මහ නගර සභා මන්ත්‍රී - බී.සජීත් දුමින්ද පීරිස් මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, ඔබතුමාගේ අවධානය යොමුකරනවා 2(11) කාරණාව සම්බන්ධයෙන් ඒ තමයි මේ මාතෘ සායනය හෝ වේවා අනෙකුත් අපේ විවිධ අංගන හෝ වේවා ප්‍රධාන ප්‍රශ්ණය වෙලා තියෙන එකක් තමයි මම හදුනගත්ත විදියට සාමාන්‍යය සුලු නඩත්තු කටයුතු මාතෘ සායනයක හරි එහෙම නැත්තනම් අපේ වෙනත් ස්ථානයක තියෙන සුලු නඩත්තු කටයුතු සඳහා අපිට සුලු මුදල් වලින් කරගන්න පුලුවන් සුලු වැඩ තියෙනවා ඒවා සමහරක් වෙලාවට අතපසු වුනොත් එහෙම අපිට මේ ප්‍රශ්ණය ලොකු වෙනවා. ඒ නිසා ගරු නගරාධිපතිතුමනි, මේ මාතෘ සායනයේ දැකපු අඩුපාඩු තමයි මේ පොඩි ප්‍රශ්ණය තමයි ලොකු වෙලා තියෙන්නේ හුඟාක් වෙලාවට දොරේ සරනේරුවක් ගැලවිලා හැබැයි ඒක අවධානය යොමු කරන්නේ නැති වුනාම

දොර ගැලවිලා යනවා. ඒ නිසා ගරු නගරාධිපතිතුමනි, ඒකේදි සුළු මුදලින් කරගන්න පුලුවන් එක මහා දැවැන්ත ඇස්තමේන්තුවක් දක්වා යනවා.

<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමා, මට දැන් ආපහු යන්න වෙන්නේ මොකටද දන්නවාද පෙර වගේම කමිටු සාකච්ඡා කරන්න ඉඩදෙන්න බැරි වෙනවා. හේතුව කමිටු සාකච්ඡා කරන්න ඉඩ දිපු වරද තමයි දැන් මේ කරන්නේ එකෙදි තියෙන්නේ ඡන්ද විමසීම විතරයි.

<u>මහ නගර සභා මන්ත්‍රී - බී.සජිත් දුමින්ද පීරිස් මහතා</u>

ගරු නගරාධිපතිතුමණි, ඒ නිසා මම ඔබතුමාගේ අවධානය යොමුකරන්නේ සුලු නඩත්තු අංශයකුත් මේකේ පවත්වගෙන මේවා කරන්න. ඒවගේම මේ මාතෘ සායන වල ඒ කටයුතු ගත්තාට පස්සේ විශේෂයෙන් මේ එගොඩ උයන මාතෘ සායනයෙත් යම් ආදර්ශයකට හදන්න උස්සාහ ගත්තා ත්‍රිපෝශ ගබඩා කරන ස්ථානය ගොඩක් වෙලාවට ත්‍රිපෝශ ගබඩා කරාම හුඟක් මාතෘ සායනවල මොරටුව වගේම තියෙන ප්‍රශ්ණය තමයි හුගක් වෙලාවට නිසියාකාරව ගබඩාකර ගැනිමේ අපහසුවක් තියෙනවා. ඒකේ පොඩි මොඩල් එකක් හැදුවා. මාතෘ සායනය එගොඩඋයනේ ඒ නිසා මම ඔබතුමාගේ මේ සම්බන්ධ මොඩල්ස් තියෙනවා. මේ සම්බන්ධයෙනුත් අවධානය යොමුකරලා මේ ඉදිකිරිම් කටයුතු කරන්න කියන එක ඉල්ලා සිටිනවා.

2022.02.09 දින පැවති පරිසර, සෞඛ්‍ය සනිපාරක්ෂාව පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු තිරණයන් ඒකමතිකව සභා සම්මත විය.

(මෙම අවස්ථාවේ දී මහා නගර සභා මන්ත්‍රී යූ. අනුරසිරි ජේ. ද සිල්වා මහතා 2022.02.09 දින පැවති පරිසර, සෞඛ්‍ය සනිපාරක්ෂාව පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවට විරුද්ධ බව ප්‍රකාශ කලේය.)

06(2) 2022.02.10 දින පැවති කර්මාන්ත හා ඉදිකිරිම් පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ තිරණයන් සලකා බැලිම.

<u>මහ නගර සභා මන්ත්‍රී - එම්.තිලකසිරි ප්‍රනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, කර්මාන්ත කමිටුවේ අංක 03 කරුණ සංශෝධනය වෙන්න ඕන.

2022.02.10 දින පැවති කර්මාන්ත හා ඉදිකිරිම් පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ අංක 03 කරුණ හැර සියලුම කමිටු තීරණයන් ඒකමතිකව සභා සම්මත විය.

06(3) 2022.02.11 දින පැවති මුදල් පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ තීරණයන් සලකා බැලීම.

<u>මහ නගර සභා මන්ත්‍රී - එම්.තිසර රසාංජන මෙන්ඩිස් මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, මුදල් කමිටුවේ අංක 18(1-7) දක්වා තියෙන කාරණාවලට අපි නිහඬයි. වරිපනම් ඉවත්කර ගැනිම සම්බන්ධව ඒ වගේම 24 (1-9) දක්වා කාරණාවලටත් අපි නිහඬයි. 28 කාරණාවට නිහඬයි. ඒ සම්බන්ධව අපි ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා යම් පැහැදිලි කිරිමක් කරන්න කියලා. රු. හත්ලක්ෂ ගානක් ගෙවලා තියෙනවා සිටිනෙට් සංවිධානයට 2019 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා වු අවුරුදු 3 ක් සඳහා සාමාජික මුදල් ගෙවලා තියෙනවා 2019 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා ඩොලර් 1300 බැගින්. මේ සම්බන්ධව අපිට එකගතාවයකට එන්න බැහැ. මොකද හේතුව මොකක්ද මේ ආයතනය සම්බන්ධව ගණුදෙනු කලේ මොකක්ද අපිට ලබාගත්ත ප්‍රයෝජනය පිළිබදව අපිට පැහැදිලි නැහැ. මේ පිළිබඳ පැහැදිලි කිරිමක් කරලා සභාව එකඟතාවයකට කථාකරලා සාකච්ඡාවකට ලක්කරන්න.

<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමා 2002 ගරු රවිනාත් ජේ. ගුණසේකර මැතිතුමාගේ කාලේ සිටිනෙට් ආයතනයත් එක්ක ඇතිකරගත්තාවූ සාමාජිකත්වයත් එක්ක මේක සිටිනෙට් ආයතනයට හැමකෙනාටම ඇතුලත්වෙන්න පුලුවන් එකක් නෙමෙයි. මහා නගර සභාවක තියෙන ජනසනත්වයත් එක්ක ඇතුලුවන්නට පුලුවන් වෙන්නේ ලංකාවේ තියෙනවා එතනට ඇතුල්වෙන්න බැරි මහා නගර සභා තියෙනවා ජනගහනය අඩුකම නිසා. එතුමා කරපු කාර්යයෙන් පස්සේ 2006 අපි බලයට එනකොට සිටිනෙට් ආයතනය තමයි ඔය තියෙන බොරුපන තිබුණු ගොඩනැගිල්ල දෙමහල් ගොඩනැගිල්ලක් කිරිම සඳහා එවකට ලක්ෂ 8ක්, එවකට ලක්ෂ 8ක් කියන්නේ දැන් මම හිතනවා ලක්ෂ 80 විතර වගේ වටිනාකමක් තියෙන එකක්. 2006 ආපුගමන් එතුමාගේ සිටිනෙට් ආයතනයේ සෙවනගල ආයතනයත් එක්ක එකතුවෙලා මෙතුමා වෙන්කරපු මුදලින් තමයි බොරුපන ඒ සිටිනෙට් ආයතනය ලබාදුන්නු ප්‍රතිපාදන වලින් තමයි ඒක හැදුවේ. ඒක විතරක් නෙමෙයි ඒ වනවිට කැඩිලා තිබුණු වාහන ටික ඔක්කොම හදන්න ඒ සල්ලි අරගෙන තමයි අපි කරේ. ඊට පස්සේ සිටිනෙට් ආයතනය නිසාම අපිට ජයරත්න මහත්තයා එකතුකරලා කැනේඩියානු රජයෙන් ලබාදුන්නු මුදලින් ලක්ෂ 70කට වැඩිය විල්ලෝරාවත්ත ප්‍රජාශාලාව හා මාතෘ සායනය හැදුවේ. මේ ආයතනයේ සාමාජිකත්වය නොමැතිකම නිසා අපිට ලක්ෂ 250ක් 300 ක් අහිමිවුනා මේ සාමාජිකත්වය නැති නිසා. එවපු සල්ලි ගන්න බැරිවුනා සාමාජිකත්වය අරගෙන නොතිබු නිසා. මේ තුල මම හිතන්නේ ලෝකයට ලොකු පණිවිඩයක් නගර සභාවක් විදියට දෙන්න පුලුවන් වගේම ලෝකෙත් එක්ක එකතුවෙලා වැඩසටහන් කරන්න පුලුවන් ආයතනයක් විදියට මේ සාමාජිකත්වයට මුදල් ගෙවන්න ඕනැ.

<u>මහ නගර සභා මන්ත්‍රී - එම්.තිසර රසාංජන මෙන්ඩිස් මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, මුදල් කමිටුවේ අංක 18(1-7) දක්වා තියෙන කාරණාවලට අපි නිහඬයි වරිපනම් ඉවත්කර ගැනිම සම්බන්ධව එවගේම 24 (1-9) දක්වා කාරණාවලටත් අපි නිහඬයි 28 කාරණාවට නිහඬයි.

<u>මහ නගර සභා මන්ත්‍රී  - සිත්ති මසීනා බක්කර් මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමනි, මුදල් කමිටුවේ පිටු අංක 5 යෝජනා අංක 9(1) එතන අපි විරුද්ධත්වයක් නැහැ. නමුත් පොඩි පැහැදිලි කිරිමක් කරන්න අවශ්‍යයි. එතනදි කියනවා මේ කසල වෙන් කිරිමේ කාර්යයේ නියතු සේවකයන්ගේ දිරි දිමනාව රු.511,000.00 ක් තියෙනවා. ෂෙඩියුල් එකෙත් ඒ ගානමයි තියෙන්නේ. එතන කිසි ගැටලුවක් නැහැ. නමුත් මෙතන කොටස් දෙකකින් වෙන් කරලා පෙන්වනවා. දෙවෙනි රු 25,000.00 මොකක්ද කියන එක එතන සදහන් කිරිමක් නැහැ.

<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රිතුමිය, නිශ්චිත වෙන්නාවු සේවකයන්ගෙන් සමහර වෙලාවට නිශ්චිත නොවන සේවකයෝ ට්‍රැක්ටර් එකේ ඉන්න සේවකයෝ ඒ බි සි කියලා ඒ බි සි නැතිවෙලාවට ඉසෙඩ් නම් ඉන්නේ කලාපයේ ඉසෙඩ්ව දැම්මාම ඒ බි සි කියන ට්‍රැක්ටරයට එයාට ගෙවිම කරන්න පුලුවන් කමක් නැහැ. අරක ඇතුලේ ඒ ගෙවිම් තමයි මේ රු.25000.00 ඇවිල්ලා තියෙන්නේ. ඒක සමහර විට එන්න පුලුවන් බොහෝම අහම්බෙන් වෙන්න පුලුවන් දෙයක් එතකොට දෛනිකව අරයට ගෙවන එක මෙයාට ගෙවන්න ඕන එක තමයි මේකේ තියෙන්නේ.

<u>මහ නගර සභා මන්ත්‍රී  - කේ.ඩී.නිශාන්ත ප්‍රදිනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, මුදල් කමිටුවේ 7වෙනි පිටුවේ 12(1-2) එකේ කියන්නේ ජාතික ජල සම්පාදනය හා ජල ප්‍රවාහන මණ්ඩලය ගෙවපු මුදල් මාසිකව පෙන්වන එකේ එකතුව එකේ 2021 12(1) කියනවා පෙබරවාරි, මාර්තු, අප්‍රේල්, මැයි, ජුනි, ජුලි ගණන් ටික තියෙනවා. හැබැයි 12(2) යන කොට ආපහු එකේ පෙන්වනවා ජුනි, ජුලි දෙක ඒ කියන්නේ. එතකොට ඒක පොඩි පැහැදිලි කිරිමක් ඕනා නැවත ජුනි, ජුලි වල නැවත මේ රු. 83,000.00 ස් ගානක් රු.86,000.00 ගානයි 12(1) කියනවා ජුනිවල රු. 5000.00 ස් ගානයි ජුලි වල රු.5000.00 ස් ගානයි දැන් මේ එකම මාසේට ගෙවිම් දෙකක් පෙන්වනවා මොකක්ද එකේ වුනේ.

<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රිතුමා, අපේ විදුලි බිල්පත් තියෙනවා මෝදරත් විදුලි බිල්පත් තියෙනවා. බොරුපනත් ජල බිල්පත් තියෙනවා. බොරුපනත් මේ දෙකෙම තියෙනවා. එක එක පැතිවල මනු කියවිම් කරන්නේ එක එක කාල හෝරාවන් වලදි. එතකොට මනු කියවිම් කරලා බිල එවන්නේ එතකොට මනු කියවිම් එක වෙලාවකදි රාජ්‍ය ආයතනයක් තුල එක ආයතනයක මනු කියවලා බිල් එවන්නේ නැහැ. මනු කියවන කාල සිමාවන් වෙනස් නිසා මනු කියන වෙලාවන් එක්ක එවන බිල් එක්ක තමයි මේ වෙලා තියෙන්නේ

<u>මහ නගර සභා මන්ත්‍රී  - කේ.ඩී.නිශාන්ත ප්‍රදිනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, ඒක උත්සාහ කරානම් හොදයි නේද ගෙවිම් කරන්නේ අපි නිසා

<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රිතුමා, අපිට කරන්න බැහැ ඒක. ආයතනය විසින් මනු කියවන්න යොදවලා තියෙන ආකාරය හැමතැනටම මනු කියවන්නන් දාලා නැහැනේ. මුලින් එන එක අපි පරක්කු කලොත් විදුලිය කපනවා.

<u>**මහ නගර සභා මන්ත්‍රී - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා**</u>

ගරු නගරාධිපතිතුමණි අංක 28,25 25 පැහැදිලි කිරිමක් කරන්නකෝ අපි පළාත් පාලන සංසදේ වාර්ෂික සාමාජික මුදල ගෙවනවා. මේකේ කියනවා රු.35000.00 ක් එය අපිට අනිවාර්යය එකක්ද පළාත් පාලන සංසදයේ සාමාජිකත්වය පවත්වාගෙන යා යුතුම එකක්ද?

<u>**නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා**</u>

ගරු මන්ත්‍රීතුමා, අනිවාර්යෙන්ම

<u>**මහ නගර සභා මන්ත්‍රී - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා**</u>

ගරු නගරාධිපතිතුමනි, මොකක්ද එකෙන් අපිට ලැබෙන ප්‍රතිලාභ

<u>**නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා**</u>

ගරු මන්ත්‍රීතුමා, ඒකේ සමහර වෙලාවට එක එක වැඩසටහන් ඒවගේ එක එක දෙවල් හදුන්වාදීම් ඒවායේදි ඒ පහසුකම පළාත් පාලන සංසදයෙන් මේ ලබාදිලා තියෙන අවස්ථාව ඕනවටත් වඩා තියෙනවා. සාමාජිකත්වයෙන් අපිට මිදෙන්න බැහැ. මිදුනු ගමන්ම ඒ සියලු පහසුකම් ලැබෙන්නේ නැහැ

<u>**මහ නගර සභා මන්ත්‍රී - බී.සජිත් දුමින්ද පීරිස් මහතා**</u>

ගරු නගරාධිපතිතුමනි, එකේ සමහර පුහුණු වැඩසටහන් කිහිපයක් ඇවිල්ලා තියෙනවා එකේ මන්ත්‍රීවරු සහ අපේ කණ්ඩායමුත් ඉල්ලිමක් කරලා තියෙනවා. ඒකට අවස්ථාවක් තියෙනවාද කොහොමද තත්වය.

<u>**නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා**</u>

ගරු මන්ත්‍රීතුමා, එක මෙහෙමයි පළාත් සභා සංසදයෙන් එවන ඒවා වෙනම තියෙනවා. එක එක ආයතන විසින් බලෙන්දෙන එවා වෙනම තියෙනවා. සංසදයෙන් එවන ඒවා සාමාන්‍යයෙන් සැලසුම් කරලා ප්‍රාදේශිය සභා නගර සභා මහ නගර සභා කියන ඔක්කෝටම එක තැන තියෙන ආයතනය එතන ඒක වෙනවා නමුත් සමහර තැන් වල තියෙනවා එක එක ආයතන හදාගන්නවා එක එක වැඩ සටහන් දෙන්න වැඩමුලු දෙන්න පුහුණුවීම් කරන්න. ඒවා කරන කොට ඒවායේ අර අරමුණ තියෙන්නේ වෙන දෙයක් දැනුමක් දෙන්න අර අරමුණ තියෙන්නේ තමන් ආදායමක් උපයාගන්න. එතනදි දෙන එක ප්‍රවේශම් වෙන්න ඕන. මේ වගේ තැනක ගියාම ප්‍රශ්ණයක් වෙන්නේ නැහැ.

<u>**මහ නගර සභා මන්ත්‍රී - බී.සජිත් දුමින්ද පීරිස් මහතා**</u>

ගරු නගරාධිපතිතුමනි, මම ඇහුවෙත් ඒක තමයි පළාත් පාලන සංසදයෙන් ඇවිල්ලා තියෙනවා ඩිප්ලෝමා කිහිපයක්. හැබැයි ඒකේ තියෙන වියදම මම කොමසාරිස්තුමාටත් මතක් කලා සමහරක් විට වැඩිවෙන්න පුලුවන්. එතකොට එක අපේ ආයතනයේ ඵලදායිතාවය වැඩිකරගන්න ඒ පාඨමාලා හරි වටිනවා. ඒ නිසා ඒ මිල වැඩිවුනා කියලා අපිට අනුමැතියක් දෙන්නේ නැද්ද නගර සභාවෙන් මම හිතන්නේ මේ වෙනකොට ඇවිල්ලා තිබුණා.

<u>මහ නගර සභා මන්ත්‍රී - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, මීළඟට මට අහගන්න ඕන අපි මාස්පතා ගෙවීම් ඒ කියන්නේ අධිහාරට ලක්වීම්වලට අදාල ගෙවීම් තිබුණා. අපි ණයට අරගත්ත එවායේ ගෙවීම් තිබුණා. මාස්පතා කරන ගෙවීම් දැන් මෙවර මුදල් කමිටුවට ගෙවීම් ඇතුලත් නොවුනේ ඇයි කියන කාරණාව අපි කොටස් වශයෙන් ගෙවන ගෙවීම් නිශ්චිත ලෙසම මාස්පතා කරගෙන ආවානේ ගෙවීම් තුන හතරක් තිබුණා හැම මාසේම ගෙවන ඊළඟට ඔය වාහන ගත්ත එක සහ මිලියන 40 ගත්ත බැංකු ණයට අදාල කරපු ඒ ගෙවීම් මොකක්වත් දැන් පෙන්වන්නේ නැහැ.

<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමා, මීට මාස හතරකට තුනකට උඩදි අධිහාරයන් සඳහා වෙන්නාවූ කාර්යයන් වලදිත් ඒ වගේම අපේ සේවක අර්ථසාධක එකේ මාසිකව ගෙවන මුදල නිත්‍ය වශයෙන්ම ගෙවන්න ඕන මාස් ප්‍රමාණය දක්වාම සභාවේ සම්මත කිරීමක් කර ගත්තා. ඒක ගෙවීම දිගින් දිගටම එවන්න ඕන නැහැ කියලා සභා සම්මුතියකින් තමයි එක එවලා නැත්තේ. අනෙක් එවා ඔක්කෝම එවනවා.

<u>මහ නගර සභා මන්ත්‍රී - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, ඒ කියන්නේ ගෙවනවා වාර්තාවට එන්නේ නැහැ. ඊළඟට අපි ගත්ත වාහන වලටයි බැංකුවේ මිලියන 40 ටයි

<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමා, ඒක වාර්තාවේ තියෙනවා.

<u>මහ නගර සභා මන්ත්‍රී - රවිනාත් ජයශ්‍රී ගුණසේකර මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, මට පොඩි දෙයක් දැනගන්නට කැමතියි. අපේ මුදල් වාර්තාවේ 19 වෙනි පිටුවේ 27 වෙනි අංකය ඒකේ අපිට කිසි ගැටලුවක් නැහැ. අපේ මහා නගර සභාවට මිලියන 10ක් ලැබෙන අවස්ථාවක් කියලා පෙන්නුම් කරනවා. කොහොමද මේක ගණනය කරන්නේ කියලා මට පොඩ්ඩක් කියන්න පුලුවන්ද වියදම් වෙන් කිරිමේදි.

<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමා, පැහැදිලිවම වැය ශිර්ෂයන්වලින් වෙන් කරන ලද මුදල් සම්බන්ධයෙන් සමහර තියෙනවා ඒ වැය විෂයේදි මුදල් ලැබෙනවා. ඒ නිසා ඒක විවිධ ණය හිමි ලේඛනයට යන්න පුලුවන් සමහර තියෙනවා වැය විෂයන්වල දි ඒ මුදල් අයකර ගැනීමක් කරගන්න පුලුවන් කමක් නැහැ. එතකොට ඒක අයින් කිරිම තමයි කරන්න තියෙන්නේ. ඒක ඇමුණුමේ තියෙනවා මොකක්ද මුදල කියලා ඇමුණුමේ තියෙනවා. එ අනුව කපාහරින්න වෙන එවා කපාහැරිමටත් විවිධ ණය හිමි ලේඛනයේ ඉදිරියට පවත්වාගෙන යන්න පුලුවන් ඒවා තමයි හඳුනගෙන දාලා තියෙන්නේ.

<u>මහ නගර සභා මන්ත්‍රී - රවිනාත් ජයශ්‍රී ගුණසේකර මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, ඔව් ඒකෙදි අපිට පාඩුවක් නෙමෙයි වාසියක් වෙන්නේ මුදල් කමිටුවේ අංක03, 18(1-17) 20, 24(1-9) අපි නිහඬයි.

<u>මහ නගර සභා මන්ත්‍රී - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, 28 විරුද්ධයි අනෙක්වාට පක්ෂයි

<u>මහ නගර සභා මන්ත්‍රී - එම්.තිසර රසාංජන මෙන්ඩිස් මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, 18(1-7) 20, 24 (1-9) හා 28 කාරණාවට නිහඩයි.

2022.02.11 දින පැවති මුදල් පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු තීරණයන්ට පක්ෂව පහත නම් සදහන් මහා නගර සභා මන්ත්‍රීවරු ඡන්දය ප්‍රකාශ කරන ලදි.

| | | | |
|---|---|---|---|
| 01 | නගරාධිපති | - | ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා |
| 02 | නියෝජ්‍ය නගරාධිපති | - | ඩී.සමන්ත සිල්වා මහතා |
| 03 | මහා නගර සභා මන්ත්‍රී | - | ජී.එම්.සුරංග නිශාන්ත අපෝන්සු මහතා |
| 04 | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා |
| 05 | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.තිලකසිරි ප්‍රනාන්දු මහතා |
| 06 | මහා නගර සභා මන්ත්‍රී | - | එච්.ප්‍රදීප් ශ්‍රියන්ත ප්‍රනාන්දු මහතා |
| 07 | මහා නගර සභා මන්ත්‍රී | - | එල්.ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා |
| 08 | මහා නගර සභා මන්ත්‍රී | - | ඒ.එච්.සුරේෂ් ඉන්දික මහතා |
| 09 | මහා නගර සභා මන්ත්‍රී | - | යූ.සුදත් ක්‍රිෂාන්ත පෙරේරා මහතා |
| 10 | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී.ඩබ්.ඩී.රන්දූ නිරෝෂණ මහතා |
| 11 | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.නාලනී ප්‍රේමවතී ප්‍රනාන්දු මහත්මිය |
| 12 | මහා නගර සභා මන්ත්‍රී | - | පී.අශෝක ඉන්ද්‍රතිලක ප්‍රනාන්දු මහත |
| 13 | මහා නගර සභා මන්ත්‍රී | - | පී.එම්.මහේෂ් රුක්මාල් ඩයස් මහතා |
| 14 | මහා නගර සභා මන්ත්‍රී | - | පී.යසන්ත රන්සිරි ප්‍රනාන්දු මහතා |
| 15 | මහා නගර සභා මන්ත්‍රී | - | එස්.ඩබ්.එම්.නිෂා ඉරානි විජේවික්‍රම මහත්මිය |
| 16 | මහා නගර සභා මන්ත්‍රී | - | කේ.ඩී.අනුර ප්‍රනාන්දු මහතා |
| 17 | මහා නගර සභා මන්ත්‍රී | - | යූ.ලලිත් ප්‍රනාන්දු මහතා |
| 18 | මහා නගර සභා මන්ත්‍රී | - | එස්.බේසර රවීන්ද්‍ර ප්‍රනාන්දු මහතා |
| 19 | මහා නගර සභා මන්ත්‍රී | - | එෆ්.බී.නිලංක සිල්වා මහතා |
| 20 | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.කේ.පී සුසන්ත පෙරේරා මහතා |
| 21 | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.ප්‍රිනිත් ක්‍රිෂාන්ත විජේරත්න මහතා |
| 22 | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.කුමාර රාජරත්න මහතා |
| 23 | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.පිලිප් ෆ්‍රැන්සිස් ප්‍රනාන්දු මහතා |
| 24 | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.ජයමාල් ශ්‍රියාරත්න මහතා |
| 25 | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.බී.මල්ලිකා ජයවතී ප්‍රනාන්දු මහත්මිය |
| 26 | මහා නගර සභා මන්ත්‍රී | - | එච්. උජිත් ක්‍රිෂාන්ත කල්දේරා මහතා |

2022.02.11 දින පැවති මුදල් පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේඅංක අංක 03, 18(01) සිට 18(07) දක්වාත්, අංක 20, අංක 24(01) සිට 24(09) යන කරුණු වලට නිහඬවත් අනෙකුත් සියලුම කමිටු තිරණයන්ට පක්ෂවත් පහත නම් සදහන් මහා නගර සභා මන්ත්‍රීවරු ඡන්දය ප්‍රකාශ කරන ලදි.

| | | | |
|---|---|---|---|
| 01 | මහා නගර සභා මන්ත්‍රී | - | රවිනාත් ජය ශ්‍රී ගුණසේකර මහතා |
| 02 | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.සුනිල් නන්දසිරි මාසකෝරාල මහතා |
| 03 | මහා නගර සභා මන්ත්‍රී | - | යූ.අනුරසිරි ජයලාල් ද සිල්වා මහතා |
| 04 | මහා නගර සභා මන්ත්‍රී | - | එම්. චන්ද්‍ර ගාමිණි පීරිස් මහතා |
| 05 | මහා නගර සභා මන්ත්‍රී | - | ආර්.එම්.ඒ.දෝන දිලාශිනී මහත්මිය |
| 06 | මහා නගර සභා මන්ත්‍රී | - | සිත්ති මසීනා බක්කර් මහත්මිය |
| 07 | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.සුදර්ශනි ප්‍රියන්තිකා කුරේ මහත්මිය |

2022.02.11 දින පැවති මුදල් පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ අංක 18 (01) සිට 18 (07), අංක 20, 24 (01) සිට 24(09) දක්වා හා අංක 28 යන කරුණු වලට නිහඬවත් අනෙකුත් සියලුම කමිටු තිරණයන්ට පක්ෂවත් පහත නම් සදහන් මහා නගර සභා මන්ත්‍රීවරු ඡන්දය ප්‍රකාශ කරන ලදි.

| | | | |
|---|---|---|---|
| 01 | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.තිසර රසාංජන මෙන්ඩිස් මහතා |
| 02 | මහා නගර සභා මන්ත්‍රී | - | බි.සජිත් දුමින්ද පිරිස් මහතා |
| 03 | මහා නගර සභා මන්ත්‍රී | - | යූ.ප්‍රසන්න මනෝජ් පනාන්දු මහතා |
| 04 | මහා නගර සභා මන්ත්‍රී | - | ජී.එම්.නිරෝෂන් රුවමාල් අපෝන්සු මහතා |
| 05 | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.ශිරෝමි ඉන්දිකා කුරේ මහත්මිය |
| 06 | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.ශ්‍රියානි හේමලතා ප්‍රනාන්දු මහත්මිය |
| 07 | මහා නගර සභා මන්ත්‍රී | - | ආර්.ක්‍රිෂනි ප්‍රනාන්දු මහත්මිය |

2022.02.11 දින පැවති මුදල් පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේඅංක 28 ට විරුද්ධවත් , අනෙකුත්සි යලුම කමිටු තිරණයන්ට පක්ෂවත් පහත නම් සදහන් මහා නගර සභා මන්ත්‍රීවරු ඡන්දය ප්‍රකාශ කරන ලදි.

| | | | |
|---|---|---|---|
| 01 | මහා නගර සභා මන්ත්‍රී | - | කේ.ඩී.නිශාන්ත ප්‍රදිනාන්දු මහතා |
| 02 | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.පී.ප්‍රභාෂනි වික්‍රමසිංහ මහත්මිය |
| 03 | මහා නගර සභා මන්ත්‍රී | - | ඒ.එච්.සුදේෂ් ඉන්ද්‍රජිත් කුමාර මහතා |
| 04 | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.රවින්ද්‍ර රංගන ප්‍රනාන්දු මහතා |

2022.02.11 දින පැවති මුදල් පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු තිරණයන් වැඩි ඡන්දෙන් සභා සම්මත විය.

(මෙම අවස්ථාවේ මහා නගර සභා මන්ත්‍රී ඩබ්. මැක්සි ජේ ප්‍රනාන්දු මහතා සභා ගැබෙහි නොසිටියහ.)

## 07 ලැබීම් ගෙවීම් පිළිබඳ මාසික ප්‍රකාශන වැඩ ප්‍රගති වාර්තා

**ගරු නගරාධිපති - ඩබ්ලිව් .සමන්ලාල් ප්‍රනාන්දු මහතා**

2022.02.11 දිනැති මුදල් කමිටු වාර්තාවේ අංක 04 යටතේ 2022 ජනවාරි මාසයට අදාල මූල්‍ය වාර්තා ඇමුණුම - 02 ලෙස ඉදිරිපත් කර ඇත.

## 08 පුද්ගලික ස්වභාවයේ කරුණු

**08(1) මහ නගර සභා මන්ත්‍රී - සුනිල් නන්දසිරි මාසකෝරාල මහතා**

ගරු නගරාධිපතිතුමණි රක්ෂණය ගැන පොඩ්ඩක් කියන්න ඕන. ගිය මාසේ මම ආවේ නැත්තේ කොවිඩ් හැදිලා අසනීප වූ නිසා.

**ගරු නගරාධිපති - ඩබ්ලිව් .සමන්ලාල් ප්‍රනාන්දු මහතා**

ගරු මන්තිතුමා, මම හිතනවා බොහෝවිට මේ මාසේ අපිට දෙයි ආණ්ඩුකාරතුමා සමග දිර්ඝ වශයෙන් කථාකරාම පළාත් සභාවත් පාර්ලිමේන්තුවත් සම්පූර්ණම එතුමාට වාර්තාවක් ලබා දීලා. එතුමාගේ ලේකම්තුමා සෝමසිරි මහත්තයා මම හිතනවා මේ මාසේ වෙනකොට එක ලැබෙයි.

**මහ නගර සභා මන්ත්‍රී - සුනිල් නන්දසිරි මාසකෝරාල මහතා**

ගරු නගරාධිපතිතුමනි, මම කියන්නේ මන්ත්‍රීවරුන්ට දෙයක් වුනාට පස්සේ මොනම දෙයක්වත් නැහැ. මම ඉල්ලීමක් කරනවා ඔබතුමා දන්නවා ඇති අපේ ගෙදරත් ලොකු ප්‍රශ්නයක් ඇතිවුනා. එ සියල්ලටම මොනම දෙයක්වත් නගර සභාවෙන් ලැබුනේ නැහැ. මම ඉල්ලීමක් කරනවා අඩුගානේ කාටත් එහෙම දෙයක් වුනොත් නගරාධිපති අරමුදලෙන් හරි මොනාහරි දෙයක් කරන්න ගොඩක් වෙලාවට අසරණ වෙනවා. හරි අමාරුවෙනවා කරගන්න. ඉතින් මම හොඳින් ඉල්ලීමක් කරනවා සියලු දෙනා වෙනුවෙන්ම මේ දෙය කරන්න කියලා.

## 09 වෙනත් කරුණු - නැත.

සභාවේ වැඩ කටයුතු මෙතනින් අවසන් විය.

අ.කලේ/ ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු
නගරාධිපති,
මොරටුව මහා නගර සභාව,
මොරටුව.

2022.03.03 දින,
මොරටුව මහා නගර සභා කාර්යාලයේදිය.